# බස්නාහිර පළාතේ පළාත් සභාව

## மேல் மாகாண மாகாண சபை

## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2015 ඔක්තෝබර් 20** වන අඟහරුවාදා
2015 ஐப்பசி 20 செவ்வாய்க் கிழமை
Tuesday 20th October 2015

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.33 ට පළාත් සභාව රැස් විය.**
மு.ப. 09.33 **க்கு சபை கூடியது**
*The Provincial Council met at 09.33 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு .தவிசாளர் [சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [Sunil Wijerathne] in the Chair*

# සභාපතිවරයාගේ නිවේදන

## ANNOUNCEMENTS OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*i*

***පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවේ මූලාසනය :***

*බස්නාහිර පළාතේ පළාත් සභාවේ කාර්ය පටිපාටි රීති 98(6) අනුව, බස්නාහිර පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවේ සභාපතිවරයා වශයෙන් මුදල් විෂය භාර අමාත්‍යවරයා වන ගරු ප්‍රධාන අමාත්‍යවරයා නිල බලයෙන් පත්ව ඇතත්, කාර්ය පටිපාටි රීති 98(8) හි විධිවිධාන අනුව, 2015.10.15 වන දින සිට, ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන් එම ගිණුම් කාරක සභාවේ වැඩ කටයුතු කර ගෙන යාමට ගරු පළාත් සභා මන්ත්‍රී කොමිටිගේ මෙරිල් පෙරේරා මැතිතුමාව නම් කරන බව ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් 2015.10.12 දිනැති සී.එම්./ඩබ්ලිව්.පී./01 දරන ලිපියෙන් මා වෙත දැනුම් දීමක් කර තිබෙනවා.*

*ඒ අනුව ගරු කොමිටිගේ මෙරිල් පෙරේරා මන්ත්‍රීතුමා එම ගිණුම් කාරක සභාවේ, එම ධුරයේ කටයුතු ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන් කර ගෙන යනු ඇති බවත් මෙම සභාවට දැනුම් දෙනවා. මා ඇතුළු සියලුම ගරු අමාත්‍යවරුන්ගේ, මන්ත්‍රීවරුන්ගේ සුභ පැතුම් එතුමාට පිරිනමනවා.*

*ii*

***කාරක සභා පුරප්පාඩු වෙනුවෙන් පත් කිරීම :***

*සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා මහජන පෙත්සම් කාරක සභාවේ සාමාජිකයකු වශයෙන් ද,*

*මංජුල ප්‍රසන්න සම්පත් ගරු මන්ත්‍රීතුමා අවදි කාරක සභාවේ සාමාජිකයකු වශයෙන්ද,*

*හරිස්චන්ද්‍ර ද කොස්තා ගරු මන්ත්‍රීතුමා සභා කටයුතු කාරක සභාවේ සාමාජිකයකු වශයෙන් ද*

*නම් කරන ලද බව දැනුම් දෙනවා.*

*iii*

*ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ සභාපති වශයෙන් ගරු අ. ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමාව නම් කරන ලද බව දැනුම් දෙනවා.*

*iv*

*උපදේශක කාරක සභා සඳහා මතු කියවෙන පරිදි ගරු මන්ත්‍රීවරුන්ව නම් කරනු ලැබ ඇති බව දැනුම් දෙනවා.*

***ගරු ප්‍රධාන අමාත්‍යාංශය හා මුදල්, ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පරිපාලන හා පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු හා ජල සම්පාදන හා ජලාපවාහන අමාත්‍යාංශය :***

*ගරු යසපාල කෝරලගේ - නියෝජ්‍ය සභාපති*
*ගරු සුමිත් ලාල් මැන්දිස් - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක*
*ගරු උපාලි කොඩිකාර මැතිතුමා*
*ගරු උපාලි ගුණරත්න මැතිතුමා*
*ගරු ආනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා මැතිතුමා*
*ගරු සරත් කුමාර සුමනසේකර මැතිතුමා*
*ගරු අමල් පුෂ්පකුමාර සිල්වා මැතිතුමා*
*ගරු ලක්ෂ්මන් ගුණවර්ධන මැතිතුමා*
*ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මැතිතුමා*
*ගරු රසික මංජුල බුද්ධදාස මැතිතුමා*
*ගරු ප්‍රසන්න සංජීව මැතිතුමා*
*ගරු කිත්සිරි කහටපිටිය මැතිතුමා*
*ගරු සේනක දමයන්ත ද සිල්වා මැතිතුමා*
*ගරු ජයන්ත ද සිල්වා මැතිතුමා*
*ගරු එස්.එම්. ෆයිරෝස් මැතිතුමා*
*ගරු ශිරන්ත අමරසේකර මැතිතුමා*
*ගරු රෝස් ප්‍රනාන්දු මෙනෙවිය*
*ගරු ජෙමිල් මරික්කාර් මැතිතුමා*
*ගරු සරත් පතිරණ මැතිතුමා*
*ගරු ඉන්දික බණ්ඩාර මැතිතුමා*

***කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ව නිෂ්පාදන සෞඛ්‍ය, ගොවිජන සංවර්ධන අමාත්‍යාංශය :***

ගරු කෝකිලා හර්ෂණී ගුණවර්ධන මැතිනිය
ගරු රවීන්ද්‍ර ප්‍රසාද් විජේසේකර මැතිතුමා
ගරු කීර්ති කාරියවසම් මැතිතුමා
ගරු ලලිත් එල්ලාවල මැතිතුමා
ගරු ජගත් කුමාර මැතිතුමා
ගරු පූජ්‍ය තෙබුවන පියනන්ද හිමි
ගරු සමන්මලී සකලසූරිය මෙනෙවිය
ගරු නිරෝෂා අතුකෝරළ මැතිනිය
ගරු සුසාර දිනාල් මැතිතුමා
ගරු ඩිල්ෂාන් ජයවර්ධන මැතිතුමා
ගරු මල්ෂා කුමාරතුංග මැතිනිය
ගරු රොයිස් විජිත ප්‍රනාන්දු මැතිතුමා
ගරු විජිත් ප්‍රියන්ත මැතිතුමා
ගරු ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා මැතිතුමා
ගරු නිහාල් ප්‍රේමශාන්ත මැතිතුමා
ගරු මංජුල ප්‍රසන්න සම්පත් මැතිතුමා
ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මැතිතුමා
ගරු අරුණ දීපාල් මැතිතුමා
ගරු නලීන් ප්‍රදීප් මැතිතුමා
ගරු රවීන්ද්‍ර යසස් මැතිතුමා

***අධ්‍යාපන, සංස්කෘතික, කලා කටයුතු, ක්‍රීඩා, යෞවන කටයුතු හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය :***

ගරු සුනිල් විජේරත්න - සභාපති
ගරු සුනිල් ජයමිණි - සභා නායක
ගරු හෙක්ටර් බෙත්මගේ මැතිතුමා
ගරු මහේෂ් අල්මේදා මැතිතුමා
ගරු නිමල් චන්ද්‍රරත්න මැතිතුමා
ගරු ගුණසිරි ජයනාත් මැතිතුමා
ගරු මෙරිල් පෙරේරා මැතිතුමා
ගරු ලයනල් ජයසිංහ මැතිතුමා
ගරු රොජර් සෙනෙවිරත්න මැතිතුමා
ගරු ඒ.ජේ.එම්. ෆායිස් මැතිතුමා
ගරු සුනේත්‍රලාල් ප්‍රනාන්දු මැතිතුමා
ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායක
ගරු සිරිකමල් පිලිපියන් ද සිල්වා මැතිතුමා
ගරු නිරෝෂන් පාදුක්ක මැතිතුමා
ගරු ශ්‍රීනාත් මහේන්ද්‍ර පෙරේරා මැතිතුමා
ගරු ලෙනාඩ් කරුණාරත්න මැතිතුමා
ගරු රොඩ්නි ෆ්‍රේසර් මැතිතුමා
ගරු මහින්ද ජයසිංහ මැතිතුමා
ගරු සුසිල් කිඳෙල්පිටිය මැතිතුමා
ගරු එස්. කුහවර්ධන් මැතිතුමා

***ධීවර, මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන, වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත, ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය :***

ගරු චන්දන ජයකොඩි මැතිතුමා
ගරු ලලිත් වර්ණකුමාර මැතිතුමා
ගරු කාමල් කුරුප්පු මැතිතුමා
ගරු ප්‍රදීප් උඳුගොඩ මැතිතුමා
ගරු ජානක සූරියබණ්ඩාර මැතිතුමා
ගරු සලෝචන ගමගේ මැතිතුමා
ගරු මොරිස් විජේරත්න මැතිතුමා
ගරු සහන් ප්‍රදීප් මැතිතුමා
ගරු උපුල් රාජිත මැතිතුමා
ගරු සෙනල් වෙල්ගම මැතිතුමා
ගරු රෝහණ අබේගුණවර්ධන මැතිතුමා
ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
ගරු පී.ඩී. අබේරත්න මැතිතුමා
ගරු නිමල් ආර්. පීරිස් මැතිතුමා
ගරු උදාර රත්නායක මැතිතුමා
ගරු ජගත් පින්නගොඩ විතාන මැතිතුමා
ගරු අසෝක රන්වල මැතිතුමා
ගරු සුනිල් වටගල මැතිතුමා
ගරු අනුරුද්ධ ලේකම්ගේ මැතිතුමා
ගරු කේ.ටී. කුරුසාමි මැතිතුමා

***සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා ආරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශය :***

ගරු ජගත් අංගගේ මැතිතුමා
ගරු ආනන්ද රංජිත් රූපසිංහ මැතිතුමා
ගරු සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය
ගරු නවුසර් ෆවුසි මැතිතුමා
ගරු ජනක දීපාල් වැලිවත්ත මැතිතුමා
ගරු ප්‍රදීප් පෙරේරා මැතිතුමා
ගරු ලලන්ත ගුණසේකර මැතිතුමා
ගරු තුෂාර පෙරේරා මැතිතුමා
ගරු මොහොමඩ් ෂාෆි රහීම් මැතිතුමා
ගරු මොහොමඩ් අර්ෂාඩ් නිසාම්ඩීන් මැතිතුමා
ගරු උදේන විජේරත්න මැතිතුමා
ගරු ශ්‍රීනාත් ම. පෙරේරා මැතිතුමා
ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා මැතිතුමා
ගරු රන්දීර් රොද්‍රිගු මැතිතුමා
ගරු අනුරාධ විමලරත්න මැතිතුමා
ගරු ටී.ඒ. මොහොමඩ් අක්රම් මැතිතුමා
ගරු අශෝක දයාරත්න මැතිතුමා
ගරු රජිත හපුආරච්චි මැතිතුමා
ගරු නන්දන පද්මකුමාර මැතිතුමා

උපදේශක කාරක සභා නියෝජනය කරන සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට මම සුභ පතනවා. ඒත් එක්කම මම විශේෂයෙන්ම ගරු මන්ත්‍රීවරුන්ව දැනුවත් කරනවා. මට මතකයි ගිය කාලය තුළ සමහර උපදේශක කාරක සභා පැවැත්වුයේ නැහැ. එය ඉතාම කනගාටුදායක තත්ත්වයක්. ඒ නිසා මම විශේෂයෙන්ම ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අනෙකුත් සියලුම ගරු අමාත්‍යතුමන්ලාගේ අවධානය මම යොමු කරනවා. අනිවාර්යයෙන්ම මාසයකට වරක් ඔබතුමන්ලාගේ අමාත්‍යාංශ උපදේශක කාරක සභා පවත්වන්න. ඒ වාගේම ඒ අදාළ මන්ත්‍රීතුමන්ලාත් ඊට සහභාගී වෙලා ඒ අවශ්‍ය සහයෝගය ඇමැතිතුමාට ලබා දෙන්න. මොකද, මේ වන විට ගරු ආණ්ඩුකාරතුමාගේ අදහසක් තිබෙනවා, මේ උපදේශක කාරක සභා විධිමත්ව පවත්වන්නට වැඩ පිළිවෙළක් සකස් කරන්න. මේ වන විට අපි ලේකම්තුමා සමඟ සාකච්ඡා කළා. ඉදිරියේදී ඒ පිළිබඳව දැනුවත් කරනවා.

ඒ නිසා මම නැවත වතාවක් ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, අනිවාර්යයෙන්ම එම කාරක සභා මාසිකව පවත්වන්න. ඒ වාගේම කාරක සභා වාර්තාවක්. අපේ සභා රීතිවල තිබෙනවා, අනිවාර්යයෙන්ම සභාපතිවරයාට ඒ සෑම වාර්තාවක්ම මාසිකව එවන්නට ඕනෑ. නමුත් අද වන තුරු කිසිම උපදේශක කාරක සභාවක වාර්තාවක් සභාපතිවරයාට එවලා නැහැ. ඒකත් කනගාටුදායක කාරණාවක්. ඒ නිසා මම ඉතාමත්ම ගෞරවයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු ගරු අමාත්‍යවරුන්ට සිහිපත් කරනවා. එම අමාත්‍යාංශවල උපදේශක කාරක සභාවල වාර්තාවක් සෑම මාසයකම මගේ කාර්යාලයට ලැබෙන්නට සලස්වන්න. හරිනම් සභා සම්මත වෙන්නත් ඕනෑ. ඒක එහෙමයි තිබෙන්නේ. නමුත් ඒක නම් වෙන්නේ නැහැ.

**ගරු ගාමිණී තිලකසිරි** (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Land, Irrigation, Animal Production and Health and Agrarian Development.)

ගරු සභාපතිතුමනි, මගේ නම ඇතුළත් වෙලා නැහැ අධ්‍යාපන උපදේශක කාරක සභාවට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඇමතිවරයෙක් වශයෙන් මම හිතන්නේ -

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

හිමි නැද්ද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

යන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

යන්න පුළුවන්.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

නම් කරන්නේ නැද්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රතිපත්තියක් හැටියට මට දැන ගන්නට ලැබුණා - ඇමතිවරු, ලලිත් වනිගරත්න ඇමතිතුමාත් අධ්‍යාපනය බලාපොරොත්තු වුණා.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

හරි. එහෙමනම් හරි.

# ලිපි ලේඛන පිළිගැන්වීම
# PAPERS PRESENTED

**ගරු ඉසුර දේවප්‍රිය** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Government and Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

ගරු සභාපතිතුමනි, *"මුදල් ප්‍රකාශය - සංශෝධනය - 2015" හා ඊට අදාළ විසර්ජන (සංශෝධිත) ප්‍රඥප්තිය* මම මෙම සභාවට පිළිගන්වනවා.

එම ලේඛනවල පිටපත් අද දිනට නියමිත සභා න්‍යාය පත්‍රය සමඟම ගරු මන්ත්‍රීවරුන් වෙත තැපැල් මගින් ලැබෙන්නට සලස්වා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එම ලේඛන සම්බන්ධයෙන් ඉදිරි වැඩ කටයුතු අද දින න්‍යාය පත්‍රයේ පොදු කටයුතු විෂයයට එළඹුනු විටදී කළ හැකිව තිබෙන බව කාරුණිකව දැනුම් දෙනවා.

# කාරක සභා වාර්තා
COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පහත සඳහන් කාරක සභා රැස්වීම් වාර්තා මම ගරු ඔබතුමන්ලා වෙත පිළිගන්වනවා.

i. 2015.06.26 හා 2015.07.02 යන දිනවල පැවති කාර්ය පටිපාටි රීති කාරක සභා රැස්වීම් වාර්තාව.

ii. 2015.10.07 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව.

***අදාළ වාර්තාවල පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*The Hon. Chairman declared that the copies of the relevant reports are placed on the tables of the Hon. Members.*

# පෙත්සම්
PETITIONS

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි. කැලණිය, සිංහාර මුල්ල, අංක 290 හි පදිංචි කේ.කේ.ඩී.ටී. කොඩිකාර යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, වග, මාවල්ගම, "ගිම්හාන" හි පදිංචි රූපසිංහ ආරච්චිගේ මුවින්දනාත් යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

ගරු සභාපතිතුමනි, කඩවත, කිරිමැටියාගාර, අංක 15 හි පදිංචි කේ.ඩී. අනුර ප්‍රේමලාල් නානායක්කාර යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු සුමිත් ලාල් මැන්දිස් - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Sumith Lal Mendis - Chief Government Whip

ගරු සභාපතිතුමනි, කළුතර, වස්කඩුව, රවීන්ද්‍ර ප්‍රසාද් යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු ජගත් පින්නගොඩ විතාන**
Hon. Jagath Pinnagoda Withana

ගරු සභාපතිතුමනි, නවුත්තුඩුව, යටදොළ, එම්. ලාල් ජයසිංහ සහ නවුත්තුඩුව, කොටගෙදර, පන්සල පාර පදිංචි ජී.ජී. ජයසූරිය යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු සභාපතිතුමනි, පන්නිපිටිය, හයිලෙවල් පාර, අංක 333, එස්.සී. සිල්වා යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු සරත් සුමනසේකර**
Hon. Sarath Sumanasekara

ගරු සභාපතිතුමනි, කෝට්ටේ, මිරිහාන, රජමහා විහාර පාර, අංක 116/6/A, හි පදිංචි රෙජිනෝල්ඩ් ද සිල්වා යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, මොරටුව, ලක්සිරි පුර, මාලිගාව පාර, අංක 158/2 හි පදිංචි අළුත්ගම හේවගේ සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

*[**සභා මේසය මත තබන ලද පෙත්සම්**]
*[Tabled petitions]*

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

පාදුක්ක, හොරගල බටහිර, අංක 304/38 හි පදිංචි ඩබ්ලිව්.ජී. මංජුල ප්‍රියංග යන අයගේ පෙත්සම සහ කොළොන්නාව, 7 A, පිරිවෙන පාර, කීර්තිසිරි ලියනගේ යන අයගේ පෙත්සම.

**ගරු සුමිත් ලාල් මැන්දිස් - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Sumith Lal Mendis - Chief Government Whip

එන්.ඩී.ජී. වීරසිංහ, "චන්දිමල්" කුරුඳුවත්ත, දර්ගා නගරය යන අයගේ පෙත්සම

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

බණ්ඩාරගම, කොතලාවල, කොස්වත්ත, 188/A 5 හි පදිංචි එච්.ඩී. ගාමිණී ශාන්ත කුමාර යන අයගේ පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***
*Petitions Presented, ordered to refer to the Petitions committee*

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරන්න තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඔබතුමාත් දන්නවා. මේ සභාවත් දන්නවා. පසුගිය සභා වාර දෙකේදීම මම යම් කාරණයක් මතු කළා. නුසුදුසු පුද්ගලයින් යම් යම් තනතුරුවලට පත් කිරීම පිළිබඳව. මම දැන් කථා කරන්න යන්නේ ඒක ගැන නොවෙයි. පසුගිය හත් වැනිදා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ වරප්‍රසාද කඩ වීමක් මම හිතන්නේ සිදු වෙලා නැහැ. ඒ නිසා මට ඒ ගැන 36(1) යටතේ ඔබතුමාට කාලය දෙන්න අමාරුයි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

නැහැ. පසුගිය හත් වැනිදා පෙ.ව. 11.46 ට 0777827239 කියන දුරකථන අංකයෙන් මට ඇමතුමක් එනවා. ඔහු, ඔහුව හඳුන්වා ගන්නේ, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ඒකාබද්ධ සුරැකීමේ සංවිධානයේ ලේකම් රසික ලෙස. පසුව මම සොයා ගන්නවා ගරු සභාපතිතුමනි, ඔහු ඒකාබද්ධ සුරැකීමේ සංවිධානයේ - මගී ප්‍රවාහන අධිකාරියේ කොළඹ 02 ප්‍රාදේශීය කාර්යාලයේ පරිපාලන නිලධාරී (ධාවන) රසික කල්හාර තිලකරත්න කියලා කෙනෙක්. එතුමා මට කථා කරලා තර්ජනාත්මකව කියනවා ගරු සභාපතිතුමනි, අපි මේ ආයතනය ගොඩ ගන්න හදන වෙලාවේ ඔබතුමන්ලා ඒවා කඩාකප්පල් කරන්න හදනවා කියලා, මට කියනවා. ඔබතුමා එක්ක මට කථා කරන්න ඕනෑය කියලා. එතකොට මම ඇහුවා ගරු සභාපතිතුමනි, මට මොකක්ද ඔබතුමාට කියන්න තිබෙන්නේ කියලා. එතුමා බොහොම තර්ජනාත්මකව මට කථා කළා. ගරු සභාපතිතුමනි, ඒ නිසා මම කියනවා, මම ඔබතුමාට මේ ලිපියක් යොමු කරනවා. ඒ වාගේම දැන් පත්වෙලා ඉන්න සභාපතිවරයා මම ඉතාම වගකීමෙන් කියනවා ඔහු මාව විවේචනය කරමින් බොරැල්ල කාර්යාලයේදී කථා කරලා තිබෙනවා. ඒ සියලු තොරතුරු තිබෙනවා. මේක මගේ වරප්‍රසාද කඩ වීමක්. ඒ නිසා මම ඔබතුමාට ලිඛිතව මේ බව සභාගත කරනවා. මොවුන් කැඳවා මේ සම්බන්ධයෙන් සොයා බලා පරීක්ෂණයක් පවත්වන්න කියලා ඉල්ලීමක් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, එම දුරකථන ඇමතුම සම්බන්ධව ඔබතුමා පොලීසියේ පැමිණිල්ලක් දැම්මාද?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

දුරකථන ඇමතුම සම්බන්ධව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තර්ජනය කිරීම සම්බන්ධයෙන්. ඔබතුමාට දුරකථනයෙන් තර්ජනය කිරීම සම්බන්ධව පොලීසියේ පැමිණිල්ලක් දැම්මාද?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

නැහැ. ගරු සභාපතිතුමනි, පොලීසියට ගියේ නැති හේතුවක් තිබෙනවා. ඉතාම කාර්ය බහුලතාවය නිසා මට පොලීසියට ගිහිල්ලා රස්තියාදු වෙන්න බැහැ. ඒ නිසා මම ඔබතුමාට මන්ත්‍රීවරයෙක් ලෙස මගේ වරප්‍රසාද කඩ වීම සම්බන්ධයෙන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මගේ පැත්තෙන් අවශ්‍ය ටික මම කරන්නම්. නමුත් අපට පහසු වෙනවා. දිනයත් එක්ක ඔබතුමා පොලීසියේ පැමිණිල්ලක් දැම්මොත් අපට පරීක්ෂණයක් කරන්න පහසු වෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

හොඳයි. ඔබතුමා කියනවා නම් මම පොලීසියේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනිවාර්යයෙන්ම. මොකද, බරපතළ ප්‍රශ්නයක් මන්ත්‍රීවරයෙකුට දුරකථනයෙන් නිර්නාමිකව හෝ නාමිකව හෝ තර්ජනය කිරීම. බැණ වැදීම.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මෙකේ ප්‍රශ්නය තිබෙන්නේ, ඔහු ඔහුගේ අනන්‍යතාවය හය නැතිව කියනවා. කියලා, ඔහු සභාපතිවරයාගේ උපදෙස් මත, සභාපතිවරයා ඉන්න තැන තමයි මේ දුරකථන ඇමතුම දෙන්නේ. බොහොම තර්ජනාත්මක විලාසයෙන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, දුරකථන ඇමතුම දුන්න කෙනා මම හිතන්නේ, ප්‍රවාහන අධිකාරියට සම්බන්ධ කෙනෙක් නොවෙයි. වෙනම කෙනෙක් එයා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔහුගේ තනතුර තමයි මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ කොළඹ 02 ප්‍රාදේශීය කාර්යාලය. ඒ කියන්නේ බොරැල්ල බස් නැවතුම් පොල. පරිපාලන නිලධාරී (ධාවන) රසික කල්හාර තිලකරත්න.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

තනතුරක් දරන කෙනෙක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ පිළිබඳව මම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරනවා. ඔය කියන පුද්ගලයා ප්‍රවාහන අධිකාරියේ නිලධාරියෙක් නම් ඔබතුමා ඒ ගැන තීන්දුවක් ගන්න. ගරු ඇමතිතුමා, ගරු මන්ත්‍රීතුමාගේ 36(1) යටතේ කරන ලද වරප්‍රසාද ප්‍රශ්නය පිළිබඳව යොමු කරන්නේ. ඔබතුමාගේ අමාත්‍යාංශයේ නිලධාරියෙක්.

**ගරු ලලිත් වනිගරත්න** (ධීවර, මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Lalith Wanigarathne (Minister of Fisheries, Roads, Transport, Cooperative Development and Trade, Housing and Construction, Estate Sector Infrastructure Facilities, Industries and Rural Development)

අවශ්‍ය කටයුතු කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, ඒ පිළිබඳව පරීක්ෂණයක් පවත්වන්න පොරොන්දු වුණා.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, විෂය භාර අමාත්‍යතුමනි, කරුණාකරලා ඒ මන්ත්‍රීතුමා එවැනි චෝදනාවක් මේ සභාවේ කරනවා නම්, ඒක අපි එවෙලේම විසඳන්න ඕනෑ. ගරු සභාපතිතුමා මගින් මම ගරු ඔබතුමාට මතක් කරනවා, කරුණාකරලා එම නිලධාරියාව එයාගේ ආයතන ප්‍රධානියාත් එක්ක කැඳවන්න කියලා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

බොහොම ස්තුතියි. මහ ඇමතිතුමනි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා වශයෙන් ඒ අවස්ථාව ඔබතුමාට තිබෙනවා. නමුත් සභාපතිවරයා වශයෙන් මට එහෙම කරන්න බැහැ. සභා රීතිවල මට තිබෙන්නේ එතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය සභා කටයුතු කාරක සභාවේදී -

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

නැහැ. ඒක අපට පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. මම ඒක කරනවා. දැන් හෙට තිබෙන සභා කටයුතු කාරක සභාවට යොමු කරලා අපි ඒ පිළිබඳව තීන්දුවක් ගන්නවා. ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා වශයෙන් ක්ෂණික උත්තර ලබා දීම සම්බන්ධව. ඒ බලය ඔබතුමාට තිබෙනවා. ඒ නිසා කරුණාකරලා එහෙම නම් ඒ නිලධාරීන්ව තේ විවේකයට ගෙන්වලා ඒ අවශ්‍ය කථා කරන්න.

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
ORAL ANSWERS TO QUESTIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට ප්‍රශ්න ඉදිරිපත් කිරීමේ අවස්ථාව. පළමු වැනි ප්‍රශ්නය ගරු මංජු ශ්‍රී අරංගල විපක්ෂ නායකතුමා විසින් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබ සාධන අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුරු ලබා දීමේ අවස්ථාව.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**01.**

**මංජු ශ්‍රී අරංගල - ගරු විපක්ෂ නායකතුමා විසින් ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/vi(1)15/27)**

**අ.** බස්නාහිර පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය සතු වාහන අධ්‍යක්ෂතුමාගේ පාලනයෙන් බැහැරව බාහිර පුද්ගලයින්ට ලබා දී තිබූ බව පිළිගන්නේද?

ආ. එසේ බාහිරව ලබා දී තිබූ වාහන සංඛ්‍යාව කොපමණද?

ඇ. එම වාහන වර්ගය හා ලියාපදිංචි අංක සඳහන් කරන්නේද?

ඈ. එම වාහන නිදහස් කර තිබුණේ රියදුරන් සමඟද?

ඉ. රියදුරු වැටුප්, ඉන්ධන, අළුත්වැඩියා හා සේවා කටයුතු ඇතුළු අනෙකුත් වියදම් දරන ලද්දේ,

i. සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින්ද?
ii. නොඑසේ නම් කවුරුන් විසින්ද?

ඊ. මෙම වාහන අතුරින් කොපමණ සංඛ්‍යාවක් ආපසු භාර දී තිබේද? එම ආපසු භාර දී ඇති වාහනවල ලියාපදිංචි අංක හා ආපසු භාර දුන් දිනයන් සඳහන් කරන්නේද?

උ. භාර නොදුන් වාහන කොපමණද? ඒවායේ වර්ගය හා ලියාපදිංචි අංකය සඳහන් කරන්නේද?

ඌ. එම භාර නොදුන් වාහන භාවිතා කරන්නේ කවුරුන් විසින්ද?

i. එම භාර නොදුන් වාහන පිළිබඳව ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ග කවරේද?

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Nishantha Sri Warnasinghe (Minister of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs.)

ගරු සභාපතිතුමනි, පසුගිය සභා වාරයේදී ඉදිරිපත් කරපු ප්‍රශ්නය සම්බන්ධයෙන් මම කාලය ලබා ගත්තා මේ සභාවේදී ඒ සඳහා පිළිතුරු සපයන බවට.

අ. බස්නාහිර පළාත් ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙත හා බස්නාහිර පළාතේ ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා වෙත පමණක් වාහන ලබා දී තිබූ අතර, වෙනත් බාහිර පුද්ගලයින් වෙත වාහන ලබා දී නැත.

ආ. 06 යි.

ඇ. ප්‍රධාන අමාත්‍යතුමා වෙත ලබා දී තිබූ වාහන

| | | |
|---|---|---|
| PB – 5472 - කැබ් | - | 2011 නොවැම්බර් සිට 2015 ජූලි දක්වා |
| GN–6831 ලෑන්ඩ් ක්‍රෲෂර් ජීප් | - | 2010 වර්ෂයේ සිට 2014 ජූනි දක්වා |
| GE – 1115 ලෑන්ඩ් ක්‍රෲෂර් ජීප් | - | 2014 ජූනි මස සිට 2015 මාර්තු දක්වා |
| 57 – 4150 - කැබ් රථය | - | 2011 සිට 2015 අගෝස්තු දක්වා |

බස්නාහිර පළාත් සෞඛ්‍ය අමාත්‍යතුමා වෙත ලබා දී තිබූ වාහන

| | | |
|---|---|---|
| GJ – 8897 ලෑන්ඩ් ක්‍රෲෂර් ජීප් | - | 2009 සැප්තැම්බර් සිට 2015 අගෝස්තු |
| GN – 6836 ලෑන්ඩ් ක්‍රෲෂර් ජීප් | - | 2014 ජූනි හම මිට 2015 අප්‍රේල් දක්වා |

ඈ. GE – 1115 - වැටුප් හා අතිකාල සමඟ රියදුරකු නොවන සෞඛ්‍ය කාර්ය සහායකයෙකු යොදවා තිබුණි.

PB – 5472 - වැටුප් හා අතිකාල සමඟ රියදුරෙකු යොදවා තිබුණි.

ඉ. සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගිනි.

ඊ. සියලුම වාහන ආපසු භාර දී ඇත.

උ. ඉහත පිළිතුර පරිදි අදාළ නොවේ.

ඌ. ඉහත පිළිතුර පරිදි අදාළ නොවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා - එතුමා අවසර දීපු කෙනෙකුට මට දෙන්න පුළුවන් අවස්ථාව.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, එතුමාගේ ප්‍රශ්නය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. මට ඔබතුමාට ඒ අවස්ථාව දෙන්න බැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, අදාළ අතුරු ප්‍රශ්න අහන්නේ නැත්නම් මට එතුමන්ලාගේ අවසරයක් ඇතිව ප්‍රශ්න අහන්න බැරිද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා සභාවේ නැහැ. ඉතින් මම කොහොමද -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඉතින් එහෙම නම් මේක සභාගත කරන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. මට අවස්ථාව දෙන්න පුළුවන්. අඩුම වශයෙන් විපක්ෂ නායකතුමා හිටියා නම් එතුමා කිව්වාම දෙන්නම්. ප්‍රශ්නයක් නැහැ මට.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සංවිධායකතුමා ඉන්නවා නේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

සංවිධායකතුමාට දීලා තිබෙනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සංවිධායකතුමාට දෙන්න බැහැ. ප්‍රශ්නය සංවිධායකතුමාගේ නොවෙයි.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමා, ගරු විපක්ෂ නායකුතමා නිවේදනය කරන්න කියලා ඉල්ලීම කළා. මොකද, දැන් භාර දුන්නා. ප්‍රශ්න එකකට දෙන්න. අනික් ප්‍රශ්න දෙක එතුමා ආපු දවසක අහන්න දෙන්න. අපට අවස්ථාව ලබා දෙන්න.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

නැහැ. එහෙම බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක නරක පූර්වාදර්ශයක්. එතුමා මට මොකුත් දුන්නේ නැහැ නේ. එතුමා මට අඩුම වශයෙන් ලිඛිතවවත් දුන්නා නම් මට දෙන්න තිබුණා අවසරය. ලිඛිතවත් මට දීලා නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

හරි. කමක් නැහැ. එතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නයෙන් එතුමා කථා කරයි ඒ ප්‍රශ්නය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු අමාත්‍යතුමා, ඔබතුමා උත්තර ටික සභාගත කරන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි,මේකේ ඊ ප්‍රශ්නයේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා සමාවෙන්න. මට තවදුරටත් ඒ ගැන ප්‍රශ්න අහන්න දෙන්න බැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඔබතුමා දුන්නාද අවස්ථාව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. මට ලිඛිතව මුකුත් දීලා නැහැ. සභාගත කරන්න ඔබතුමා. නැහැ. ඒක ලොකු ප්‍රශ්නයක් තිබෙනවා එතැන. මටත් තේරෙනවා ඒක. නමුත් සභාව යන විධියට මට ඉතින් ඒක -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. U. George Perera - Chief Opposition Whip

එතකොට ගරු සභාපතිතුමනි, විපක්ෂ නායකතුමාට ඒ වරප්‍රසාද ප්‍රශ්නයක් විධියට ගන්න පුළුවන් නේ? එතුමාගේ ප්‍රශ්නය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පුළුවන්. ප්‍රශ්නයක් නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, මේකේ වැඩේ තිබෙන්නේ වැරැද්ද වුණේ මුලින්. මමත් ප්‍රශ්න කරපු එක නොවෙයි වැරැද්ද තිබෙන්නේ. එහෙම නම් අදාළ මන්ත්‍රීවරයා නැත්නම් සභාගත කරන්න පුළුවන්. ඒකට උත්තර දෙන්න බැහැ. ඒ වැරැද්ද තමයි ඊට පස්සේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා ඒ ප්‍රශ්නය යොමු කළා.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, මට ඔබතුමාගෙන් දැන ගන්න ඕනෑ. අපි ප්‍රශ්නයක් අහලා මන්ත්‍රීතුමා නැත්නම් ඊට පහුවදා ඒ මන්ත්‍රීතුමාට ඒ ගැන ප්‍රශ්න කරන්න පුළුවන්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පහුවදා නොවෙයි. ඊළඟ සභාවේදී.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

සම්ප්‍රදායක් හැටියට ගන්නේ නැහැ පළාත් සභාවේ. එදාම ඒක අවසන් වෙනවා. එතුමා කියන විධියට ලබන සභාවේත් ඒ ප්‍රශ්නය ගැන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම නම් එතැන ප්‍රශ්නයක් තිබෙනවා. එහෙම පොඩි ප්‍රශ්නයක් තිබෙනවා ගරු සභානායකතුමා ඒක. කමක් නැහැ කොහොම හරි ඔබතුමා සභාගත කරන්න කෝ. එතකොට අපට ඒ ගැන මොකක් හරි දැනුවත් වෙනවා නේ?

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ - අමාත්‍යතුමා**
Hon. Nishantha Sriwaranasinghe - Minister

මම එය සභාගත කරනවා.[1]

**02.**

**මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය: (ප්‍ර/vi(1)15/29)**

අ. බස්නාහිර පළාත තුළ ගුරුවරුන් සඳහා ගුරු කාර්ය සාධන පත්‍රිකාවක් පළාත් අධ්‍යාපන කාර්යාලය මගින් ඉදිරිපත් කර තිබේද?

ආ. එම ගුරු කාර්ය සාධන පත්‍රිකාව ගුරුවරයාගේ වැටුප් වර්ධකය දීමට උපයෝගී කර ගන්නා ලෙස උපදෙස් දී තිබේද?

ඇ. ගුරු කාර්ය සාධන පත්‍රිකාව ලබා දී නොමැති ගුරුවරුන්ට වැටුප් වර්ධක ලබා නොදෙන ලෙස උපදෙස් දී තිබේද?

ඈ. එම කාර්ය සාධන පත්‍රිකාව ගුරු සංගම් නියෝජිතයන්ගේද අනුමැතිය ඇතිව කරනු ලැබුවක්ද?

[1] පිළිතුර පළ කර ඇත.

ඉ. එසේ නම් ඒ කවර ගුරු වෘත්තීය සංගම් ද යන වග සභාවට ඉදිරිපත් කළ හැකිද?

ඊ. එකී කාර්ය සාධන පත්‍රිකාව සියලු කලාපවලට ලබා දුන් එකක්ද? එසේ නොමැති නම් තෝරා ගත් කලාප කිහිපයකට පමණක් දෙනු ලැබුවක්ද?

**ගරු රංජිත් සෝමවංශ** (අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansa (Minister of Education, Cultural and Arts Affairs, Sports and Youth Affairs and Information Technology.)

අ. දැනට පළාත් අධ්‍යාපන කාර්යාලය මගින් හඳුන්වා දුන් ගුරු කාර්ය සාධන පත්‍රිකාවක් ක්‍රියාත්මක නොවේ.

ආ. අදාළ නැත.

ඇ. අදාළ නැත.

ඈ. අදාළ නැත.

ඉ. අදාළ නැත.

ඊ. අදාළ නැත.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු අමාත්‍යතුමනි, මගේ පළමු වැනි ප්‍රශ්නය. දැන් මේ මා සතුව තිබෙන්නේ, බස්නාහිර පළාත් කාර්ය සාධන පත්‍රිකාව. දැන් ඔබතුමා කිව්වා, මේක වැටුප් වර්ධකයට අදාළ නැහැයි කියලා. හැබැයි, ඉතාම පැහැදිලිව මෙහි අවසානයේ තිබෙනවා, ගුරු කාර්ය සාධන පත්‍රිකාවේ 1 – 12 දක්වා කරුණු නිවැරදි බැවින් හා උපයාගත් ලකුණු නිවැරදි බැවින් වර්ෂය දාලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ප්‍රශ්න තුනක් අහන්න පුළුවන්. ඒ ප්‍රශ්න තුන අහන්න. දීර්ඝ විස්තරයකට යන්න අමාරුයි. මොකද, කාලය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

නැහැ. ගරු අමාත්‍යතුමා අදළ නැත කියපු එකට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා අතුරු ප්‍රශ්න තුනක් එතුමාට යොමු කරන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ප්‍රශ්නය තමයි යොමු කරන්නේ. ප්‍රශ්නයට වචන සංඛ්‍යාවක් නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා අතුරු ප්‍රශ්න කෙටියෙන් යොමු කරන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ලිඛිත ඒවාට තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඔක්කොම විස්තර කියන්න ගියාම ප්‍රශ්නයක් වෙනවා නේ?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මම ප්‍රශ්නය ඉදිරිපත් කරන්න යන්නේ. වැඩි වෙලා ගන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ප්‍රශ්න තුන කෙටියෙන් කියන්න. ලොකුවට නොකියා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

වර්ෂයට අදාළ වැටුප් වර්ධකය නිර්දේශ කරමි/නිර්දේශ නොකරමි. එතකොට දැන් මෙතුමා කියනවා වැටුප් වර්ධකය -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමා දෙන නියෝගය අපි පිළිපදින්නට ඕනෑ. ඔබතුමා ප්‍රශ්න තුනක් අහන්න. මම ඒකට උත්තර දෙන්න බැඳී ඉන්නවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේ ප්‍රශ්නය අහන්නේ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

අහන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

දැන් මේ මා සතුව තිබෙන්නේ කාර්ය සාධන පත්‍රිකාව. ගරු ඇමතිතුමනි, මෙහි සඳහන් වෙනවා, වැටුප් වර්ධක නිර්දේශ කරමි/නොකරමි. කියලා. ඔබතුමා කියනවා වැටුප් වර්ධකයට මේක අදාළ කර ගන්නේ නැහැයි කියලා. මම ගියවර සභා වාරයේ ඔබතුමා කල් ගත්ත වෙලාවේත් අවධානය යොමු කළා. දැනටමත් කලාප කාර්යාලවල මේ ගුරු කාර්ය සාධන පත්‍රිකාව ඉල්ලා සිටිනවා, වැටුප් වර්ධක නිර්දේශ කිරීම සඳහා. ඒ නිසා ඔබතුමා සඳහන් කරපු එක වැරදියි. වැටුප් වර්ධක සඳහා මේක අදාළ කර ගනිමින් තිබෙනවා. ඒක වැරදියි. ඒ සම්බන්ධයෙන් ඔබතුමා දෙන උත්තරය මොකක්ද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඊළඟ දෙකත් අහන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔව්. ඊළඟ ප්‍රශ්නය. ඔබතුමා දන්නවාද -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

නැහැ. ප්‍රශ්නයක් නොවෙයි නේ අහන්නේ. විස්තරයක් නේ කරන්නේ ගරු මන්ත්‍රීතුමා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2003 දෙසැම්බර් 30 2003/39 සහ 2004 දෙසැම්බර් 24 2004/38 නමින් චක්‍රලේඛ දෙකක් නිකුත් කළා, මෙන්න මේ ගුරු කාර්ය සාධන ඇගයීම් ක්‍රියාවලියක් සමඟ. මේක තමයි ජාතික වශයෙන් බලපාන ගුරු කාර්ය සාධන ක්‍රියාවලිය. ඒ කියන්නේ ජාතික වශයෙන් මුළු රටටම, පළාත් නවයටම අදාළ ගුරු කාර්ය සාධන පත්‍රිකාවක් සහ චක්‍රලේඛ දෙකක් තිබියදී බස්නාහිර පළාතට වෙනම ගුරු සාධන ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම හා ඒ මගින් ගුරුවරු පීඩාවට පත් කිරීම පිළිබඳව ඔබතුමා මේ සභාවට කුමක් පැහැදිලි කරනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තව ප්‍රශ්නයක් තිබෙනවා එතුමාට අහන්න. ඊළඟ ප්‍රශ්නයත් ඔබතුමා අහන්නකෝ. ඔබතුමාගේ තුන් වන ප්‍රශ්නයත් අහන්න. එතකොට ලේසියි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ප්‍රශ්නයට දෙන උත්තරය අනුව නේ මට ඊළඟ ප්‍රශ්නය අහන්න වෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඉතින් ප්‍රශ්නය යොමු කරන්න. එතකොට ලේසියි නේ?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, මේකේ දෙන උත්තරය අනුව නේ ඊළඟ ප්‍රශ්නය මට අහන්න වෙන්නේ. මෙතුමා අදාළ නැත, අදාළ නැත කියලා ඊළඟ සැරේත් කියා ගෙන ගියාට පස්සේ මම ඊළඟට මොකක්ද අහන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක මට තේරෙනවා. නමුත් ඒක -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

පළමු වැනි එකට උත්තර දුන්නාම නේ මට ඊළඟ ප්‍රශ්නය අහන්න වෙන්නේ. ඒ ප්‍රශ්න තුනත් මට ලියලාම දෙන්න තිබුණා එහෙම නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වෙන්න. පෞද්ගලික සාකච්ඡාවලට යන්න එපා. පෞද්ගලික සාකච්ඡා වැඩියි සභාවේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

පළමු ප්‍රශ්නයට උත්තරේ දුන්නාම නේ මට දෙවැනි ප්‍රශ්නය අහන්න වෙන්නේ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

දැන් අපේ මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා අතුරු ප්‍රශ්න කිහිපයක්ම ඇහුවා. මේ ප්‍රශ්න -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු ඇමතිතුමනි, මෙහෙමයි.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

සමාවෙන්න. අපි මිත්‍රශීලීව උත්තර දෙන්නේ. අනික් ඇමතිවරු මම දන්නේ නැහැ. මේ ගුරු කාර්ය සාධන පත්‍රිකාවක් මීට කලින් සකස් කළා. ගරු සභාපතිතුමනි, ගුරු කාර්ය සාධන පත්‍රිකාවට එල්ල වූ විරෝධය අනුව ඒ සාධන පත්‍රිකාව ඉවත් කර ගත්තා. දැන් මේක ක්‍රියාත්මක නැහැ. මේක කොහේ හරි ක්‍රියාත්මක වෙනවා නම්, මම ඒක බල රහිත කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

බොහොම ස්තුතියි. දැනටමත් සමහර කලාප වල -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු ඇමතිතුමා, හොරණ කලාපයේ කිසිම ගුරුවරයෙකුගේ වැටුප් වර්ධක අත්සන් කරන්නේ නැහැ මේක නැතිව. කොට්ඨාශ අධ්‍යක්ෂ මේක අනුමත කරන තෙක් හොරණ කලාපයේ කිසිම තැනක නැහැ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

උගත් නීතිඥ මහත්තයෝ ඕක නිවැරදිව අහන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට තුන් වන ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව.

## 03.

**මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය: (ප්‍ර/vi(1)15/30)**

**අ.** ශිෂ්‍ය සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීම නිසා බප/කැල/හීන්කෙන්ද ප්‍රාථමික විද්‍යාලය වසා දැමීමට නියමිතව තිබූ බව ඔබතුමා දන්නවාද?

ආ. එසේ වුවද ගම්වාසීන්ගේ මැදිහත්වීමෙන් මෙම විද්‍යාලය හීන්කෙන්ද මහා විද්‍යාලයට ඒකාබද්ධ කර සංවර්ධනය කළ බව ඔබතුමා දන්නේද?

ඇ. දැනට මෙම විද්‍යාලයේ ශිෂ්‍ය සංඛ්‍යාව 665 ( 1 – 5 ශ්‍රේණිවල) දක්වා ඉහළ ගොස් ඇති බව ඔබතුමා දන්නේද?

ඈ. දැනට මෙම පාසලට තිබෙන ඉල්ලුම හේතුවෙන් පාසලට ප්‍රවේශ වන ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ යාම හේතුවෙන් තිබෙන සමාන්තර පන්ති සංඛ්‍යාව 3 සිට 4 දක්වා වැඩි කිරීමට කලාප අධ්‍යාපන කාර්යාලයේ අනුමැතිය ලැබී ඇති බව ඔබතුමා දන්නවාද?

ඉ. එසේ වුවද එම පන්ති කාමර වැඩි කිරීමට සමාන්තරව අවශ්‍ය ගුරුවරුන් ද, ගොඩනැගිලි පහසුකම් ද තවමත් සපයා දී නොමැති බව ඔබතුමා දන්නවාද?

ඊ. මෙම පාසලට අවශ්‍ය ගුරුවරුන් ලබා දී පන්ති කාමර පහසුකම් සකසා දෙන්නේද?

උ. එසේ නම් ඒ කවදාද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

අ. ශිෂ්‍ය සංඛ්‍යාව අඩු වී තිබූ නමුත් වසා දැමීමට තීරණය වී නොතිබුණි.

ආ. මෙම විද්‍යාලය හීන්කෙන්ද මහා විද්‍යාලයට ඒකාබද්ධ කර එහි ප්‍රාථමිකය ලෙස පවත්වාගෙන යන ලදී.

ඇ. දැනට සිසුන් 677 ක් ඉගෙනුම ලබයි.

ඈ. දැනට සමාන්තර පන්ති 4 ක් පවත්වාගෙන යනු ලබයි.

ඉ. දැනට ඇති පන්තිවලට ප්‍රමාණවත් ගුරු මණ්ඩලයක් ඇත.

ඊ. දැනට ප්‍රමාණවත් ගුරුවරුන් හා පන්ති කාමර පහසුකම් ඇත.

උ. ඉදිරියේදී ඇති වන ගොඩනැගිලි අවශ්‍යතා පිළිබඳ සලකා බලා ඒ අනුව අවශ්‍ය ගොඩනැගිලි පහසුකම් ලබා දීමටත්, ගුරුභවතුන් ලබා දීමටත් ඉදිරියේදී කටයුතු කරමි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු ඇමතිතුමනි, මට මේ ශබ්දය නිසා 'ඊ 'ප්‍රශ්නයට දීපු උත්තරය මට පැහැදිලි නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වන්න.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, සභාවේ ශබ්දය පොඩ්ඩක් අඩු කරලා දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කිව්වා පුළුවන්තරම් ඉතින්. කරුණාකරලා සභාව නිශ්ශබ්ද වෙන්න.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

දැනට ඇති පන්තිවලට ප්‍රමාණවත් ගුරු මණ්ඩලයක් ඇත.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඉන්නවා කියලාද කියන්නේ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඇත.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

පැහැදිලිවම ගරු ඇමතිතුමනි, මේ මා සතුව තිබෙනවා මේ පාසලෙන් ඉල්ලුම් කරපු ලිපි. දැන් 2013 වසරේදී පන්ති තුන සිට හතර දක්වා වැඩි කරන්නය කියලා අනුමැතිය දීලා තිබෙනවා. හැබැයි, අනුමැතිය දුන්නාට ප්‍රමාණවත් පන්ති කාමර ප්‍රමාණයක් නැහැ. ඒ වාගේම මේ පාසලේ ගුරුවරු නැහැ. මේ පන්ති වැඩි කරන්න සමාන්තර ශ්‍රේණි - විශේෂයෙන්ම මම ඔබතුමාට පැහැදිලි කළා වාගේ මේක කලින් වසා දැමීමට ආසන්න තත්ත්වයේ තිබුණු පාසලක්. නමුත් මේ පාසලේ විදුහල්පති ස්වාමීන් වහන්සේ සහ ගුරුවරුන්ගේ මැදිහත් වීම මත දැන් මේ පාසල දැන් දියුණු වෙලා තිබෙනවා. ඔබතුමා කියපු විධියට 677 ක් දක්වා ළමුන් සංඛ්‍යාව වැඩි වෙලා තිබෙනවා. දැන් තිබෙන ප්‍රශ්නය ප්‍රාථමික ගුරුවරු ප්‍රමාණවත් නැහැ. පන්ති හතරට ගුරුවරු ප්‍රමාණවත් නැහැ. එක ගුරුවරියක් දැනටමත් ස්වේච්ඡා පදනමින් සේවය කරන්නේ. ඒ නිසා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ගරු මන්ත්‍රීතුමා දැන් දීර්ඝ විස්තරයක් සපයන එක -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගුරුවරු ප්‍රමාණවත් නැහැ. අහන්නේ, ගුරුවරු දෙනවාද නැද්ද මොකක්ද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අපේ චක්‍රලේඛය අනුව ගුරුවරු ලබා දීලා ඇති කියලා මම විශ්වාස කරනවා. එසේ නොවන්නේ නම් ඒ අඩුව සම්පූර්ණ කරලා දෙනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

බොහොම ස්තුතියි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මට 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. පසුගිය 16 වැනිදා බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට ජනාධිපති කොමිෂන් සභාව පරීක්ෂණයක් පැවැත්වුවා. ඒ පරීක්ෂණ අවස්ථාවට - ඒක Public - ප්‍රසිද්ධ පරීක්ෂණ මණ්ඩලයක් යටතේ තමයි පවත්වන්නේ. ඒ පරීක්ෂණය නැරඹීම සඳහා මම එතැනට ගියා. පළමු වැනි ලිෆ්ට් එකෙන් හිටපු ජනාධිපතිතුමාගේ නීතිඥ මහත්වරුත්, හිටපු ජනාධිපතිතුමාත්, එතුමාගේ ආරක්ෂකයන් ඇතුළු පස් දෙනාටයි යන්න පුළුවන්කම තිබුණේ. ඒ පස් දෙනා උඩට ගියාට පස්සේ දෙවැනි ලිෆ්ට් එකේ නගින්න මමත්, අපේ සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමාත් එතැන ඉන්න කොට පොලිස් නිලධාරියා ඇවිල්ලා මාව තල්ලු කරලා, මට එතැනට යන්න දෙන්න බැහැයි කිව්වා. ඉතින් මම ඇහුවා යන්න දෙන්න බැරි හේතුව? උසාවියේ නියෝගයක් තිබුණාද? අපට විරුද්ධව තහනමක් අරන් තිබුණා ද? කියලා ඇහුවාම ඒ මුකුත් නැතිව මාව තල්ලු කරලා දාලා, මට යන්න දුන්නේ නැහැ. මාව තල්ලු කළාම මාව ලිෆ්ට් එක ඇතුළට ගිහිල්ලා මම උඩට ගියා. ඒක මාධ්‍යවලින් ප්‍රසිද්ධියේම පෙන්වලාත් තිබුණා. නමුත් පසුව පොලිස් දෙපාර්තමේන්තුව, ඉරිදා මගේ ගෙදරට මිරිහාන පොලීසිය හරහා පණිවිඩයක් එවලා, කුරුඳුවත්ත පොලීසියට උදේ 10.00 ට මට එන්න කියලා, උදේ 10.00 ට මම මගේ නීතිඥ මහත්වරුත් සමඟ ගියාට පස්සේ මට ඇපයක් අරන් දෙන්නම් කියලා උසාවියට දාලා - 34 වගන්තිය යටතේ තමයි ඒක දැම්මේ. රාජකාරියට බාධා කළා කියලා. මම රාජකාරියට බාධා කරන්න ගියේ නැහැ. මම මහජන නියෝජිතයෙක් හැටියට ඕනෑ තැනකට යන්න මට අයිතියක් තිබෙනවා. මේ රටේ පුරවැසියෙක් හැටියට යන්න අයිතියක් තිබෙනවා. එතකොට මේ අනුව මම පොලිස් නිලධාරීන්ට බාධා කළාය කියලා පැමිණිල්ලක් දැම්මා. පොලිස් නිලධාරියාට විරුද්ධව කරන්න ඕනෑ පැමිණිල්ල මට විරුද්ධව කරලා උසාවියට දැම්මා. උසාවියට දැම්මාම නඩුකාරතුමා මට කිව්වා, මීට පෙරත් ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ පරීක්ෂණයට සහභාගී වෙලා අපට පොලිස් පොතේ - උසාවියේ අත්සන් කරන්න තිබෙනවා, සෑම මාසයකම සිකුරාදා දිනයට. එතකොට ඒ නිසා මේකට යාම වරදක් කියලා මාව කූඩුවට දැම්මා 23 වැනිදා වන තෙක්. ඉතින් මේක ද ප්‍රජාතන්ත්‍රවාදය? මේක ද රටේ කොමිෂන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය අපි දැනුවත් වුණා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එතකොට අද මේ යහපාලන ප්‍රතිපත්ති අනුව දැන් මේ පාලනය වන කොමිෂන් සභාවලින් පොලිස් දෙපාර්තමේන්තුව සම්පූර්ණයෙන්ම අයුතු විධියට ඒ තර්ජන ගර්ජන කරලා මිනිස්සුන්ට පහර දෙමින් හැසිරෙන වෙලාවක ඉන්නේ. ඒ නිසා ඔබතුමාට අපේ පළාත් සභාවේ සභාපතිවරයා යටතේ ඔබතුමාට බලයක් තිබෙනවා. මගේ මේ ඉල්ලීම පොලිස්පතිවරයාට ලියලා,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පුළුවන්. පැහැදිලිවම.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

පරීක්ෂණයක් පවත්වලා, මේකට සාධාරණ විසඳුමක් අරන් මහජනයාට ප්‍රසිද්ධ කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, අනිවාර්යයෙන්ම ඒක කරනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මොකද, මාව මිනීමරුවෙකු හැටියට, පාතාලයේ කෙනෙකු හැටියට එතකොට මම හොරකම් කරපු කෙනෙක් හැටියට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. පැහැදිලියි ගරු මන්ත්‍රීතුමා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මෛත්‍රීපාල සිරිසේන ඇතුළු ඒ යහපාලන ආණ්ඩුව බැලුවා මාව මහින්ද රාජපක්ෂගෙන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට 36(1) යටතේ මට මීට වඩා කථා කරන්න දෙන්න බැහැ. ඔබතුමාට දීර්ඝ විස්තරයක් කරන්න දෙන්න බැහැ. කරුණාකර වාඩි වෙන්න. මම ඔබතුමාගේ වරප්‍රසාද කඩ වීම සම්බන්ධයෙන් -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

රටේ ජනාධිපතිවරයා යටතේ තිබෙන්නේ ආරක්ෂක අමාත්‍යාංශය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඒ සම්බන්ධයෙන් පොලිස්පතිතුමාට කථා කරලා ඒ සම්බන්ධව වැඩ පිළිවෙළක් අපි සකස් කරනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

36(1) යටතේ අයිතියක් තිබෙනවා. එතුමා යටතේ තිබෙන්නේ ආරක්ෂක අමාත්‍යාංශය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. කරුණාකරලා දැන් ඔබතුමා වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

දැන් එතකොට ගරු සභාපතිතුමනි, පසුගිය කාලයේම බැලුවා මාව හොරකමකට අල්ලා ගන්න පුළුවන්ද? මාව දූෂණයකින් අල්ලා ගන්න පුළුවන්ද? මාව දේශපාලන වශයෙන් - (බාධා කිරීම්) මාව රාජපක්ෂ මහත්තයාගෙන් කඩන්න පුළුවන්ද කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා, ඔබතුමා වාඩි වෙන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, කථා කරන්න දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දීර්ඝ විස්තරයක් කරන්න ඉඩ දෙන්න බැහැ මට.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

වරප්‍රසාදය පැහැදිලි කරන්න දෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම මේ සභාවේ කියන්න ඕනෑ, රාජපක්ෂ මහත්තයා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මේ රටේ 2/3 බලයක් ගන්න පුළුවන් පාර්ලිමේන්තුවට බලය ගෙනැල්ලා. අවුරුදු 30 ක් තිබුණු යුද්ධය අවසන් කරලා,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, දැන් ඔබතුමා කරුණාකරලා වාඩි වෙන්න. දැන් ඔබතුමාට අවස්ථාව දුන්නා නේ?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

රාජපක්ෂ මහත්තයාගේ යම් දෙයකට අපට සහභාගී වෙන්න අයිතියක් තිබෙනවා. අපි රටේ පුරවැසියෝ හැටියට. මන්ත්‍රීවරයෙක් හැටියට අපට තියෙන අයිතියක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි පැහැදිලියි. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ වරප්‍රසාද කඩ වීම සම්බන්ධයෙන් පොලිස්පතිතුමාව දැනුවත් කරලා අපි ක්‍රියාමාර්ග ගන්නවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒ නිසා මම තමුන්නාන්සේ හරහා කියන්නේ අද විශේෂ යෝජනාවක් හැටියට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා ඔබතුමා වාඩි වෙන්න.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

දැන් ආපහු පොලිසියෙන් අරන් ගිහිල්ලා දානවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

පාර්ලිමේන්තුවේ කථානායකවරයාගෙන් අවසරයක් ගන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා වාඩි වෙන්න. ඔබතුමා මේ සභාවට කරදරයක් වෙන්න එපා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ පළාත් සභා මට්ටමන් විතරක් නොවෙයි, අනිකුත් මන්ත්‍රීවරුන්ටත් එහෙම අසාධාරණ වෙන්න පුළුවන්. ඒ නිසා -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මන්ත්‍රීවරු අත්අඩංගුවට ගන්න කොට සභාපතිතුමාව දැනුවත් කරන්න කියන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එහෙම මන්ත්‍රීවරයෙක් ගන්නවා නම් ඔබතුමාගේ අවසරයක් ඇතිව ගන්න ඕනෑය කියලා මේ සභාවේ යෝජනාවක් අපි සම්මත කර ගන්න ඕනෑ. ඒ නිසා -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, මන්ත්‍රීවරු අත්අඩංගුවට ගන්න කොට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක රීතිවලට දාලා අපි කරමු.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒ යෝජනාව සම්මත කර ගන්න ඕනෑ මේ සභාවේ. මොකද හේතුව, ඒක ඔබතුමාටත් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න. ඔබතුමාට දිගින් දිගටම අවස්ථාව දෙන්න බැහැ මට. දීර්ඝ විස්තරයක් කරන්න දෙන්න බැහැ. කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒ නිසා මගේ වරප්‍රසාද ප්‍රශ්නය සම්බන්ධයෙන් ඔබතුමා පොලිස්පතිතුමාට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න. සභාව ඉදිරියට ගෙනියන්න බැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම මානව අයිතිවාසිකම් කොමිසමට යනවා. ඒ වාගේම (බාධා කිරීම්) සුප්‍රීම් කෝට් එකට ගිහිල්ලා මගේ නිවැරදිභාවය මම ඔප්පු කර -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න. ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා, පොඩ්ඩක් කියන්න. මොකක්ද මේ? සභාව විහිළුවට ලක් කරන්න එපා. ගරු ආණ්ඩු පක්ෂ සංවිධායකතුමා, ගරු සභානායකතුමා බලාගෙන ඉන්නවා. මොකක්ද මේ සභාව. කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ අවස්ථාව දීම සම්බන්ධව ස්තුතිවන්ත වෙමින් (බාධා කිරීම්) පොලීසිය දාලා රාජපක්ෂගෙන් අපව ඉවත් කරන්න බැහැයි කියන එක ඉදිරිපත් කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම මේ සභාවේ අවධානයට යොමු කරනවා. විශේෂයෙන්ම මේ 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් කියලා නොයෙකුත් හැලි කියන්න ලැහැස්ති වෙන්න එපා. මොකද, ඒක කෙටියෙන් කියන්න. අපට පැහැදිලිව කිව්වා නේ? දීර්ඝ විස්තර කථා කරන්න දෙන්න බැහැ. ඒක කරන්න බැහැ.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

හැල්ලක් නොවෙයි. මෙතුමාගේ ප්‍රශ්නයක් මේ කිව්වේ. ගරු සභාපතිතුමා, ඔබතුමා ඇයි ඔහොම කථා කරන්නේ. මන්ත්‍රීවරයකුට ප්‍රශ්නයක් ඇති වුණාම ඒ ගැන සලකලා බලන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

කියන්නේ කොයි විධියට ද කියලා නැහැ නේ?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, පොලීසිය එතුමාගේ අයිතිය කඩ කරලා තිබෙන්නේ. (බාධා කිරීම්) එහෙම නම් එතුමාට කථා කරන්න තිබෙන අයිතිය නැති කරන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට අවස්ථාව දුන්නා. දිගින් දිගටම අවස්ථාව දෙන්න බැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මීට වඩා බුද්ධිමත් වෙන්න. අපේ මන්ත්‍රීවරු කොයි පක්ෂයේ හිටියත් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. මට පැහැදිලියි. ඔබතුමා කෙටියෙන් කිව්වා නේ ඒක. මම තේරුම් ගත්තා ඒක.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

දේශපාලන නායකත්වයක් ගම්වල දීලා පත් කරපු මහජන නියෝජිතයෝ අපි.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඔව්. ඒක ඇත්ත.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒක යූ.එන්.පී. වෙන්න පුළුවන්. ජේ.වී.පී වෙන්න පුළුවන්. හෙළ උරුමයේ වෙන්න පුළුවන්. නමුත් අපි මහජන නියෝජිතයෝ. පැරදෙන්නේ නැතිව මේකේ හිටපු මිනිස්සු අපි.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සභාවේ මේ ගැන කථා කරන්න බැරි නම් වැඩක් නැහැ නේ?

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, අපි මාධ්‍යවලින් දැක්කා. අපි සම්පූර්ණයෙන්ම විරුද්ධයි කොඩිකාර මන්ත්‍රීතුමාව අත්අඩංගුවට ගත්ත ක්‍රමයට. මේක වැරදි සංස්කෘතියට යන මට්ටමක් වෙනවා. ඒ නිසා අපි සම්පූර්ණයෙන්ම විරුද්ධයි. අඩු ගණනේ පාර්ලිමේන්තුව තුළ තිබෙනවා, කථානායකවරයාගෙන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම බලතල මට නැහැ නේ ඉතින්.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

බලතල නැති බව දන්නවා අපි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හදා ගන්න ඕනෑ.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ගරු සභාපතිතුමනි, ඒවා නැත්තම් ඒවා ඇති කර ගන්න. තමුන්නාන්සේ බබා වාගේ ඔතැන ඉඳගෙන ඉන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට හදන්න බැහැ. තමුන්නාන්සේලා හදලා දෙන්න ඒවා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ ආණ්ඩුව කාලයේ -

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

එහෙම කථා කරන්න එපා. හෙට අනිද්දා වෙන කොට සියලුම මන්ත්‍රීවරුන්ට ඕක වෙයි.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ තොප්පිය ගැලෙව්වා. හැබැයි, එදා කථා කරන්න කවුරුවත් හිටියේ නැහැ. ඒ කාලෙයේ. හැබැයි අපි ඒ කාලයේ ඒක කළාය කියලා මේ කරපු අළුගුත්තේරු වැඩේට අපි විරුද්ධයි කියන එක මම මතක් කරන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, අපේ ප්‍රධාන ඇමතිතුමා නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යවරයා. ඔබතුමා නියෝගයක් කරන්න නියෝජ්‍ය පොලිස්පති, කොළඹ දිසාව භාර එක්කෙනා ගෙන්වලා මෙතුමාගේ වරප්‍රසාද කඩ වීම සම්බන්ධයෙන් ප්‍රශ්න කරන්නය කියලා. මෙතුමාගේ වරප්‍රසාද කඩ කරලා තිබෙන්නේ. මෙතුමා මහජන නියෝජිතයෙක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මම කිව්වා. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා, මම කියන දෙයක් ඇහෙන්නේ නැහැ නේ? කොඩිකාර ගරු මන්ත්‍රීතුමා කෑ ගහනවා. මම කියන දේවල් ඇහෙන්නේ නැහැ. මම ඒ ටික කිව්වා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මෙතුමා මහජන නියෝජිතයෙක්. මෙතුමාගේ වරප්‍රසාද කඩ කිරීමෙන් බරපතළ වැරැද්දක් කරලා තිබෙනවා පොලීසිය. ඒ නිසා නියෝජ්‍ය පොලිස්පති කොළඹ දිසාව භාර එක්කෙනා ගෙනැල්ලා, මහ ඇමතිතුමාගේ කාර්යාලයට ගෙන්වලා එතුමාගේ වරප්‍රසාද ආරක්ෂා කරලා දෙන්න. පොලීසියයි වරප්‍රසාද කඩ කරලා තිබෙන්නේ. එතුමා මහජන නියෝජිතවරයෙක්.

[සභාවේ ඝොෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාපතිවරයා වශයෙන් මගේ තිබෙන බලතල තුළ මම ඒ දේ කරනවා.

[සභාවේ ඝොෂා]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

පොලීසිය කොහොමද එහෙම බාධා කරන්නේ. ඒ නිසා කරුණාකර කොළඹ දිසාව භාර නියෝජ්‍ය පොලිස්පතිව ගෙන්වන්න. (බාධා කිරීම්)

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

පාලනය කරන්න යන්න එපා. කථා කරන්න අවස්ථාව දෙන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

වරප්‍රසාද ආරක්ෂා කරලා දෙන්න. මන්ත්‍රීවරුන්ට කොහේවත් යන්න බැරි වෙයි මෙහෙම. මන්ත්‍රීවරයෙකුට කොහේවත් තැනකට යන්න බැරිද? මහජන නියෝජිතයන්ට යන්න තිබෙනවා. නතර කරන්න කාටවත් බැහැ. අපි මහජන නියෝජිතයෝ. ඒ නිසා එතුමාගේ වරප්‍රසාද ආරක්ෂා කරලා දෙන්න ඔබතුමා නියෝගයක් කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම නියෝගයක් කළා. ඔබතුමාට ඇහුණේ නැහැ ඒක. කරපු නියෝගය මොකක්ද කියන එක. එතුමාගේ වරප්‍රසාද කඩ වීම සම්බන්ධයෙන් පොලිස්පතිතුමාව දැනුවත් කරලා, ඒ සම්බන්ධව අදාළ නියෝජ්‍ය පොලිස්පතිතුමා හෝ වෙන්න පුළුවන්. කවුරු හෝ වෙන්න පුළුවන්. අපි ඒ ගැන පරීක්ෂණයක් පවත්වන්න - මම ලේකම්තුමාට උපදෙස් දෙනවා, කඩිනමින් ඒ පිළිබඳව තීන්දුවක් ගන්න ඕනෑ කියලා. විෂය භාර අමාත්‍යවරයා වශයෙන් අපේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යතුමාට නීතිය හා සාමය යටතේ එතුමාටත් බලතල තිබෙනවා. එතුමාටත් පුළුවන් ඒ සම්බන්ධයෙන් මොකක් හරි තීන්දුවක් ගන්න. ප්‍රධාන අමාත්‍යවරයා වශයෙන්. මම දන්නේ නැහැ, ඒක කොහොම තිබෙනවාද කියලා.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, මම දන්න අපේ පළාත් සභාවේ එහෙම එකක් නැහැ. පාර්ලිමේන්තුවේ නම් එහෙම වරප්‍රසාදයක් තිබෙනවා. මමත් මාධ්‍යවලින් දැන ගත්තේ එතුමාව අත්අඩංගුවට ගත්තාට පස්සේ. මේ සිද්ධිය. ඒක දැක්කාම කොපමණ වුණත් මටත් පොඩ්ඩක් කේන්ති ගියා. මොකද, එතුමා මගේ ආසනයේ මාත් එක්ක දේශපාලනය පටන් ගත්ත මන්ත්‍රීවරයෙක්. ඒක වෙනම කථාවක්. නමුත් මෙතුමා දැන් ඉන්නේ උසාවියේ. මම කිසිම දෙයක් නැහැයි, බැහැයි කියලා හිතන මහ ඇමති කෙනෙක් නොවෙයි. ඔබතුමා දැන් අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාගේ අදහස අනුව - අපේ විපක්ෂ නායකතුමා ඉන්නවා. අපි පනතේ වරප්‍රසාදවල මොනවා තිබුණත්, අපි එහෙම සාකච්ඡාවක් කරලා බලමු. අපට එහෙම එකක් කරන්න පුළුවන්ද කියලා. වෙච්ච දේ වුණා. ඊළඟ එකේදී අපි එහෙම දෙයක් වළක්වා ගන්න පුළුවන්ද කියලා බලමු.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

නැත්නම් නීතිය හා සාමය කියන වචන දෙක අයින් කරන්න. නීතිය හා සාමය කියලා තිබෙනවා නේ මහ ඇමතිතුමාගේ විෂය පථයට අයිති වෙලා. තේරුමක් නැහැ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

උසාවියේ කියලා මේක කර අරින්න එපා ගරු මහ ඇමතිතුමා. නියෝජ්‍ය පොලිස්පතිව ගෙන්වලා ඉක්මණට එතුමාට ඇප අරන් දෙන්න රාජකාරී සලස්වන්න ඉදිරියට.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

එය අනිවාර්යෙන් අපි මන්ත්‍රීවරු හැටියට කියනවා. වහාම මේක ක්‍රියාත්මක කරන්න. මෙතුමාට ඇප අරන් දෙන්න.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

හරිස්චන්ද්‍ර කොස්තා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා විහිළුවට කිව්වා නම් මට ප්‍රශ්නයක් නැහැ. ඇත්තට කිව්වා නම් මාව ඒ තත්ත්වයට ගන්න එපා. මට කොයි මන්ත්‍රීවරයාත් එකයි. කොඩිකාර මන්ත්‍රීතුමාත් එකයි. ඔබතුමාත් එකයි. මම එහෙම පස්සට යන්නේ නැහැ.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

නිකම් කථා පාලනය කරන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා අනවශ්‍ය ප්‍රකාශ කරන්න ලෑහැස්ති වෙන්න එපා. කථා පාලනය - අනවශ්‍ය කථා කරන්න දෙන්න බැහැ මට. ඔබතුමා කොහොමද එහෙම අභියෝග කරන්නේ. දැන් තවම මේ ප්‍රශ්න යන්නේ. මේ විධියට යන්න ගියාට පස්සේ අපි සභාව යන්නේ කොහොමද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මම පළාත් සභා නීති පොත ගැන බැලුවා. ඒකේ තිබුණා අපේ පළාතේ සාමය සම්බන්ධව කොමිටියේ සභාපතිවරයා තමයි අපේ ආණ්ඩුකාරවරයා. ආණ්ඩුකාරවරයා තමයි බස්නාහිර පළාතේ සාමය සම්බන්ධව තිබෙන කමිටුවේ සභාපතිවරයා. එතකොට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා, දැන් ඔබතුමාගේ ප්‍රශ්නය කිව්වා නේ?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මහ ඇමතිවරයා තමයි ඒකේ උපදේශකවරයා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් විශේෂයෙන් මම ඉල්ලා සිටිනවා. මේ සභාවේ න්‍යාය පත්‍රයට අපට මේ විදියට යන්න බැහැ. අධිකරණයේ තිබෙන ඒවා මෙතැන කථා කරනවා. අධිකරණයේ තිබෙන ඒවාට මැදිහත් වෙන්න මට බලයක් නැහැ. මට ඒක කරන්න බැහැ. අධිකරණයේ විවාද වන ප්‍රශ්නයක් මේ තිබෙන්නේ. දැන් බැහැ ඉතින්. (බාධා කිරීම්)

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, මේක ව්‍යවස්ථාදායක සභාවක්. මේ සභාව මේ පළාතට නීති සම්පාදනය කරන ආයතනයක්. ඒ නිසා මේ සභාව හැල්ලුවට ලක් කරන්න එපා. ගරු මන්ත්‍රීතුමාගේ වරප්‍රසාද -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම හැල්ලුවට ලක් කරන්නේ නැහැ. මම කොහේද හැල්ලුවට ලක් කරන්නේ. ඔබතුමා අනවශ්‍ය ප්‍රකාශ කරන්න එපා. වැරදි ප්‍රකාශ කරන්න එපා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මේ පිළිබඳව අභ්‍යන්තර පරීක්ෂණයක් කරන්න කිසිම බාධාවක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක තමයි කිව්වේ.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

අධිකරණ කටයුත්ත වෙනම කෙරිච්චදෙන්. ඒ අධිකරණ කටයුත්තට බාධාවක් නොවෙයි අභ්‍යන්තර පරීක්ෂණයක් කිරීම. මේක ව්‍යවස්ථාදායක සභාවක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ සම්බන්ධව ගරු මන්ත්‍රීතුමා, මුලින්ම මම මගේ මතය කිව්වා. ඔබතුමාත් මේ මූලාසනයේ හිටපු මන්ත්‍රීවරයෙක්. ඔබතුමාත් මූලාසනයේ අවුරුදු හතක් හිටියා. ඔබතුමා තේරුම් ගන්න. ඔබතුමා මෙතැන මේ මූලාසනයට ප්‍රශ්න දාන්න එන්න එපා. මගේ මතය මම කිව්වා. මගේ මතය මම පැහැදිලිව කිව්වා. ඒක ඇහුණේ නැහැ, එතුමාට.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

නැහැ. ප්‍රශ්නයක් නොවෙයි කිව්වේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මොකක්ද මම කිව්වේ?

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද ආරක්ෂා කරලා දෙන්න කියලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. මම ඒ ගැන කිව්වා. පොලිස්පතිතුමාව දැනුවත් කරලා සභාව පැත්තෙන් කරන්න පුළුවන් දේ කරනවා කියලා මම පැහැදිලිව කිව්වා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමා, ඊළඟ අයිටම් එකට යන්න. මේකේ එල්ලිලා ඉන්නේ නැතිව ඊළඟ වැඩ පිළිවෙළට යන්න.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ඔබතුමාගේ මූලාසනයට අපි ගරු කරනවා. ඒ ගැන කිසි තර්කයක් නැහැ. මම කියන්නේ, මේක ව්‍යවස්ථාදායක සභාවක්. මේ ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයකුට වන ප්‍රශ්නය පොදුවේ සමස්ත සාමාජිකයන්ගේ ප්‍රශ්නයක්. ඒ නිසා ඔබතුමා කේන්ති ගන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. මම කේන්ති ගන්නේ නැහැ.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

කේන්ති ගත්තොත් ප්‍රශ්නයට උත්තරයක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම කනගාටු වෙනවා. ඔබතුමා මේ මූලාසනයේ හිටපු මන්ත්‍රීවරයෙක් වශයෙන් වැරදි මතයක් ඉදිරිපත් කළේ ?

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ඒක තමයි මම ඔබතුමාට හිස නමා ආචාර කරලා කියන්නේ. මම ඔබතුමාට ගරු කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ සභාවට පාර්ලිමේන්තුවට වාගේ බලයක් නැහැ. සභාපතිවරයාට බලයක් නැහැ. මන්ත්‍රීවරයෙක් අත්අඩංගුවට ගන්න කොට අපෙන් අහන්නේ නැහැ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, මට 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, මගේ වරප්‍රසාද ප්‍රශ්නයත් ගරු උපාලි කොඩිකාර අපේ හිටපු අමාත්‍යතුමාට අදාළ කාරණාව සම්බන්ධවමයි. මේ සිද්ධියේදී සමහර රූපරාමුවල මාවත් පෙනුනා මාධ්‍යවලින්. ඒ එක්කම මේ සිද්ධිය - මෙතුමා ඒ කොමිෂන් සභාවට ගියාට පස්සේ මමත්, සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමාත් ඒ කොමිෂමේ කටයුතු කෙරන විධිය බලන්න අපිත් සම්බන්ධ වුණා. තවත් මන්ත්‍රීවරු ගියා. එතකොට ඒ සහභාගී වෙන්න ගිය කලින් දවසේ අපට කිසිදු ප්‍රශ්නයක් නැතිව පොලීසිය යන්න දුන්නා.

ගරු සභාපතිතුමනි, අපි විතරක් නොවෙයි අවශේෂ සාමාන්‍ය ජනතාවටත් යන්න දුන්නා. දෙවැනි දවසේත් ඒ නිසාම මේ රටේ යුද්ධය අවසන් කරපු නායකයා නිසා, අපේ නායකයා නිසා මහින්ද රාජපක්ෂ මැතිතුමා වෙනුවෙන් අපි සම්බන්ධ වුණා. ඒ සම්බන්ධ වුණාම අපට කලින් කියලා තිබුණේ නැහැ මේකට එන්න අවශ්‍ය වෙන්නේ නැහැ. එන්න බැහැ. විශේෂ අවසර ගන්න ඕනෑ කියලා කොහේවත් කියලා තිබුණේ නැහැ. එහෙම කියලා තිබුණා නම් අපි යම්කිසි විධියකට ඒ සම්බන්ධව වගකීමෙන් කටයුතු කරනවා. නමුත් මේ තැනට යන්න - යම් ප්‍රසිද්ධ විනිශ්චය සභාවක්. ප්‍රසිද්ධව කටයුතු කරන අවස්ථාවක්. ඒ නිසා අපි එතැනට සම්බන්ධ වුණාම එදා පොලීසිය හැසිරුනේ මෘගයන් විධියට. එහෙම නැත්නම් ඉතාම - මන්ත්‍රීවරුන් විතරක් නොවෙයි. ගරුතර ස්වාමීන් වහන්සේලා වැඩියා. හාමුදුරුවරුන්ටත් මුල් පියවරේ යන්න දුන්නේ නැහැ. ඒ වෙලාවේ අප අතර යම් කථාවක් ඇති වුණා. අපි ඉල්ලීමක් කළා. ඇයි මේකට යන්න දෙන්නේ නැත්තේ. අපට සුප්‍රීම් කෝට් එකට වුණත් නඩුවක් බලන්න යන්න පුළුවන්කම තිබෙනවා නේ? ඉතින් මේක රටේ තිබෙන ප්‍රධාන අධිකරණය ශ්‍රේෂ්ඨාධිකරණය නම්, එතැනට යන්න පුළුවන්කම තිබෙනවා නම්, මේ වාගේ විනිශ්චය සභාවකට යන්න බාධාවක් ඇති වෙන්න විධියක් නැහැ නේ? කිසිදු කෙනෙකුට කලින් දවසේ බාධාවක් සිද්ධ වුණෙත් නැහැ. අපි අතින් සිද්ධ වුණේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නයක් කඩ වුණා නම් මම ඒ ගැන බලන්නම්. මට තිබෙන බලතල අනුව මම සභා කටයුතු කාරක සභාවට යොමු කරනවා, ඔබතුමාගේ වරප්‍රසාද කඩ වීම සම්බන්ධයෙන් -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මගේ අදහස කියන්න දෙන්න ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අදහස කියලා මෙහෙමයි. 36(1) යටතේ කියලා මට අදහස් ප්‍රකාශ කරන්න දෙන්න බැහැ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

36(1) කොහේද කෙටි කරන්න කියලා තිබෙන්නේ. කථාව කොහේද කෙටි කරන්න කියලා තිබෙන්නේ. මේ අදහස කොහොමද පැහැදිලි කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා පොඩ්ඩක් 36(1) වගන්තිය කියවලා බලන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මම කියවලා තමයි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීවරයෙක් මේ සභාවට එන අතරතුර, සභා ගර්භය තුළ, සභාවට පිවිසීමේදී මොකක් හරි ප්‍රශ්නයක් වුණොත් විතරයි වරප්‍රසාද ප්‍රශ්නයක් වෙන්නේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

නැහැ. එහෙම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම නැතිව මේ උසාවියක වෙන - වරප්‍රසාද ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. මම ඔබතුමාට අවස්ථාව ලබා දුන්නා. මානුෂිකව. ඒ නිසා ඔබතුමා කෙටියෙන් අවසන් කරන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

එහෙම නම් මන්ත්‍රීවරුන්ට කිසි වරප්‍රසාදයක් ඇති වෙන්නේ නැහැ නේ? ඔබතුමා පොඩ්ඩක් ඇහුම්කන් දෙන්න කෝ සභාපතිවරයා හැටියට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඇහුම්කන් දුන්නා. නැතිව නොවෙයි.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

අපේ ප්‍රශ්නයක් කියන්න තිබෙන්නේ මේ සභාවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉතින් ලොකු විස්තරයක් කියන්න දෙන්න බැහැ නේ, ගරු මන්ත්‍රීතුමා. ඔහොම කථා කරන කොට මේ සභාව යන්නේ කොහොමද? තවම ප්‍රශ්න 03 ක් විතරයි ගත්තේ. ප්‍රශ්න 15 ක් තිබෙනවා. මූලාසනය වග කියන්න ඕනෑ ඒකට.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, මට කෙටියෙන් මේ අදහස කියන්න දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කෙටියෙන් කියන්නේ නැහැ නේ? කවුරුත් කෙටියෙන් කියන්නේ නැහැ නේ? 36(1) වරප්‍රසාදය ඉස්සෙල්ලා කථා කරන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

අපි කථා කරන්න හදන කොට ඔබතුමා අතර මැදට සම්බන්ධ වුණාම -

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

අපට දුන්නෙත් නැහැ නේ වෙලාව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අතරමැද බාධා කරන්නේ කාලය ගන්න නිසා. වැඩිපුර කාලය ගන්න නිසා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, මම මේ කියන්න උත්සාහ කරන්නේ පොලීසිය තමයි ඉතාම නරක විධියට ඒ වෙලාවේ මැදිහත් වුණේ. එසේ මැදිහත් වෙලා යන්න දුන්නේ නැහැ අපටත්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක වෙනම කාරණයක්. ඒක මට විසඳන්න බැහැ. ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නයක් නම් මට කියන්න පුළුවන්.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඔබතුමාට විසඳන්න පුළුවන් වුණත්, බැරි වුණත් අපි මහජන නියෝජිතයෝ විධියට අපට කියන්න අයිතියක් තිබෙනවා.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ගරු සභාපතිතුමා අපටත් දුන්නේ නැහැ කථා කරන්න.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඔය කියන කථාව ඇත්ත. සරත් ෆොන්සේකා මහත්තයා උසාවි ගෙනෙද්දීත් ඔය විධියටම තමයි පොලීසිය හැසිරුනේ. ඔය විධියටමයි පොලීසිය හැසිරුණේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

පොලීසියෙන් අපට (බාධා කිරීම්) වන ප්‍රශ්නයක් මේ කියන්නේ. කාටත්.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ශිරානි බණ්ඩාරනායක නෝනා ගෙනාපු වෙලාවේත් ඔය විධියටම තමයි හැසිරුණේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මහජන නියෝජිතයන්ට ඇති වන හිරිහැර සම්බන්ධයෙන් තමයි ගරු සභාපතිතුමනි, අපේ ඉල්ලීම. ඒ නිසා පොලීසියේ හැසිරීම -

[සභාවේ ඝෝෂා]

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමනි, විශාල වේලාවක් මේ වෙනුවෙන් ගත්තා. මේක මීට වඩා දිගින් දිගටම ගෙනියන්න එපා. මේකේ යම්කිසි වැරැද්දක් තිබෙනවා නම් සොයලා බලන්න. මේක අධිකරණ කටයුත්තක් බවට පත් වෙලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක තේරුම් ගන්නේ නැහැ නේ?

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

(බාධා කිරීම්) මම වාර්තාව දැක්කා. වෙන වැරැද්දක් තිබුණු නිසා. ඒ නිසා ඔහු පිළිබඳව සොයා බලලා යම්කිසි දෙයක් අපට කරන්න පුළුවන් නම් ඒ යුතුකම ඉෂ්ට කරමු. මීන් ඉදිරියට දිගින් දිගටම ගියොත් අපට වේලාවත් එක්ක වැඩ කරන්න සිද්ධ වෙනවා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, මගේ ඉල්ලීම ආයිත් අත්අඩංගුවට - (බාධා කිරීම්) ගරු සභාපතිතුමනි, මේ අවසාන වශයෙන්. දැන් හෙට දවසේ අපටත් කට උත්තරයක් ගන්න කියලා එන්න කියයි. අපිවත් arrest කරයි. මේ මාර නීතියක්. ඒ නිසා පොලීසිය යම්කිසි විධියකට අත්අඩංගුවට ගන්නවා නම් මේ සභාපතිවරයා විධියට, මේ සභාව දැනුවත් කරලා කටයුතු කරන ක්‍රමයක් හදා ගන්න කියලයි අපි ඉල්ලීම් කරන්නේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ඔයාව ගන්නේ ලිත් කේස් එකට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, දැන් කරුණාකරලා වාඩි වෙන්න. ඔබතුමා ගොඩක් කාලය ගත්තා. දැන් වෙලාව පෙ.ව. 10.30 යි. දැන් තේ විවේකය.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

නැහැ. ඔබතුමා විශේෂ අවධානයක් යොමු කරන්න කියලයි ඉල්ලන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අද න්‍යාය පත්‍රයේ ප්‍රශ්න 15 ක් තිබෙනවා. කරුණාකර ඇහුම්කන් දෙන්න කෝ. තවම ප්‍රශ්න තුනයි සාකච්ඡා කළේ. තව ප්‍රශ්න 12 ක් සාකච්ඡාවට ගන්න තිබෙනවා. දැන් වෙලාව 10.30 යි. පෞද්ගලික පැහැදිලිකිරීම් 08 ක් තිබෙනවා. එතකොට න්‍යාය පත්‍රය කොහොමද යන්නේ? ගරු ප්‍රධාන අමාත්‍යතුමාට මුදල් ප්‍රකාශ සංශෝධනය ගේන්නත් තිබෙනවා. කාලයක් නැහැ, අද මෙහෙම ගියොත් එහෙම. ඒ නිසා මම ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, කරුණාකරලා මේ කාලය සීමා කරන්න. දැන් බලන්න කොඩිකාර මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට මම උත්තරයක් දුන්නා. නමුත් බොරුවට එක එක්කෙනා මේ සභාවේ වීරයෝ වෙන්න කථා කරනවා. කවුරුත් ඒක තේරුම් ගන්න ඕනෑ.

දැන් මම මේ සභාව උදෑසන තේ විවේකය සඳහා විනාඩි 15 කට කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා. 11.39 ට යළිත් රැස් විය.***
*Sitting, accordingly suspened untill 11.39 a.m. and then resumed.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රය අනුව තවම ප්‍රශ්නවලට පිළිතුරු දීමේ අවස්ථාව තිබෙන්නේ. ප්‍රශ්න අංක 04. තවත් ප්‍රශ්න 11 ක් තිබෙනවා. වෙලාව 11.40 යි. ලක්ෂ්මන් නිපුණආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීමේ අවස්ථාව.

**04.**

**ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)15/32)**

අ. අධ්‍යාපනය වෙනුවෙන් දළ ජාතික නිෂ්පාදනයෙන් 6% ක් වෙන් කළ යුතු බවට වන රටේ ජාතික ආණ්ඩු වැඩ පිළිවෙළට ඔබතුමා එකඟ වන්නේද?

ආ. එයට අනුගතව බස්නාහිර පළාත් පාසල් සංවර්ධනය සඳහා සූදානමක් පවතීද?

ඇ. 2016 පළාත් පාසල්වලට පළමු ශ්‍රේණියට, හයවන ශ්‍රේණියට හා උසස් පෙළ ශ්‍රේණිවලට ළමුන් ඇතුළත් කර ගැනීමේදී දෙමව්පියන් විසින් පාසලට ගෙවිය යුතු මුදල් වෙන් වෙන් වශයෙන් මොනවාද?

ඈ. දෙමව්පියන් විසින් භෞතික සම්පත් ලෙස පාසලට දිය යුතු දෑ තිබේද?

ඉ. එයට අමතරව මුදල් හෝ උපකරණ, ප්‍රදානයන් ලබා දෙන ලෙස විදුහල්පතිවරුන් දෙමව්පියන්ට බලපෑම් කරන්නේ නම් ගන්නා පියවර කවරේද?

ඊ. නොඑසේ නම් ඒ මන්ද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අ. එකඟ වේ.

ආ. ඔව්.

ඇ. 07/2013 පාසල් සඳහා ගුණාත්මක, ප්‍රමාණාත්මක හා ව්‍යුහාත්මක සංවර්ධනය සඳහා සැලසුම්කරන හා ප්‍රසම්පාදන චක්‍රලේඛය හා 05/2015 පාසල්වල අවිධිමත් ලෙස මුදල් අය කිරීම තහනම් කිරීම චක්‍රලේඛයට අනුව පහත ගාස්තු අය කළ හැක.

i. සාමාජික ගාස්තු ලෙස රු. 50 කට නොඅඩු රු. 600 කට නොවැඩි සාමාජික ගාස්තුවක්.

ii. පාසලේ අත්‍යාවශ්‍ය වියදම් පියවා ගැනීමට යම් සීමාවන්ට යටත්ව පාසල් සංවර්ධන සමිතිය විසින් යෝජනා සම්මත කර ගත් ගාස්තු.

iii. අනුමත පහසුකම් හා සේවා ගාස්තු

1 – 5 ශ්‍රේණිවල එක් ශිෂ්‍යයකුට වාර්ෂිකව රු. 36
6 – 13 ශ්‍රේණිවල එක් ශිෂ්‍යයකුට වාර්ෂිකව රු. 60

ඈ. නැත.

ඉ. විනයානුකූලව කටයුතු කිරීම.

ඊ. අදාළ නැත.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු ඇමතිතුමා, දැන් ඔබතුමා කියන විධියට දැන් ඔබතුමා නම් කරපු කොටසට විතරයි මුදල් අය කිරීමක් කරන්න පුළුවන්. ඊට පරිබාහිරව ගන්න බැහැ. නමුත් මේ මොහොත වන කොට කොළඹ අශෝක විද්‍යාලයේ ප්‍රසංගයක් ලැහැස්ති කරලා තිබෙනවා. ළමයින් තමයි ප්‍රසංගයට ඉන්නේ. ඒ ළමයින්ගේ තිබෙන ප්‍රසංගයට අවශ්‍ය කරන ඇඳුම් පැළඳුම් සියල්ලම දෙමව්පියෝ ගන්න ඕනෑ. ඊට පසුව ඒ ඔක්කොම හදලා දීලා දෙමව්පියෝ ටිකට් එකකුත් ගන්න ඕනෑ ළමයාගේ ඒවා බලන්න. ඊට අමතරව, වෙනම souvenir එකක් ගහනවා. ඒකට advertisement හදලා දෙන්නත් ඕනෑ දෙමව්පියෝ. ඒකත් අර මම මේ කියන ආකාරයේ බලපෑමක්. මේ සම්බන්ධව ඔබතුමා ගන්නා පියවර කවරේද? මම ඔබතුමාට උදාහරණයක් කිව්වේ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධව වහාම සොයා බලා අවශ්‍ය කටයුතු කරනවා. එතුමාගෙයි මගෙයි අපි සියලු දෙනාගේම සාමාජීය අත්දැකීමක් තමයි ප්‍රධාන පෙළේ පාසල්වල මේ වාගේ ක්‍රියාදාමයන් සිදු වෙමින් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා, මම විශ්වාස කරනවා. අපට ඉදිරි උපදේශක කාරක සභාවේදී විධිමත් තීරණයකට යන්න පුළුවන් වේවි කියලා. දැනට මම ඔබතුමාගෙන් කාරුණිකව අවසර ඉල්ලනවා, මේ සම්බන්ධව සොයා බලන්න. කවදාද මේ උත්සවය තිබෙන්නේ?

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

තව ඉස්සරහාට තිබෙන්නේ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මම සොයා බලා කටයුතු කරන්නම්. අපි උපදේශක කාරක සභාවට මේ ප්‍රශ්නය යොමු කරනවා. මොකද, මේක ජනප්‍රිය යැයි සැලකෙන ඒ මට්ටමේ පාසලක සිදු වෙමින් යන ක්‍රියාවලියක්. නමුත් අපි පළාත් සභාව තුළ එවැනි තීන්දුවක් ගත යුතුයි කියලා මම හොඳින් විශ්වාස කරන කෙනෙක්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

දැන් ලබන අවුරුද්දේ සිට 6% ක් වෙන් කරනවා නම් ගරු ඇමැතිතුමා, දැන් මේ ප්‍රශ්නය මතු වෙන්නේ නැහැ. දෙමව්පියන්ට කිසි කරදරයක් වෙන්නේ නැහැ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

පැහැදිලියි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒ නිසා පළාත් සභාව පැත්තෙන් දැනට එහෙම ඇස්තමේන්තු මොනවා හරි හදලා තිබෙනවාද? ඒ අවශ්‍ය කරන -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම පසුගිය සතියේ සාකච්ඡාවක් පැවැත් වූවා. ඊයේ හවසත් සාකච්ඡාවක් පැවැත් වූවා. ඊයේ උදේ අකිල විරාජ් කාරියවසම් ඇමැතිතුමා එක්ක ලංකාවේ පළාත් නවයේම ඉන්න අපි අධ්‍යාපන ඇමැතිවරු සහභාගි වුණා. අපි එතැනදී බලාපොරොත්තු සහගතව ආවේ. 6% ක්ම කියලාම නොවුණත් සෑහෙන ප්‍රතිපාදනයක් ලැබෙනවයි කියලා අපේ හිතේ විශ්වාසයක් තිබෙනවා. අපි දැන් පෙර සූදානමක් මේ දවස්වල සකස් කරමින් යනවා. ඔබතුමන්ලාගේ අදහස් අපි පසුගිය සභා වාරයේදීත් බලාපොරොත්තු වුණා. ඉදිරියේදීත් බලාපොරොත්තු වෙනවා. බොහොම නම්‍යශීලීව ඔබතුමන්ලාගේ අදහස් භාර ගන්නවා. පක්ෂ භේදයෙන් තොරව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බොහොම ස්තුතියි. ප්‍රශ්න අංක 05 යටතේ සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන ඇමැතිතුමාට ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**05.**

**සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)15/33)**

අ. 2015 ජනවාරි 01 දින සිට 2015 සැප්තැම්බර් 01 දින දක්වා කාලය තුළ එක් එක් ක්‍රීඩාවන් සඳහා වෙන් කළ මුදල කොපමණද?

ආ. එක් එක් ක්‍රීඩාව සඳහා වැය කළ මුදල කොපමණද?

ඇ. දිස්ත්‍රික් අනුව වැය කළ ආකාරය කෙසේද?

ඈ. ප්‍රතිලාභ ලැබූ ක්‍රීඩා සමාජ හා එම ක්‍රීඩා සමාජවලට වෙන් කළ මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද?

ඉ. මිලදී ගත් භාණ්ඩ වර්ග මොනවාද? කොපමණ ප්‍රමාණයන්ද? එම භාණ්ඩ මිලදී ගත් ආයතන මොනවාද හා වැය කළ මුදල කොපමණද?

ඊ. බස්නාහිර පළාත් ක්‍රීඩා ක්ෂේත්‍රය වෙනුවෙන් වැය කිරීම්වලදී මුදල් බෙදී ගිය ආකාරය පිළිබඳ දූෂණ හා අක්‍රමිකතා සිදු වී ඇති බව ඔබතුමා දන්නේද?

උ. එසේ නම් ඊට ගනු ලබන පියවර කවරේද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධව දීර්ඝ පිළිතුරක් දෙන්න වෙන්නේ. ඉතින් ඔබතුමාට අවනත වෙලා කාල වේලාව පිළිබඳව සැලකිල්ලට භාජනය කරලා ගරු සභාපතිතුමනි, මෙම පිළිතුර සභාගත කරන්න බලාපොරොත්තු වෙනවා. සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නාවලියට සියලු උත්තර මේ කොළ හත අටක තිබෙනවා. මොකද, වියදම් වැය විස්තර ඉල්ලන්නේ. ඒ නිසාවෙන් ඒවා මට එකින්එක කියන්න ගියොත් විශාල වේලාවක් යනවා. මම පිළිතුර සභාගත කරනවා.[2] එතුමා ඒකට කාරුණික වෙයි කියලා විශ්වාස කරනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඊ සහ උ කොටසට උත්තර කියන්න පුළුවන්ද?

[2] පිළිතුර ඉදිරියේ පළ කර ඇත.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඊ සහ උ

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

'ඊ' කියන්නේ නැත. 'උ' කියන්නේ අදාළ නැත.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නයෙන් අහන්නේ බස්නාහිර පළාත් ක්‍රීඩා ක්ෂේත්‍රය වෙනුවෙන් වැය කිරීම්වලදී මුදල් බෙදී ගිය ආකාරය පිළිබඳව. දූෂණ හා අක්‍රමිකතා සිදු වී ඇති බව ඔබතුමා දන්නේද? කියන එක. අපේ ගරු ඇමැතිතුමා කියනවා, නැහැයි කියලා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

එසේ නම් ඒක අදාළ නොවේ. ඔබතුමා කියන්නේ පියවරක් ගන්නේ නැහැයි කියලා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

වැඩිමනක් ප්‍රකාශ කරන්න කැමැතියි. එවැනි අක්‍රමිකතා සිදු වූ බවට අපට වාර්තා - යම්කිසි ඉල්ලීමක් කරනවා නම් අපි ඒ සඳහා අවශ්‍ය කටයුතු කරනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමා අද සභාගත කරන ඔය පිළිතුරු මාලාව දිහා බලල මම ඊළඟ සභාවේදී ඒ සම්බන්ධයෙන් අතුරු ප්‍රශ්න ඉදිරිපත් කරන්නම්.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

බොහොම ස්තුතියි.

***[සභාගත කරන ලද පිළිතුර]***
*[Tabled Answer]*

අ. එක් එක් ක්‍රීඩා සඳහා වෙන් කළ මුදල

| ක්‍රීඩාව | වෙන් කළ මුදල |
|---|---|
| කඩුළු පැනීම | 2,010,000.00 |
| උස පැනීම | 1,125,000.00 |
| රිටි පැනීම | 895,000.00 |
| මල්ලවපොර | 436,000.00 |
| පාපැදි | 980,000.00 |
| කරාතේ | 540,000.00 |
| ජාතික රට හරහා දිවීම | 250,000.00 |
| තරග ඇවිදීම | 200,000.00 |
| මැරතන් තරග | 256,000.00 |
| පිහිණුම් තරග | 46,000.00 |
| බැඩ්මින්ටන් තරග | 21,000.00 |
| තයිකොන්ඩෝ තරග | 34,000.00 |
| ක්‍රිකට් තරග | 21,000.00 |
| බර ඉසිලීමේ තරග | 38,000.00 |
| ජූඩෝ තරග | 32,000.00 |
| ජිම්නාස්ටික් තරග | 34,000.00 |
| එල්ලේ තරග | 22,000.00 |
| කාය වර්ධන තරග | 33,000.00 |
| හොකී තරග | 27,000.00 |
| බොක්ෂිං තරග | 43,000.00 |
| පාපන්දු තරග | 19,000.00 |
| මේසපන්දු තරග | 24,000.00 |
| පැසිපන්දු තරග | 18,000.00 |
| බීච් වොලිබෝල් තරග | 18,000.00 |
| කබඩි තරග | 26,000.00 |
| දැල්පන්දු තරග | 16,000.00 |
| වොලිබෝල් තරග | 21,000.00 |
| මලල ක්‍රීඩා තරග | 315,000.00 |

ආ. එක් එක් ක්‍රීඩාව සඳහා වැය කල මුදල

| | ක්‍රීඩාව | එකතුව |
|---|---|---|
| 1 | උස පැනීම | 2,250,000.00 |
| 2 | කරාටේ | 547,900.00 |
| 3 | ක්‍රිකට් | 1,651,300.00 |
| 4 | කවපෙත්ත විසිකිරීම | 6,350.00 |
| 5 | කැරම් | 183,900.00 |
| 6 | චෙස් | 38,850.00 |
| 7 | ටේබල් ටෙනිස් | 371,600.00 |
| 8 | දාම් | 850.00 |
| 9 | නෙට්බෝල් | 375,815.00 |
| 10 | පාපන්දු | 1,854,700.00 |
| 11 | පිහිණුම් | 333,670.00 |
| 12 | බර ඉසිලීම | 14,950.00 |
| 13 | බැට්මින්ටන් | 840,400.00 |
| 14 | මලල ක්‍රීඩා | 426,315.00 |
| 15 | මැරතන් | 275,875.00 |
| 16 | යගුලිය විසි කිරීම | 3,900.00 |
| 17 | වොලිබෝල් | 3,036,202.00 |
| 18 | සැහැල්ලුපන්දු ක්‍රිකට් | 3,592,700.00 |
| 19 | හෙල්ල විසිකිරීම | 18,000.00 |
| 20 | කඩුළු පැනීම | 2,010,000.00 |
| 21 | රිටි පැනීම | 895,000.00 |
| 22 | මල්ලවපොර | 400,000.00 |
| 23 | පාපැදි | 977,465.00 |
| 24 | ජාතික රට හරහා දිවීම | 254,289.00 |
| 25 | තරග ඇවිදීම | 201,161.00 |

ඊ. නැත.

උ. අදාළ නොවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්න අංක 06. මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින්. ඒ ප්‍රශ්නයත් අධ්‍යාපන ඇමැතිතුමාටමයි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

පෙර පාසල් සම්බන්ධ ප්‍රශ්නය නේද?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔව්. ඔව්. ඒක තමයි.

**06**

**මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)15/34)**

අ. i. බස්නාහිර පළාත තුළ පවතින පෙර පාසල් ඔබ අමාත්‍යාංශයට අයත් වන්නේද?

ii. එසේ වන්නේ නම් ඒ කුමන ප්‍රතිපාදන යටතේද?

ආ. i. පෙර පාසල් සම්බන්ධව විෂය භාර අධ්‍යක්ෂවරු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ තනතුරුලාභීන් ලෙස සිටීද?

ii. ඒ කුමන ප්‍රතිපාදන යටතේද?

iii. ප්‍රධාන අමාත්‍යවරයා විසින් පසුගිය දිනක ප්‍රසිද්ධ රැස්වීමකදී එලෙස අධ්‍යක්ෂවරු සිටින බව ප්‍රකාශ කළ බව ඔබතුමා දන්නේද?

ඇ. i. මේ වන විට පළාත තුළ පවතින රජයේ පාසල් ගොඩනැගිලි කීයක පෙර පාසල් පවත්වාගෙන යන්නේද?

ii. ඒ කවර ප්‍රතිපාදන යටතේද?

iii. එම පාසල තුළ පෙර පාසල් පවත්වාගෙන යැමට තීරණය කළේ කවුරුන් විසින්ද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

අ. i. නැත.

ii. අදාළ නැත.

ආ. i. නැත. .

ii. අදාළ නැත.

iii. නැත.

ඇ. i. පාසල් 17 ක.

ii. සැමට අධ්‍යාපනය යටතේ හා අනිවාර්ය අධ්‍යාපන නියෝග යටතේ අවාසිදායක පරිසරවල ජීවත්වන ප්‍රජාව සහ පාසල් වෙත යොමු කිරීමේ අරමුණ ඇතිව සිසුන් අඩුවීම හා ගොඩනැගිලි ඌනව භාවිතා කරන පාසල්වල මේවා පවත්වාගෙන යයි.

iii. ප්‍රාදේශීය ලේකම්, විදුහල්පති, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හා හිටපු අධ්‍යාපන අධ්‍යක්ෂතුමන්ලාගේ ඉල්ලීම් මත

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු ඇමැතිතුමනි, පසුගිය දවසක අපි දැක්කා. විශේෂයෙන්ම, සිරස විමර්ශන කියන වැඩ සටහන මගින් අපේ පළාතේ පෙර පාසලක් සම්බන්ධයෙන් විශේෂ ගැටලුවක් මතු කරනවා. මම නම් වශයෙන් සඳහන් කරන්න අවශ්‍ය වන්නේ නැහැ. මොකද, එතැන අතිශය බරපතළ ගැටලුවක් මතු වෙලා තිබෙනවා. මොකද, මේ ප්‍රාථමික පන්ති පාසල් භූමිය තුළ පෙර පාසල් ගොඩනැගීම හරහා ඒ පෙර පාසල්වල තිබෙන සම්පත් සහ මේ ප්‍රාථමික පාසලේ දරුවන් අර සම්පත් දකිනවා. ඒ දරුවන් සෙල්ලම් කරනවා. ක්‍රීඩා කරනවා. දකිනවා. එතකොට ඒක ඒ දරුවන්ට බරපතළ මානසික ගැටලුවක්. ඒක නිසා මම හිතනවා, පාසල් තුළ පෙර පාසල් ආරම්භ කිරීම කිසිසේත්ම සුදුසු නැහැ. එකෙන් අදහස් වෙන්නේ නැහැ, පෙර පාසල් පවත්වාගෙන යන්න ඕනෑ නැහැයි කියලා. ඒ සඳහා වෙන ඉඩකඩක් හදලා දෙන එකට පළාත් සභාවේ ඒ කරන කාර්යයට අපේ විරුද්ධත්වයක් නැහැ. නමුත් මේ පාසල් භූමිය තුළ මෙවැනි වෙනත් කටයුතු වලට - විශේෂයෙන් පෙර පාසල් කියන එක අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂයය පථයට අදාළ වෙන්නේ නැහැ, ඔබතුමා සඳහන් කළා වාගේම. ඒ නිසා ගැටලුවක් මතු වෙලා තිබෙනවා. ඒ නිසා මේවා පිළිබඳව ගන්නා තීරණය මොකක්ද? කියන එක දැනගන්න කැමැතියි.

එතකොට අනික් කාරණය තමයි, දැන් මේ පෙර පාසල්වලින් විශාල ලෙස මුදල් අය කරනවා. දැන් මේ සඳහන් කරපු පෙර පාසලේ, මට ලැබී තිබෙන තොරතුරු අනුව ළමයින් 80 ක් විතර ඉන්නවා. එක ළමයෙකුගෙන් රුපියල් 1800/- ක් විතර ගන්නවා. දැන් ඊළඟ වසරට රුපියල් 2000 ක් ගන්නවා. එතකොට පාසල් ගුරුවරයෙක් රුපියල් විසි තිස් දාහක පඩියකට සේවය කරනකොට පාසල් භූමිය තුළම පෙර පාසලක් දාගෙන විශාල මුදලක් අය කරනවා. එතකොට මේක සම්පූර්ණයෙන්ම ව්‍යාපාරයක් බවට පත් වෙලා තිබෙන්නේ. ළමයින් වෙනුවෙන් කරන එකකට වඩා ව්‍යාපාරයක් බවට පත් වෙලා තිබෙන්නේ. එවැනි ව්‍යාපාරවලට තවදුරටත් බස්නාහිර පළාතේ පාසල් භූමිය තුළ ඔබතුමා ඉඩකඩ සලසන්න කටයුතු කරනවාද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, විශේෂයෙන් මහින්ද ජයසිංහ අපේ ගරු මන්ත්‍රීතුමා, මේ පැහැදිලි කරන්නේ පෙර පාසල් - මේකේ හරය. පෙර පාසල් රජයේ පාසල් භූමි තුළ පිහිටුවීම පිළිබඳව ඇති වන ගැටලු. මමත් ඒ කාරණාව බොහොම පිළිගන්න කෙනෙක්. අද මම මේ ප්‍රශ්නයට උත්තර දෙන මොහොත වන විට, මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමනි, මේ වාගේ පාසල් 17 ක විතර පිහිටුවලා තිබෙනවා. රතුපස්වල බෝධිරාජ විද්‍යාලය. ඒ වාගේම හෝමාගම ජනාධිපති විද්‍යාලය. ඒ වාගේම ඔබතුමා කියන -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

තලපත්පිටිය සිද්ධාර්ථය.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඔව්. මේ වාගේ දේවල්. ඉතින් දැන් මම අපේ නිලධාරීන්ව කැඳවලා තීන්දුවක් ගත්තා. මීට පස්සේ අපි

එවැනි දේවල් පිහිටුවන්න දෙන්නේ නැහැ. පළමුවැනි කාරණාව. දෙවැනි කාරණාව දැන් මේවායේ ඉන්නේ අපේ දරුවන්. ඒ නිසාවෙන් දරුවන් ගැන හෘද සාක්ෂියට එකඟව බොහොම කාරුණිකව කටයුතු කළ යුතුයි. ඉතින් මම බලාපොරොත්තු වෙනවා, ඉදිරි කාලයේදී මේ දරුවන්ට කරදරයක්, එහෙම නැත්නම් අපහසුතාවයක් නොවන විධියට මේ ප්‍රශ්න ටික විසඳන්න. ඒ සඳහා ඔබතුමාටත් ඕනෑම වේලාවක මගෙත් එක්ක මැදිහත් වෙන්න පුළුවන්. ඉතින් අධ්‍යාපනයට සම්බන්ධ විෂයයන්වලට විවිධ බලපෑම් තිබෙන්න පුළුවන්. මම හිතනවා, ඔබතුමන්ලා බුද්ධිමත් වේවි කියලා. විෂයය භාර ඇමැතිවරයාත් එක්ක ඍජු ලෙස කටයුතු කරන්න. බොහොම ස්තුතියි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්න අංක 07. ජනක දීපාල් වැලිවත්ත ගරු මන්ත්‍රීතුමා විසින් ධීවර, මාර්ග, ප්‍රවාහන, සමූපකාර ගරු අමාත්‍යතුමාට ප්‍රශ්නය ඉදිරිපත් කිරීමේ අවස්ථාව.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ගරු සභාපතිතුමනි, සති දෙකක කාලයක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

සති දෙකක්. කොමසාරිස්තුමාගේ හිතවතෙක්. මේක එදාම ගන්න පුළුවන්. එයා නේ පත් කර ගත්තේ. මෙච්චර කල් ගන්න දෙන්න එපා. කොමසාරිස්තුමාගේ හිතවතෙක්. මේ ප්‍රශ්නයට උත්තරයක් ඕනෑ. මේ ප්‍රශ්නවලට උත්තර නොදී කොමසාරිස්තුමා මඟ අරිනවා. මේ ප්‍රශ්නයෙන් සම්පූර්ණයෙන් මඟ හරිනවා. ඊළඟ සභා වාරයේදී බලාපොරොත්තු වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා අලුත් ඇමැතිවරයෙක් නේ. එතුමාට අපි කාලයක් දෙමු.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

එතුමා නොවෙයි, කොමසාරිස්තුමා මඟ අරින්නේ.

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

මගේ කාලය තුළ නොවෙයි මේ සිද්ධීන් වෙලා තිබෙන්නේ. ඒ නිසා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා -

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මට ඕනෑ අලුත් කට්ටියගේ වැඩ ටික පෙන්වන්න. කොමසාරිස්තුමා දා ගත්ත කට්ටියගේ වැඩ ටික පෙන්වන්න මට ඕනෑ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

කණ්ඩායම් රැස්වීමේදී බේරගන්න.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

කණ්ඩායම් නායක රැස්වීමට විපක්ෂ නායකතුමා එන්නේ නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වාඩි වෙන්න. ප්‍රශ්න අංක 08 ත් ජනක දීපාල් වැලිවත්ත ගරු මන්ත්‍රීතුමා විසින් -

[සභාවේ ඝෝෂා]

[ගරු සභාපතිතුමා]

අනවශ්‍ය ප්‍රශ්නවලට යන්න එපා. අටවැනි ප්‍රශ්නය, ජනක දීපාල් වැලිවත්ත ගරු මන්ත්‍රීතුමාගේ.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ගරු සභාපතිතුමනි, සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, අට වැනි ප්‍රශ්නයේ පොඩි වැරැද්දක් තිබෙනවා. ප්‍රශ්නය ඉදිරිපත් කිරීමේ පොඩි වැරැද්දක් තිබෙනවා. මගේ අතින් නොවෙයි. Printing Mistake එකක්. 2015 නොවෙයි. ඒක 2014 වෙන්න ඕනෑ. පළමුවැනි ප්‍රශ්නය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, එතුමාගේ ප්‍රශ්නය 2014 ලෙස නිවැරදි වෙන්න ඕනෑ. ඔබතුමා සති දෙකකට කල් ඉල්ලා ගත්තා නේද?

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

සති දෙකක් කල් ඉල්ලනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගහලා ලක්ෂ ගණනක් -

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ඒක තමයි. ඔබතුමන්ලා පත් කරගත්ත කොමසාරිස් ඊට පස්සේ ඊට වැඩිය ගහලා. ඒකට උත්තර තමයි සොයන්නේ. පත් කරගත්ත සභාපති ගහපු එක තමයි දැන් සොයන්නේ. ඒකට උත්තර දෙන්න බැරිව කොමසාරිස් හැංගිලා. කොමසාරිස් දා ගත්ත සභාපති ගහලා. ඒකට උත්තර දෙන්න බැරිව කොමසාරිස් හැංගිලා. ඒකට තමයි දැන් උත්තර ඉල්ලන්නේ. ඒකේ උත්තර කොමසාරිස් දන්නවා. ඒකේ උත්තර තමයි අපි ඉල්ලන්නේ. ඒක දීගන්න බැරිව තමයි සභාවේ නැත්තේ. කොමසාරිස් පත් කරගත්ත එක්කෙනා, ඔබතුමන්ලාගේ හිතවතා. අන්න එයා ගහලා. ඒකට උත්තර තමයි අපි ඉල්ලන්නේ. කොමසාරිස් නැහැ. කොමසාරිස් හැංගිලා. උත්තර දීගන්න බැහැ . දැන් සති ගණනක ඉඳන් මහ ඇමැතිතුමා ගෙන්නන්න හදනවා. සමූපකාර ඇමැතිතුමා ගෙන්නන්න හදනවා. කොමසාරිස් හැංගිලා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

අපේ ඇමැති කෙනෙක්ද?

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

කොමසාරිස් හැංගිලා. ඔබතුමන්ලාට ඕනෑ දේ කරන්න ගිහිල්ලා කොමසාරිස් අමාරුවේ වැටිලා. උත්තර දෙන්න බැරිව ඉන්නේ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

පළාත් සභාව කාගෙද?

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

පළාත් සභාව කාගේ වුණත් කමක් නැහැ. කොමසාරිස් ඔබතුමන්ලාගේ වැඩ කරන්න ගිහිල්ලා අමාරුවේ වැටිලා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මේ පළාත් සභාව කාගේද?

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

කොමසාරිස් ගහන්න ගිහිල්ලා අහු වෙලා ඉන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. හරි. දැන් නිශ්ශබ්ද වන්න.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

කොමසාරිස්ට හිතවත්තු සමූපකාරයට දාගෙන රත්‍රං බඩු තොග පිටින් අඩුවට විකුණලා. සල්ලි අරන් තිබෙන්නේ දවස් තුනකට පස්සේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර දැන් -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

මහින්ද - මෛත්‍රී ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් දෙන්නම කරුණාකර විවාදය අවසන් කරන්න.

[සභාවේ ඝෝෂා]

කරුණාකර නිශ්ශබ්ද වන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

කොමසාරිස් වැරැදි කරලා තිබෙනවා නම් අදත් මේ පළාත් සභාවේ -

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ඒක තමයි උත්තර දෙන්නේ නැතිව කොමසාරිස් පනින්නේ. ඒකට තමයි අපි ලැහැස්ති වෙන්නේ. කොමසාරිස්ව ගෙනි යන්න තමයි ලැහැස්ති වෙන්නේ. කොමසාරිස් කට්ටි පනිනවා. ලැජ්ජා නැතිව, දේශපාලන උවමනාවන් මත කොන්ත්‍රාත් කරලා අද හිර වෙලා. උත්තර දීගන්න බැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

අපට නොවෙයි. ඔබතුමන්ලාගේ ඇමැතිවරුන්ට.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

අරගොල්ලන්ගේ කොන්ත්‍රාත් කරලා අමාරුවේ වැටිලා තිබෙන්නේ. විපක්ෂ නායකගේ කොන්ත්‍රාත් කරලා.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මෙතුමාගේ නැන්දාගේ පුතාත් Board එකේ ඉන්නවා. නැන්දාගේ පුතා. අයියා Board එකේ ඉන්නවා. අයියාව බේරගන්න හදන්නේ. හොරකම් කරපු එවුන් එල්ලලා මරන්න ඕනෑ.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

කොමසාරිස්ට ප්‍රශ්නයකට උත්තරයක් දීගන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

අයියා ඉන්නවද?

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

අයියා ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා. දැන් හරි. ටී.වී.වලට ඔක්කොම අහු වුණා. ප්‍රශ්නයක් නැහැ. ගණනට හරි.

ප්‍රශ්න අංක 09, ජනක දීපාල් වැලිවත්ත ගරු මන්ත්‍රීතුමා විසින් සමූපකාර ගරු ඇමැතිතුමාට.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු ලලිත් වනිගරත්න - අමාත්‍යතුමා**
Hon. Lalith Wanigaratna - Minister

සති දෙකක් කල් ඉල්ලනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. ගරු ඇමැතිතුමා සති දෙකක කාලයක් කල් ඉල්ලනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, පළාත් සභාව අපේද?

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

අපේ නොවෙයි. සමහර කොමසාරිස්වරු ඒ වාගේ වැඩ කරන්න යනවා. ඒකයි වෙලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

10 වැනි ප්‍රශ්නය. සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමා විසින්, ගරු සමූපකාර අමාත්‍යතුමාට ඉදිරිපත් කිරීමට.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු ලලිත් වනිගරත්න - අමාත්‍යතුමා**
Hon. Lalith Wanigaratna - Minister

ගරු සභාපතිතුමනි, සති දෙකක කාලයක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්න අංක 11, එම ප්‍රශ්නයත් ගරු සමූපකාර ඇමැතිතුමාට.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ගරු සභාපතිතුමනි, සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්න අංක 12, මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා විසින් සමූපකාර ගරු අමාත්‍යතුමාට ප්‍රශ්නය ඉදිරිපත් කිරීමේ අවස්ථාව.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**12.**

**මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ධීවර, මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/vi(1)15/42)**

අ. 2015.09.25 වන දින ප.ව. 4.30 ට පමණ හංවැල්ල නගරයට ආසන්නයේදී බස් රථයක් ටිපර් රථයක ගැටීම හේතුවෙන් මාර්ගයේ ගමන් කරමින් සිටි පුද්ගලයෙකු මිය ගිය බව ඔබතුමා දන්නේද?

ආ. මෙම බස් රථය මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට අයත් අවිස්සාවේල්ල - කොළඹ (පරණ පාර) යන මාර්ගයේ ධාවනය වන බස් රථයක් බව ඔබතුමා දන්නවාද?

ඇ. මෙම අනතුර සිදු වන අවස්ථාවේදී මෙම බස් රථයේ සිටි රියදුරා හට වලංගු රියදුරු බලපත්‍රයක් නොතිබුණ බව ඔබතුමා දන්නවාද?

ඈ. මාර්ග ධාවන බලපත්‍රයක් නොමැතිව ධාවනය කර තිබුණේ නම් මෙම රියදුරාට සහ එම බස් රථයේ මාර්ග බලපත්‍රය හිමිකරුට විරුද්ධව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් ගනු ලැබූ නීත්‍යානුකූල ක්‍රියාමාර්ග මොනවාද?

ඉ. එම ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳව මෙම ගරු සභාවට දැනුම් දෙනවාද?

ඊ. වලංගු රියදුරු බලපත්‍රයක් නොමැති රියදුරෙකු පාවිච්චි කර එම බස් රථය ධාවනයේ යොදවා ඇත්නම් එම බස් රථයේ මාර්ග බලපත්‍රය අවලංගු කිරීමට ඔබතුමා පියවර ගන්නේද?

උ. නොඑසේ නම් ඒ මන්ද?

**ගරු ලලිත් වනිගරත්න - අමාත්‍යතුමා**
Hon. Lalith Wanigaratna - Minister

අ. ඔව්.

ආ. ඔව්.

ඇ. මා වෙත වාර්තා කර ඇති පරිදි මෙම රියැදුරාට වලංගු බර වාහන රියැදුරු බලපත්‍රයක් තිබී ඇත.
එහි අංකය B442232
නිකුත් කළ දිනය - 2015.05.26
අවසන් වන දිනය - 2019.05.26

ඈ. මෙම බස් රථය මාර්ග බලපත්‍රයක් සහිත බස් රථයකි. අනතුරක් සිදු වූ විට එම අනතුර අධිකාරියට වාර්තා වූ පසු ඒ සම්බන්ධව අනතුරු විමර්ශනයක් කර විමර්ශන වාර්තාවට අනුව අනතුරු සිදු වීමට හේතුව බස් රථයේ වරදක් නම් බස් රථයේ රියැදුරාට සහ හිමිකරුට විරුද්ධව විනය ක්‍රියා මාර්ගයක් ගැනීමට කටයුතු කම්.
මේ සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණයක් ලබන සිකුරාදා දින සිදු කිරීමට දැනුම් දී ඇත.

ඉ. දැනුම් දෙමි.

ඊ. ඔව්.

උ. අදාළ නොවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්න අංක 13, එම ප්‍රශ්නයත් මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා විසින් සමූපකාර ගරු ඇමැතිතුමාට ඉදිරිපත් කිරීමට.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු ලලිත් වනිගරත්න - අමාත්‍යතුමා**
Hon. Lalith Wanigaratna - Minister

ගරු සභාපතිතුමනි, සති දෙකක කාලයක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්න අංක 14, මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමා විසින් අධ්‍යාපන ගරු ඇමතිතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, ඉතාම කාරුණිකව අවසර ඉල්ලනවා. ඊළඟ සභාවේදී උත්තර දෙනවා. ඔබතුමා කැමැති නම් කථා කරන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු ඇමැතිතුමා පිළිබඳව නොවෙයි. ගරු සභාපතිතුමනි, මේ ගරු ඇමැතිතුමාට කටයුතු කිරීමට පහසු කිරීම සඳහා මම කරන පැහැදිලි කිරීමක්. මේ ප්‍රශ්නය මම අධ්‍යාපන ලේකම්වරයා වෙතත්, අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙතත් පැමිණිලි කරලා මාස 09 ක් වෙනවා. මේකට කිසිම උත්තරයක් නැති තැන තමයි මේ සභාව හරහා අධ්‍යාපන ඇමැතිවරයාට යොමු කරන්න තීන්දු කළේ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

හරි නම් මාස නවයෙන් හම්බ වෙන්න ඕනෑ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඔව්. ඉතින් ඒ නිසා මෙහෙම වැඩ කරන්න ගියාම, ගරු ඇමැතිවරුන්ගේ ගෞරවයට තමයි හානි සිද්ධ වෙන්නේ. ඒ නිසා ගරු ඇමැතිතුමනි, අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මන්ත්‍රීවරු හැටියට ඔබතුමන්ලා විඩාවට පත් කරන්න - අපි සමහර වේලාවට අදාළ නිලධාරීන්ට මේ ප්‍රශ්නය යොමු කළාම, නිලධාරීන් ගන්නා වූ ප්‍රමාදය නිසා ඒවායේ වගකීමත් අවසානයේ ඇමැතිවරුන් කරා එනවා. ඒ නිසා ඔබතුමා, ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ සිටින නිලධාරීන්ට, මම නොවෙයි. මේ ඕනෑම මන්ත්‍රීවරයෙක් ප්‍රශ්නයක් ඉදිරිපත් කළාම ඒවාට සති දෙකත් තුනක් ඇතුළත උත්තර දෙන්න. අඩු ගණනේ ලිඛිතව ඒ මන්ත්‍රීවරයා දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළක් හදන්නය කියන එක මම ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා. ගරු සභාපතිතුමාගේ මැදිහත්වීම මත.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, විනාඩියක් දෙන්න. එතුමාගේ විශේෂ ඉල්ලීමක් තිබෙනවා. මම ඒ ඉල්ලීම භාර ගන්නවා. මොකද, ලිඛිතව අදාළ ගරු මන්ත්‍රීතුමාට අපේ උත්තරයට අමතරව ලිඛිතවත් දැනුම් දෙන්න කියන එක. ඒක මම පිළිගන්නවා. මේ ප්‍රමාදයට හේතුව දැන් මේකේ අශ්වයාත් වෙනස් වෙලා. ඉස්තාලයත් වෙනස් වෙලා. මම තවම ඉස්තාලය සුද්ධ කරනවා. ඒකේ බෙටි ගඳ ඔක්කෝම තිබෙනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු ඇමැතිතුමා, සුද්ධ කරගෙන මට උත්තරය දෙන්න කෝ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඒකේ බෙටි තිබෙනවා. අරවා මේවා සුද්ධ කරලා, ඒක මට සුද්ධ කරන්න උදව් කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. බොහොම ස්තුතියි.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

කාගේ බෙටිද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

හිටපු අශ්වයින්ගේ බෙටි. තව අශ්වයෝ බෙටි දාන්න හදනවා. මම ඒවාට ඉඩ දෙන්නේ නැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

කවුද ඒ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

15 වැනි ප්‍රශ්නය, හරිස්චන්ද්‍ර කොස්තා ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව.

[සභාවේ ඝෝෂා]

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. මට පෙනෙන්නේ අපේ විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා හරියට බාධා කරනවා. ඔබතුමාගේ පක්ෂයේ මන්ත්‍රී කෙනෙක් ප්‍රශ්නයක් අහනවා. ඕනවට වැඩියි කියලා අර මන්ත්‍රීතුමිය කියනවා. ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, ගරු මහ ඇමැතිතුමාට ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මහ ඇමැතිතුමා, 15 වැනි ප්‍රශ්නය ඔබතුමාටයි තිබෙන්නේ.

**15.**

**හරිශ්චන්ද්‍ර ද කොස්තා ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/vi(1)15/45)**

අ. නාගරික සංවර්ධන අධිකාරියේ සංවර්ධන බලපත්‍ර සහ කැස්බෑව නගර සභාවේ නේවාසික ඉදිකිරීම් බලපත්‍ර ලබා ගෙන පන්නිපිටිය, පැලැන්වත්ත සාමෝදයපුර 332/12 හි පදිංචි ජයන්ත කුමාර මහතා හා දියණිය විසින් නිවස සෑදීමේදී කැස්බෑව නගර සභාවේ නිලධාරීන් විසින් 2015.04.01 දින බොරු චෝදනා ඉදිරිපත් කරමින් එම ඉදිකිරීම් තහනම් කර මාස 06 කට වැඩි කාලයක් අසාධාරණ ලෙස පළිගැනීමක් සිදු කර ඇති බව ඔබතුමා දන්නවාද?

ආ. මේ සම්බන්ධව බ.ප. පළාත් පාලන කොමසාරිස් දෙපාර්තමේන්තුවට කරන ලද අංක CU14997 දරන පැමිණිල්ල සම්බන්ධව ගෙන ඇති පියවර කවරේද?

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

අ. අදාළ ගොඩනැගිලි අයදුම්පත්‍රයක් අනුමැතිය සඳහා කැස්බෑව නගර සභාව වෙත 2015.04.06 දින ඉදිරිපත් කරන්නට යෙදී ඇති බවත් එකී ගොඩනැගිලි අයදුම්පත්‍රය සඳහා 2015.07.13 දිනෙන් අනුමැතිය ලබා දී ඇති බවත් දනිමි.

ආ. පැමිණිල්ලට අදාළව කොළඹ දිස්ත්‍රික් සහකාර කොමසාරිස් විසින් පරීක්ෂා කර අදාළ ගොඩනැගිලි අයදුම්පත්‍රය සඳහා අනුමැතිය ලබා දීමට උපදෙස් දී ඇත. ඒ අනුව 2015.07.13 දිනෙන් අදාළ අනුමැතිය ලබා දෙන්නට කටයුතු කර ඇත.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, දැන් ගරු මහ ඇමතිතුමාගේ පිළිතුරත් එක්ක මේ මම අහලා තිබෙන ප්‍රශ්නයේ කිසිම ගැටලුවක් නැහැ. මේ වැඩේ නිකම්ම සිද්ධ වීගෙන යනවා වාගේ තමයි ඒ උත්තරෙන් මට දැනුනේ. නමුත් මේ වන විට මේ පුද්ගලයාට නිවස තනා ගැනීමට නගර සභාවෙන් තහනම් කරලා තිබෙනවා. ඒක ඔබතුමා දන්නවාද කියලා අහනවා.

දෙවැනි ප්‍රශ්නය, අනවසර ඉදි කිරීම්, මේ වටේ සියල්ලම ගොඩ කරලා දැන් ගිය සතියේ නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් ඇහුවා. බීජිං ලංකා සමාගම සම්බන්ධව. ඒකත් මේකට අදාළ ප්‍රශ්නයක් ගරු සභාපතිතුමනි. නමුත් මම ඒක මෙතැනට ගොනු කරන්නේ නැහැ, එතුමා ප්‍රශ්නය අහපු නිසා. නමුත් බීජිං ලංකා සමාගමේ වපසරියේ ඒ ඉඩමත් මේ මම ඉදිරිපත් කරලා තිබෙන ප්‍රශ්නයත් සියල්ල එකම ප්‍රශ්නයක් ඇතුළත ගොනු වෙලා තිබෙන එකක්. එතකොට මම ගරු මහ ඇමැතිතුමාගෙන් අහනවා, ඔබතුමා මේ සම්බන්ධව පරීක්ෂණයක් කරන්න ලැහැස්තිද කියලා.

තුන්වැනි ප්‍රශ්නය. ගරු සභාපතිතුමා හරහා ගරු මහ ඇමැතිතුමාගෙන් අහනවා. මේ සිදු වෙලා තිබෙන අසාධාරණය ගැන කිසියම් නිලධාරියෙක් දැනුම් දුන්නද? එහෙම නැත්නම් ඔබතුමා ලැහැස්ති වෙලා ඉන්නවද? මේ පරීක්ෂණයකට ලිපි අපේ පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් ඇවිල්ලා ගොනු කළා. අද වනතුරු ඒකට පිළිතුරක් ලැබුණේ නැහැ. එතකොට ගරු සභාපතිතුමා හරහා ගරු මහ ඇමැතිතුමාගෙන් මම අහනවා, මේ ප්‍රශ්නයට විසඳුමක් දෙන්න නිලධාරීන්ගේ කඹ ඇදිල්ලක් තිබෙනවා. පොඩි ප්‍රශ්න මතිමතාන්තර ගැටුම් මේකේ තිබෙනවා. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේකට පරීක්ෂණයක් පවත්වලා, මේ පුද්ගලයාට සාධාරණයක් ඉෂ්ට කරලා දෙන්නය කියලා ඉල්ලන අතර, මම ප්‍රශ්නයට අදාළව 1- 20 දක්වා ලියකියවිලි 20 ක් සහිත ලිපි ගොනුවක් සභාගත කරනවා.[3] මේ සඳහා පැහැදිලි විනිවිද භාවයෙන් යුතුව පරීක්ෂණයක් කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මහ ඇමැතිතුමා, ඔබතුමා ඒ සම්බන්ධයෙන් යම්කිසි ප්‍රකාශයක් කරනවාද?

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ගරු මන්ත්‍රීතුමා, දැන් මේ පිළිබඳව පසුබිම් වාර්තාව සකස් කරලා මට එවලා තිබෙනවා. මටත් මහජන නියෝජිතයෙක් හැටියට ඔබතුමා කියන කාරණාව තේරෙනවා. මෙතැන ඉන්නකොට උත්තරයක් නේ අපි දෙන්න වෙන්නේ. තමුන්නාන්සේ නොසලකා හැරීමක් හෝ අරියාදුවක් කරන්න මම - මම මහ ඇමැති වුණු හැටියේම කිව්වා, ගරු අපේ ඇමැතිවරුන්ටත්, අපි සති දෙක ඇතුළත නොවෙයි. දෙන්න පුළුවන් නම් එන සභාවේම දෙමුයි කියලා. මොකද කාටවත් ඒකට excuse නැහැ. මොකද, ස්ථාන මාරු වුණා කියලා නිලධාරීන් මාරු වෙන්නේ නැහැ නේ. ඕනෑ වැඩක් කරන්න පුළුවන්. තේරෙනවාද? මොකද අශ්වයෝ නොවෙයි නේ මේ පළාත් සභාවේ මාරු වුණේ. මිනිස්සු. එතකොට ඒ අමාත්‍යාංශ තිබෙනවා. වගකීම් තිබෙනවා. ඒ නිසා එහෙම ප්‍රශ්නයක් නැහැ. හරිද? ඒ නිසා මම හැමෝටම කියන්නේ අපි උත්තරයක් දෙන්න ඕනෑ. අපි දන්නවා, දැන් අපි විපක්ෂයේ ඉඳලා ඇහුවත් ඔබතුමන්ලා දෙන උත්තරයට අපි එකඟ වෙන්නේ නැහැ. නමුත් මේ පසුබිම් වාර්තාව බොහොම ලස්සනට හදලා තිබෙනවා. මේ කාරණය පිළිබඳව

[3] විෂයය භාර ගරු අමාත්‍යවරයාට යොමු කරන ලදී.

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

ඉතිහාසය දන්න - මහ ඇමැතිකම පැත්තකින් දාමු කෝ. මන්ත්‍රීවරයෙක් හැටියට මමත් එකඟ වෙන්නේ නැහැ. මේකේ ගැටලුවක් තිබෙනවා.

අනික් එක නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාගේ ඉල්ලීම්වලට අනුව තවදුරටත් පරීක්ෂණයක් යනවා. ඒ එක්කම පැමිණිල්ලේ සඳහන් විධියට ජල බස්නා කාණුව සම්බන්ධයෙනුත් විමර්ශනයක් තවම කරගෙන යනවා. ඉතින් ඔබතුමා මේ උත්තරයට - මොකද පටන් ගන්නකොටම මම කිව්වේ , සති දෙකකින් මේ සියලුම සැලසුම් දෙන්න ඕනෑ. නීත්‍යානුකූලව අඩුපාඩුවක් නැතිව එවලා තිබෙනවා නම්. එතකොට මේක මම මහ ඇමැතිවරයා හැටියට කරපු ප්‍රකාශයට පටහැනි වැඩක්. මගේ කාලයේ නොවුණ එක වෙනම දෙයක්. මම ඒකේ වගකීම ගන්නවා. මම අභියෝගයකට ලක් කරනවා නොවෙයි. ඔබතුමා කිව්වත් නැතත් මම මේකට action එකක් ගන්නවා. නමුත් මම පෞද්ගලිකව මැදිහත් වෙන්න නොගියේ මේ සම්බන්ධයෙන් නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාගේ මැදිහත්වීමත්, මම හිතන්නේ සුනිල් ජයමිණි ගරු සභා නායකතුමා, ඔබතුමාත් මේකට සම්බන්ධයි. එතකොට ප්‍රදේශයේ ඉන්න ප්‍රධාන දේශපාලන ප්‍රවාහයේ අය මේකට සම්බන්ධයි. මගේ යුතුකම තමයි මේකට සාධාරණත්වයක් ඉෂ්ට කරන එක. බොහොම ස්තුතියි.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

මම සැහීමකට පත් වෙනවා. ගරු මහ ඇමැතිතුමා, බොහොම සාධාරණ පිළිතුරක් ලබා දුන්නා. ගරු සභාපතිතුමනි, මම මෙය සභාගත කරනවා. ඉදිරි පරීක්ෂණවලට මේ ලිපි ගොනු භාවිතා කරගන්නය කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතකොට පහසු වෙනවා. මීළඟට තිබෙන්නේ නොපැමිණි සිටීමේ අවසරය පිළිබඳ යෝජනාව ඉදිරිපත් කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, පොඩ්ඩක් සමාවෙන්න. මට මේ අවසාන ටික ඉවර කරගන්න දෙන්න. අවස්ථාව දෙනවා. පොඩ්ඩක් ඉන්න කෝ. නැත්නම් යන්න බැහැ නේ?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අවස්ථාව දෙනවා. මම ඔබතුමාට අවස්ථාව දෙනවා. අනිවාර්යෙන්ම දෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. පත්තරේක තිබෙන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හදිස්සියක් නැහැ නේ. පොඩ්ඩක් ඉන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අවස්ථාව දෙන්න ඕනෑ.

# නොපැමිණි සිටීමේ අවසරය
# LEAVE OF ABSENCE

**ගරු සුමිත් ලාල් මැන්දිස් - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Sumith Lal Mendis - Chief Government Whip

ගරු සභාපතිතුමනි, *"ආනන්ද රංජිත් රූපසිංහ ගරු මන්ත්‍රීතුමාට මාස තුනක කාලයක් නිවාඩු ලබා දෙන ඉල්ලා සිටිනවා."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

## අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ
MINISTRIES' ANNOUCEMENTS/ MINISTERS' STATEMENTS

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මම ඉතාම සුළු දැනුම් දීමක් කරනවා. මොකද, මම මේ අධ්‍යාපන අමාත්‍යාංශය දීර්ඝ කාලයක් පිහිටුවලා තිබුණේ, සේවාව සැපයුවේ ශ්‍රාවස්ති මන්දිරය තුළ. දැන් ඉතින් මේ අමාත්‍යාංශ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. ගරු ඇමැතිතුමා ප්‍රකාශයක් කරනවා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

විනාඩි යයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කරන්න. දැනුම් දීමක්.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ යටතේ. ඒ නිසා මගේ අධ්‍යාපන, සංස්කෘතික, කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු, තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය අපි බත්තරමුල්ලේ කලින් උපාලි කොඩිකාර හිටපු ගරු ඇමැතිතුමා, නිමල් ලන්සා හිටපු ගරු ඇමැතිතුමා සිටිය ගොඩනැඟිල්ලට රැගෙන ගියා. ඒ නිසාවෙන් ඒ බවයි මතක් කරන්න ඕනෑ. අපි බදාදා මහජන දිනය පවත්වනවා. පාන්දර හයේ සිට සවස හය දක්වා අපට හැකි සියලුම ප්‍රශ්න අපි භාර ගන්න කටයුතු කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සවස හය දක්වා. පැය 12 ක්.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඔව්. උදේ හයේ සිට සවස හය දක්වා. ඒ නිසා මේ පූජා වට්ටි අරගෙන - කතරගම දේවාලෙට යන්න ඕනෑ පූජා වට්ටිය කතරගම දේවාලෙට මිසක් විෂ්ණු දේවාලෙට තියන්න එපා කියලා ඉල්ලීමක් කරනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපති යසපාල කෝරළගේ මැතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු අධ්‍යාපන ඇමැතිතුමා අර මහජනයට දිනයට කලින්, නිලධාරීන් කිහිප දෙනෙක් ඉන්නවා, ජනතාව වෙනුවෙන් වැඩ කරන්නේ නැති. ඒ අය සම්බන්ධයෙනුත් ඉස්සෙල්ලා කටයුතු කරලා ඉන්න.

## පෞද්ගලික පැහැදිලි කිරීම්
PERSONAL EXPLANATIONS

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමාට විනාඩි 03 ක කාලයක් තිබෙනවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම බොහොම ආශාවෙන් බලාගෙන සිටියේ ගරු සභාපතිතුමා මූලාසනයේ ඉන්න වේලාවේ මේ ප්‍රකාශය කරන්න. මොකද, හේතුව

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

2013 වර්ෂයේදී මේ සභාවේදී පෙත්සමක් ඉදිරිපත් කරලා බොහොම පැහැදිලි තීන්දුවක් දුන්නා, වත්තල ප්‍රාදේශීය සභාවේ සිද්ධියක් සම්බන්ධයෙන්. නමුත් මේ සභාව කොපමණ උත්තරීතර වුණත්, මේ යටතේ පළාත් පාලන ආයතන ක්‍රියාත්මක වුණත් එවකට වත්තල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා මේ පෙත්සම් කාරක සභාවේ දීපු තීන්දුව තඹ සතයකට මායිම් කෙරුවේ නැහැ. ඒක බොහොම පැහැදිලියි. අපේ ජානක සූරිය බණ්ඩාර ගරු මන්ත්‍රීතුමාත් දන්නවා ඇති මම මොනවා ගැනද මේ කියන්න යන්නේ කියලා. ඒ දීපු තීන්දුව කිසිම විධියකට, මේ පෙත්සම් කාරක සභාවෙන් දීපු තීන්දුව සත පහකටවත් ගණන් ගත්තේ නැහැ, සභාපතිවරයා හැටියට. ඒ විතරක් නොවෙයි. ඒ තීන්දුවට පටහැනිව ගිහිල්ලා ඒ ක්‍රීඩාංගණයේ අනවසරයෙන් ඉදි කරපු ගෙය ගලවාගෙන යන්න කියපුවාම මොකද කෙරුවේ. ඒකට විදුලිය දුන්නා. වතුර දුන්නා. වරිපනම් අංකයකුත් දුන්නා. එතකොට මේ පළාත් සභාවේ පෙත්සම් කාරක සභාවේ අපි දෙන තීන්දුවලට තිබෙන සැලකිල්ල මොකක්ද?

දැන් ඊට පස්සේ යම්කිසි ප්‍රශ්නයක් මතු වෙලා විමර්ශනයක් සිදු කෙරුවා, බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ චන්ද්‍රානි සමරකෝන් අපේ පළාත් පාලන කොමසාරිස්තුමිය. බොහොම පැහැදිලිව වාර්තාවක් එවලා තිබෙනවා. 2015.05.14 වැනිදා. ඒ විමර්ශනය කරලා, නිගමන හතරක් බොහොම පැහැදිලිව දීලා තිබෙනවා. තමුන්නාන්සේගේ දැන ගැනීම සඳහා මම ඒක කියන්නම්.

පහත සඳහන් කරුණු පිළිබඳව අධීක්ෂණ ප්‍රඥප්තිය යටතේ සභාපති ත්‍යාගරත්න අල්විස් මහතාට එරෙහිව කටයුතු කිරීමට නිර්දේශ කරමු.

මොනවද මේ තිබෙන වැරැදි?

*පමුණුගම, දැලතුර ක්‍රීඩා පිටිය භූමිය තුළ ඉදි කර තිබූ ක්‍රීඩා මණ්ඩපය කඩා ඉවත් කිරීමට සභ තීරණයක් ගෙන නොතිබියදී කඩා ඉවත් කිරීමට ඉඩ දීම හා ඉඩ හැරීම සම්බන්ධයෙන්.*

දෙක. *පළාත් නැඟුම සංවර්ධන වැඩ සටහන යටතේ රුපියල් මිලියන 10 ක ප්‍රතිපාදන මත සායන ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා ප්‍රාදේශීය සභා මූල්‍ය රීති 178 වගන්තිය අංක 05 උප වගන්තියට ප්‍රකාරව රුපියල් දස ලක්ෂයකට වැඩි ව්‍යාපෘති සඳහා බල ප්‍රදේශයේ බෙදා හරින දේශීය පුවත්පත් දෙකකට පළ කර කොන්ත්‍රාත් ඉංජිනේරුවෙකු තෝරා නොගෙන අවිධිමත් ආකාරයෙන් කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගෙන ගිවිසුම් ගත වීමෙන් තොරව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර පළමු ගෙවීම වාර්තාව අත්සන් කිරීම.*

තුන්වැනි එක. *වත්තල ප්‍රාදේශීය සභාවට අයත් පමුණුගම වෙළඳසැල් භූමියේ බාහිර පාර්ශවයක් කඩ කාමර ඉදි කිරීමට ඉඩ දීම හෝ ඉඩ හැරීම සම්බන්ධයෙන්.*

මම හිතන්නේ තමුන්නාන්සේ හොඳට දන්වා ඇති මොකක්ද මේ කියන්නේ කියලා. ඊළඟට,

*පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය අංක 3/1/9 හා 2014.12.19 දිනැති අතිරේක ලේකම් සංවර්ධන, අබ්දුල් මජීඩ් මහතාගේ ලිපියකින් ලබා දුන් උපදෙස් පරිදි වත්තල ප්‍රාදේශීය සභාවට ලබා දුන් ගැල්වනයිස් බට 431 ක් ගබඩාවට භාර දී ලැබීම් නියෝගයක් මේ දක්වා අමාත්‍යාංශයට යැවීමට කටයුතු නොකිරීම.*

මේවා සම්බන්ධයෙන් විනයානුකූලව හා නීත්‍යානුකූලව කටයුතු කරන්නය කියලා මේ සභාවට දැනුම් දීලා තිබෙනවා. මැයි මාසයේ 14 වැනිදා. නමුත් දැන් මේ ප්‍රාදේශීය සභාවේ කාල සීමාවත් අවසන් වෙලා තිබෙනවා. ඉතින් ඒක නිසා මම මේ කියන්නේ, මෙතැන අපි ඇවිල්ලා මේ ප්‍රශ්න පිළිබඳව කොපමණ කථා කෙරුවත්, මේකේ තිබෙන නීතිරීති, මේකේ තිබෙන උපදෙස් පිළිපදින්නේ නැත්නම්, එහෙමනම් පෙත්සම් කාරක සභාවත් අවදි කාරක සභාවත් මේ සභාව තුළ ක්‍රියාත්මක වීම, එහෙමත් නැත්නම් ඔය පුටුවේ සභාපතිවරයා හැටියට වාඩි වෙලා ඉන්න පළාත් සභාවේ සභාපතිවරයාගේ නියෝගය ක්‍රියාත්මක කරන්නේ නැත්නම් මේ මන්ත්‍රීවරු හැටියට අපි ඇවිල්ලා කථා කරන එකේ තේරුමක් නැහැ. ඒක නිසා ඔබතුමාගෙන් මම කරුණාකර ඉල්ලන්නේ, දැන් විශේෂ කොමසාරිස්වරයෙක් යටතේ තමයි පළාත් පාලන ආයතන, විශේෂයෙන් වත්තල ප්‍රාදේශීය සභාව ආදිය ක්‍රියාත්මක වෙන්නේ. දැන් මේවා ක්‍රියාත්මක කරන්න පුළුවන්. සමහර වේලාවට දේශපාලන බලපෑම් තිබෙන්න පුළුවන්. දැන් දේශපාලන බලපෑමක්

නැහැ. ඒක නිසා තමුන්නාන්සේගේ මාර්ගයෙන් මම ඉල්ලන්නේ, මම විශේෂ ප්‍රකාශයක් කළාම ඒකට උත්තර දෙන්න බැහැ. නමුත් මම මේ සියලු ලිපි ලේඛන සභාගත කරනවා. මේ පිළිබඳව පෙත්සම් කාරක සභාවේ දීපු තීන්දු තීරණ ක්‍රියාත්මක නොකිරීම පිළිබඳව තමුන්නාන්සේලාගෙන් මම උත්තරයක් බලාපොරොත්තු වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා, ගෙනෙන ලද ගැටලුව සම්බන්ධව කථා කළ යුතු වෙනවා. පෙත්සම් කාරක සභාවේ ක්‍රියා මාර්ග නිසියාකාරයෙන් කරන්න අපි අදාළ ලේකම්තුමන්ලා, කොමසාරිස්තුමන්ලා කැඳවීම් කරලා නිසියාකාරව කටයුතු කරනවා. ඒ එක්කම අපි දැඩිව ක්‍රියා මාර්ගයක් සභාව ක්‍රියාත්මක කරන්න සිද්ධ වෙනවා. ඒ අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරුන්ටත්, කොමසාරිස්වරුන්ටත් පෙත්සම් කාරක සභාවේ ක්‍රිමාර්ග නිසියාකාරයෙන් ගන්න තීන්දු ක්‍රියාත්මක කරන්න කියලා.

මීළඟට ජනක වැලිවත්ත ගරු මන්ත්‍රීතුමාට, විනාඩි 03 ක අවස්ථාවක් ලබා දෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. 2015 ඔක්තෝබර් මස 05 වැනි බදාදා පත්තරේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, කාලය -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ මුළු සභාවේම මන්ත්‍රීවරුන්ට අදාළ ප්‍රශ්නයක් මේක. අපේ අලුත් ගරු මහ ඇමැතිතුමා මහරගම අධ්‍යාපන කලාපයේ විදුහල්පතිවරු, අධ්‍යාපන නිලධාරීන් ඔක්කොම ගෙනැල්ලා, කලාප අධ්‍යක්ෂ ගෙනැල්ලා පිළිගැනීමේ උත්සවයක් කරලා මේ උත්සවයේදී ප්‍රකාශයක් කරලා තිබෙනවා,

*බස්නාහිර පළාත් පාසල් උත්සව වලට දේශපාලඥයන් දෙතුන් දෙනා ගෙන්වන්න එපා. බස්නාහිර පළාතේ මහ ඇමැති ඉසුර දේවප්‍රිය. මින් ඉදිරියට බස්නාහිර පළාතේ කිසිම පාසලක උත්සවවලට දේශපාලඥයන් දෙන්නා තුන් දෙනා ගෙනෙන්න බැහැ. මම එන උත්සව වල කථා කරන්නත් බැහැ. මායි, කලාප අධ්‍යක්ෂවරයායි, විදුහල්පතිවරයායි විතරයි කථා කළ හැක්කේ.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ගිය සභාවේදී ඔය වාර්තාව සම්බන්ධයෙන් කථා කළා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එතකොට ගරු මන්ත්‍රීවරු 104 දෙනාම, අපේ විමධ්‍යගත සල්ලි දෙන්නේ ඉස්කෝලවලට. අපේ විමධ්‍යගත සල්ලි දීලා අපට අයිතියක් තිබෙනවා, පාසල් අධීක්ෂණය කරන්න. පාසල් බලන්න. පළාත් සභාවට අයිති පාරවල් බලන්න. අපට විෂයය මාලාවක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔය වාර්තාව සහ ඔය ප්‍රකාශය -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු මහ ඇමැතිතුමා එහෙම ප්‍රකාශයක් කළාම -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

උත්තරයක් දුන්නා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මහජන ඡන්දයෙන් පත් වුණු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාදයක් කැඩිලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔව්. ඒක පිළිගත්තා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේක අපේ ගරු මහ ඇමැතිතුමා නිවැරැදි කරගන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒක පිළිගත්තා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මෙතැන අපේ අධ්‍යාපන ලේකම්තුමා ඉන්නවා. ප්‍රධාන ලේකම්තුමිය ඉන්නවා. එතකොට මේ අය හරහා චක්‍ර ලේඛනයක් නිකුත් කරන්න ඕනෑ. මේ ප්‍රකාශය වැරැදියි. මේක නිවැරැදි කරලා අපේ මන්ත්‍රීවරුන්ට ඒ උත්සව වලට සහභාගි වෙන්න, කථා කරන්න අවස්ථාව දෙන්න. දෙමව්පියන්ව අමතන්න, දෙමව්පියන් ගෙන් ප්‍රශ්න අහන්න. දරුවන්ගේ ප්‍රශ්න අහන්න. ඉස්කෝලේ අඩුපාඩු සොයන්න. ඒකට අයිතිවාසිකමක් අපට දෙන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, අපි ගිය සභාවේදී ඒක නිවැරැදි කළා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අපි මෙතැනට මාසයකට දෙපාරක් ඇවිල්ලා මේක ඇතුළේ කථා කරලා යන්න නොවෙයි, මහජනයා ඡන්දය දුන්නේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයෙන් බලය බෙදලා පළාත් සභාවල්වලට -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ගිය පාර සභා වාර්තාවේ 15 වැනි පිටුවේ තිබෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු මන්ත්‍රීවරුන්ට වැඩ කරන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. ඒක නිවැරැදි කරපු එක ගිය පාර සභා වාර්තාවේ 15 වැනි පිටුවේ තිබෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒක නිවැරැදි කෙරුවේ නැහැ. ඒ ඇහුවේ වෙන ප්‍රශ්නයක්. මේ ප්‍රශ්නය වෙන ප්‍රශ්නයක්. මේක මේ පත්තරේම ප්‍රකාශ කරලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. බොහොම ස්තුතියි. ජනක වැලිවත්ත ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

නැහැ, නැහැ. පොඩ්ඩක් ඉන්න. මම තව ඉවර නැහැ . මම අහන්න ඕනෑ, ගරු අධ්‍යාපන ඇමැතිගෙන්. අධ්‍යාපන ඇමැතිතුමා මෙහෙම ප්‍රකාශයක් කරලා කාට හරි චක්‍රලේඛනයක් නිකුත් කරලා තිබෙනවාද මේ මන්ත්‍රීවරුන්ට එන්න බැහැයි කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ අවස්ථාව දැන් අවශ්‍ය නැහැ, ගරු ඇමැතිතුමා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

හිටපු ගරු ඇමැතිතුමා, ඔබතුමා බොහොම හොඳ මහත්මයෙක්. මම නම් කවදාවත් එහෙම ප්‍රකාශ කරන්නේ නැහැ. මම ඔබතුමාට බොහොම ගෞරවයෙන් ආරාධනා කරනවා, ඔබතුමාත් එන්න. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමැතිතුමා, බොහොම ස්තුතියි. ජනක වැලිවත්ත ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව දෙනවා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මෙම අවස්ථාවේදී ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්නේ. පළාත් සභාවේ මන්ත්‍රීවරු වශයෙන්, ඒ වාගේම මහජන නියෝජිතයින් වශයෙන් ඔවුන්ගේ වරප්‍රසාද, අයිතිවාසිකම් නියෝජනය

කරන තැන්වල ආරක්ෂා කිරීම ඔබතුමා හරහා මේ පළාත් සභා මන්ත්‍රීවරුන්ට ඇති විය යුතු අයිතිවාසිකමක් කියලා. මොකද, අපි දකිනවා. මේ පසුගිය දිනවල මහජන නියෝජිතයින් වශයෙන් ඔවුන් ඔවුන්ගේ දේශපාලන අරමුණු හෝ දේශපාලන අදහස් ඉදිරිපත් කරද්දී, එහෙම නැත්නම් යම් යම් තැන්වල පෙනී සිටිද්දී ඔවුන්ට එරෙහිව ක්‍රියාත්මක කරලා, ඒ මතයට එරෙහිව කටයුතු කරලා ඔවුන්ට එරෙහිව කටයුතු කරන අවස්ථාවන් දකිනවා.

ළඟම උදාහරණය වශයෙන් දකින්නේ උපාලි කොඩිකාර මැතිතුමා පසුගිය දවසක ජනාධිපති කොමිෂන් සභාව පැවැතුණු ස්ථානයට ඇතුල් වෙන්න ගිය අවස්ථාවේදී එතුමාට ඒ ඇතුල්වීම වළක්වන්න පොලිස් නිලධාරීන් කටයුතු කරලා, ඊට පස්සේ ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන්න කියලා එතුමාට කුරුඳුවත්ත පොලීසියට එන්න කියලා ඔහුව අත්අඩංගුවට අරගෙන අධිකරණයට ඉදිරිපත් කරලා, ඒකේ සාක්ෂිකාරයන් වන පොලිස් නිලධාරීන්ගේ සාක්ෂි මත ඔහුව රීයේ රක්ෂිත බන්ධනාගාර ගත කරනු ලබනවා. මහජන නියෝජිතයන් වශයෙන් කටයුතු කරද්දී ලොකු ගැටලුවක් සහ අර්බුදකාරී තත්ත්වයක්. මීට ඉස්සෙල්ලා අපේ පළාත් සභාවේ, ඒ වාගේම පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් පිරිසකට අල්ලස් කොමිෂන් සභාව ඉස්සරහා රැස් වුණා කියලා ඔවුන්ට එරෙහිව කටයුතු කරලා අධිකරණයට ඉදිරිපත් කරලා නියෝග ගත්තා, එහෙම කටයුතු කරන්න එපාය කියලා. මේ වත්මන් යහපාලන ආණ්ඩුව තුළ කටයුතු කරනකොට කිව්වේ, තිබුණු ආණ්ඩුවේ අඩුපාඩු අතහැරලා ඒ වෙනුවට ජනතාවට ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ලබා දෙනවා කියලා. ඔවුන්ට ඕනෑ තැනක පෙනී සිටින්න, ඔවුන්ට උද්ඝෝෂණය කරන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් සහතික කරලා තිබෙන අයිතිය ලබා දෙනවා කියලා. නමුත් අද වන විට අපට පෙනී ගෙන යන කරුණක් තමයි, ඒ මතයට විරුද්ධව, ඒ මතයට එරෙහිව කටයුතු කරන පිරිස්වලට නොයෙක් ආකාරයෙන් තර්ජන, පීඩන ලක් වෙන අවස්ථාවක් ඇති වෙමින් තිබෙන ආකාරයයි.

ඒ නිසා විශේෂයෙන් බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරුන් වශයෙන් ඔබතුමාගේ යටතේ ඉන්න මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්න, වරප්‍රසාද ආරක්ෂා කරන්න කටයුතු කරන්න වෙනවා. උපාලි කොඩිකාර මැතිතුමා ඒ අවස්ථාවට සහභාගි වෙන්න යන අවස්ථාවේදී පොලිස් නිලධාරීන් අවහිර කරලා ඔහුව ආපස්සට ඇදලා, එතැනින් ඇතුල් වෙන කොට පොලිස් නිලධාරීන් කරපු වැරැද්ද නොවෙයි, අධිකරණයට ඉදිරිපත් කරන්නේ. අධිකරණයට ගිහිල්ලා කියන්නේ අපේ මන්ත්‍රීවරයා කටයුතු කළා කියලා. මම දැක්කා, රීයේ මාධ්‍යයේ කියනවා, මන්ත්‍රීවරුන්ට හැසිරෙන්න සුදුසු ආකාරයෙන් නොවුණු නිසයි මේ රක්ෂිත බන්ධනාගාර ගත කරන්නේ කියලා. නමුත් මන්ත්‍රීවරයෙක් වුණු පළියට අධිකරණයත් හරියාකාරව කරුණු සොයන්නේ නැතිව මෙහෙම කටයුතු කිරීම වැරැදි සහගත ක්‍රියාවක් කියලා අපි දකිනවා.

අද වන විට රටේ ලොකු මාතෘකාවක් තිබෙනවා. බන්ධනාගාරයේ ඉන්න එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදීන් මුදා හරින්න ඕනෑය කියලා කියනවා. මේ දවස්වල ලොකු මාතෘකාව ඒක. මන්ත්‍රීවරු ඇවිල්ලා ඔවුන්ව නිදහස් කරන්න උද්ඝෝෂණ කරනවා. මේ රටේ ජනතාවගේ ජීවිතය අවුරුදු ගණනක් ව්‍යාකූල කළා. දරුවන් එහෙම් පිටින්ම මරලා දැම්මා. පියවරුන් විනාශ කරපු රටක එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදීන්ට අධිකරණය තුළ සමාව දෙන්න අවශ්‍ය කරන කටයුතු කරන යුගය මහජන නියෝජිතයින් තමන්ට ඡන්දය දීපු ජනතාවගේ උවමනාවන් වෙනුවෙන් පෙනී සිටින අවස්ථාව අවහිර කිරීම අපි දකින්නේ වැරැදි සහගත ක්‍රියාවක් කියලා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා මාර්ගයෙන් ඉල්ලා සිටින්නේ. මහජන නියෝජිතයින් වශයෙන් තමන්ට යුතුකමක් තිබෙනවා. තමන්ට ඡන්දය දීපු ඡන්දදායකයින් වෙනුවෙන් පෙනී සිටින්න. ඔවුන්ගේ මතය වෙනුවෙන් කටයුතු කරන්න. සමහර තැන්වල යද්දී ඒවාට අවහිරවීම වළක්වන්න. ඒවාට අවශ්‍ය අවස්ථාව ලබා දෙන්න. ඒ දේ කටයුතු කරන්න මම හිතන්නේ ඔබතුමාගෙන් ඇති වෙන්න ඕනෑ. ඒ නිසා විශේෂයෙන් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් අත්අඩංගුවට ගන්නවා නම් ඒ පිළිබඳව කටයුතු කරන්න, කථා නායකවරයාගෙන් අවසර අරගෙන කරන්න ඕනෑ. ඒ නිසා ඔබතුමාගෙන් මම ඉල්ලා සිටින්නේ, මේ පිළිබඳව සොයා බලා කටයුතු කරලා, අවශ්‍ය දැන්වීම් කරලා, මහජන නියෝජිතයින් ජනතාව වෙනුවෙන් සේවය කරද්දී මොනවා හරි අවහිරතාවයක් හෝ මොනවාහරි දෙයක් නිසා අත්අඩංගුවට ගන්නවා නම්, ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්න ඔබතුමාගේ අනුමැතිය ඇතිව හෝ අත්අඩංගුවට ගන්න කියන ඉල්ලීම කරනවා. මොකද, නැත්නම් මහජන නියෝජිතයින් වශයෙන් කටයුතු කරද්දී ගැටලු ඇති වෙනවා. ඒ නිසා මේ පිළිබඳව

[ගරු ජනක වැලිවත්ත]

වගකීමෙන් කටයුතු කරන්නය කියලා ඉල්ලා සිටිමින්, වගකිව යුතු ස්ථානවලට, විශේෂයෙන් පොලිස් නිලධාරීන්,ට පොලිස්පතිතුමාව දැනුවත් කරන්න මහජන නියෝජිතයෙක් වුණු පළියට, ඒ වාගේම මේ වත්මන් ආණ්ඩුවේ මතය නොරුස්සන මහජන නියෝජිතයෙක් වුණු පළියටම අත්අඩංගුවට අරගෙන වැරැදි කරුණු දීලා රක්ෂිත බන්ධනාගාර ගත කරන කටයුත්ත දක්වා ගමන් කරන්න එපාය කියන ඉල්ලීමත් කරන්නය කියලා ඉල්ලා සිටිමින්, මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. මා විශේෂයෙන්ම සඳහන් කරන්න තිබෙන්නේ පළමු වසරට පාසල් සිසුන් ඇතුළත් කර ගැනීමේ සිට මෙන්ම පාසල්වලට සිසුන් ඇතුළත් කර ගැනීමේ ප්‍රශ්න රාශියක් මේ අවස්ථාවේ මහජනතාව විශේෂයෙන් මුහුණ දෙන ප්‍රශ්නයක්. සමහර පාසල්වල සිසුන් 35 දෙනෙකුට සීමා කිරීම කියන කාරණාව යටතේ කටයුතු කරනකොට එම පාසලේ අවට ඉන්න දරුවන් විශාල ප්‍රමාණයක් ඉන්නවා නම් මේ 35 කියලා සීමා වුණාම ඒ දරුවන්ව බඳවා ගන්න විදුහල්පතිවරුන්ට හැකියාවක් නැහැ. නීතිමය හැටියට.

ඒ වාගේම මා විශේෂයෙන්ම මේ සභාවේ අවධානය ඔබතුමා මගින් යොමු කරනවා. යම්කිසි පන්තියක ශිෂ්‍යයින් 35 කියන සීමාව අපි ඇති කරන්නට යම්කිසි නීතියෙන් හරි ඉඩක් ලබා දීලා තිබෙන්නේ, සෑම ශිෂ්‍යයෙකුටම නිසි අවධානයක් යොමු කරලා අධ්‍යාපනය දෙන්න ඕනෑය කියන පදනමේ පිහිටුවලා. ඉතින් එවැනි පදනමක් සැලකිල්ලට ගැනීම අහිතකරයි කියලා අපි කියන්නේ නැහැ. නමුත් ඒ වැඩි වන ශිෂ්‍ය සංඛ්‍යාවට අවශ්‍ය කරන පහසුකම මේ පළාත් සභා පාසල් තුළ සැපයීමක් සිදු වෙලා නැහැ. ඒ වාගේම මම කියන්න ඕනෑ. සිසුන් 35 කට සාධාරණයක් කරන්න පන්තියකට සිසුන් සීමා කරනකොට 350 කට පාසල් අහිමි වෙනවා නම් ඒක ගැන සොයන්න මේ අලුතෙන් පත් වුණු ගරු ඇමැතිතුමාගේ අවධානයත් මම ඔබතුමා මගින් යොමු කරනවා. මොකද, අපි 35 කට සීමා -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම සාමාන්‍යයෙන් සම්ප්‍රදායට ගරු කරන කෙනෙක්. රීතියට ගරු කරන කෙනෙක්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මගේ ප්‍රකාශයෙන් පස්සේ ඕනෑ දෙයක් කියන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු මන්ත්‍රීතුමිය, සමාවන්න. බොහොම හිතාන්විතව කියන්නේ. ඊයේ ඔය පිළිබඳව සාකච්ඡාවක් තිබුණු නිසා වේලාව ඉතිරි කරගන්න කියන්නේ. ඔබතුමියගේ මධ්‍යම රජයේ ගරු අධ්‍යාපන ඇමැතිතුමා ඊයේ අපත් එක්ක සාකච්ඡා කළා. ලංකාවේ පළාත් නවයේම ප්‍රධාන අමාත්‍යවරු, අධ්‍යාපන අමාත්‍යවරු. එතැනදී ප්‍රකාශ කළා, 2016 ට 40 බැගින් පවත්වාගෙන යනවා. ඊට කැබිනට් පත්‍රිකා සකස් කරලා තිබෙනවා. ඒක අනුමත වෙනවා කියලා කිව්වා. 2017 සිට එතුමා යෝජනා කරලා තිබෙනවා, 40, 39, 38, 37 ආදී වශයෙන් ක්‍රමානුකූලව අඩු කරමින් ඒ සඳහා අවශ්‍ය භෞතික සහ මානව සම්පත් දියුණු කරලා දෙනවාය කියලා. ඒ පණිවුඩය තමයි මට ඔබතුමියට මතක් කරන්න ඕනෑ. බොහොම ස්තුතියි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒ ගැන බොහොම ස්තුතියි. ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සමහර පාසල්වල පදිංචිය ගැන ලිපි ලේඛන ඉදිරිපත් කරන්නය කියනවා. මේ පදිංචි ලිපි ලේඛන ඉදිරිපත් කිරීමේදී මගේ මීගමුව කොට්ඨාශයේ ගැන සොයා බැලුවොත් එහි පමණක් රජයේ ඉඩම්වල පදිංචි විශාල පිරිසක් ඉන්නවා. ඔප්පු දීලා නැහැ. රජයට නිසි වැඩ පිළිවෙළක් යටතේ ඔවුන්ට පදිංචි සහතිකයක් ලබා දීලා නැහැ. ඔවුන්ට දරුවන් ඉන්නවා. ඔවුන්ට අධ්‍යාපනය දෙන්න පාසලට ගිහිල්ලා මේ ලිපි ලේඛන භාර දෙන්න ක්‍රමයක් නැහැ. ලකුණු හම්බ වෙන්නේ නැහැ. අවසාන ප්‍රතිඵලය වෙලා තිබෙන්නේ International, එහෙම නැත්නම් ජාත්‍යන්තර පාසල් කියන කඩවල්වලට තමයි ළමයින් ටික ගිහිල්ලා භාර දෙන්න වෙන්නේ. මේ කඩයට භාර දුන්නාම ඇතුළත් වීමේ ගාස්තුව ලෙස විශාල මුදලක්

අය කරනවා. දැන් මම අපේ අධ්‍යාපන ගරු ඇමැතිතුමාට පෞද්ගලිකවත් දැනුම් දුන්නා. පෞද්ගලික පාසලක්, එහෙම් පිටින්ම තව පාසලකට විකුණනවා. ඒ විකුණන කොට අලුතින් මිලදී ගන්න පාසල ආයෙමත් ඇතුළත් වීමේ ගාස්තු වශයෙන් ලක්ෂ ගණනක් අය කරනවා. ඉහළ පන්තිවල සිට පහළ පන්ති දක්වා. දැන් මෙහෙම සිද්ධි වෙන කොට ළමයෙකුට උගන්වන්න ගියාම අපේ සමාජයේ අම්මලා තාත්තලා මොන විධියේ ප්‍රශ්නවලට මුහුණ දෙනවාද? පාසලට ඇතුළත් කරගන්න බැරි නිසා International කඩේට දා ගන්නවා, ළමයාට මොනවා හරි උගන්වන්න. ඒක ගිහිල්ලා තව තැනකට විකුණනවා. පළාත් සභාව මේක හදන්න ඕනෑ. පළාත් සභා පාසල්. විශේෂයෙන්ම මේ පෞද්ගලික පාසල් නියාමනය කිරීමක් තවමත් සිද්ධ වෙලා නැහැ. දැන් වසර ගණනාවක සිට පෞද්ගලික පාසල් ක්‍රියාත්මක වෙනවා.

දැන් අපි සමහර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂලාට කියනවා මේ දරුවන්ට පාසලක් නැහැ. ලබා දීමේ ක්‍රමවේදය මොකක්ද? කියලා. මම හිතන්නේ කලින් හිටපු මහ ඇමැතිතුමා ඉන්න කොට මම මේ අධ්‍යාපන අධ්‍යක්ෂ හම්බ වෙන්න යම්කිසි කෙනෙක් යැව්වාම, දරුවකුගේ ප්‍රශ්නයක් යොමු කළාම දැනුම් දෙනවා, ගිහිල්ලා ඇමැතිතුමාගෙන් ලියුමක් ගෙනෙන්න කියලා. බොහොම ශීලාචාර විධියට ඒ කාලයේ දේශපාලනය කෙරුවා. දැන් මම අලුත් ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. බොහොම ශීලාචාර විධියට ළමයා පාසලට ඇතුළත් කරන එකත් දේශපාලනයට ගා ගන්නේ නැතිව මේ සෑම ළමයෙකුටම සමාන අධ්‍යාපන අවස්ථාවක් ලබා දෙන්න. අපේ සභාවේ අවධානයත් මෙයට යොමු කරමින්, ඔබතුමා හරහා ගරු ඇමැතිතුමාගෙන් විශේෂයෙන් ඉල්ලනවා. මේ දරුවන්ට උගන්වන්න ඕනෑ. ඊට පස්සේ අපි වෙනම නොවිධිමත් අධ්‍යාපන ඒකක හදන්න, වෙන ප්‍රශ්න හදන්න, සේයා වගේ දරුවන් මේ වාගේ ඝාතනය වෙන්න ඉඩ තියන්නේ නැතිව මේකට වහාම අවධානය යොමු කරන්නය කියලා මා ඉල්ලීමක් කරනවා. ස්තුතියි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාතේ අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් පාසල් 1270 තුළ මුළු ගුරු සංඛ්‍යාව ඉන්නේ දන්නා තරමින් 44,000 කට ආසන්න සංඛ්‍යාවක්. ඒ වාගේම ඒ 44,000 තුළම තමයි ගුරු උපදේශක 822 ක් සහ වැඩ බලන විදුහල්පතිවරු 85 ක් ඉන්නවා. 907 දෙනෙක් ඉන්නවා. 2015 වසරට මේ වන විට විශ්‍රාම ගිය ගුරුවරුන් 480 ක් ඉන්නවා. ඒ වාගේම 2015 වසරට පිට පළාත්වලින් පැමිණි ගුරුවරුන් 286 ක් ඉන්නවා. මේ වන විට ගුරු පුරප්පාඩු 1185 කට වැඩි සංඛ්‍යාවක් තිබෙනවා.

අපි විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, ගිය 2014 දොළොස් වැනි මාසයේ උපාධිධාරී ගුරුවරුන්ගේ විභාගය පැවැත් වුවා. ඒ වාගේම මේ 2015 ජූනි මාසයේ 19 සහ 22 වැනි දිනවල සම්මුඛ පරීක්ෂණය පැවැත් වුවා. 15,000 කට ආසන්න සංඛ්‍යාවක් ගුරු විභාගයට පෙනී සිටියා. හැබැයි, විභාගයෙන් සමත් වුණේ 4090 කට ආසන්න සංඛ්‍යාවක්. නමුත් මේ වන තෙක් තවම ගුරුවරුන් බඳවා ගැනීමේ කටයුතු කරලා නැහැ. මේ වන විට සාමාන්‍ය පෙළ විභාගය ගන්න දරුවන් ඉන්න පාසල් තිබෙනවා. ඒ වගේම උදේ අර මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා මතක් කෙරුවා වාගේ ප්‍රාථමික ගුරු හිඟයක් තිබෙනවා. ඒ වාගේම උසස් පෙළ ඉගෙන ගන්න දරුවන් ඉන්න පාසල්වල ගුරු හිඟයක් තිබෙනවා. මේ අවුරුද්ද තුළම විශ්‍රාම ගිය ගුරුවරුන් සහ ඊට ඉහත හිටපු ගුරුවරුන්ගේ පුරප්පාඩුව වත් පුරවා ගන්න බැරිව ගිහිල්ලා තිබෙනවා. මේ අවුරුද්දට තව මාස දෙකයි තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මීගමුව කලාපය බැලුවොත්, මීගමුව කලාපයේ විශ්‍රාම ගිය ගුරුවරු මේ අවුරුද්දට 54 ක් ඉන්නවා. ඒ වාගේම කලාපය මාරු වෙලා ගිය ගුරුවරුන් 76 ක් ඉන්නවා. එතකොට 120 යි. නමුත් ලැබිලා තිබෙන්නේ. පිට පළාත් පැමිණි ගුරුවරුන් 56 ක් විතරයි. මේ වන විට ඒ පුරප්පාඩු අනුව ඉතිරි ගුරු පුරප්පාඩු 64 ක් තිබෙනවා. නමුත් අපට මුළු කලාපයම ගත්තොත් 136 ක් ගුරු පුරප්පාඩු තිබෙනවා. සියලු විෂයයන් අනුව. ගරු නියෝජ්‍ය සභාපතිතුමා මාර්ගයෙන් අපි ගරු අධ්‍යාපන ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ ගැන අවධානය යොමු කරන්න. මොකද, මීට ඉහත උපදේශක කාරක සභා පවත්වන කොට අපි මේ පුරප්පාඩුව දැනුම් දීලා, ඒ පත්වීම් ලබා දීලා, ඒ පත්වීම් ලබා දීමේදී, විශේෂයෙන් මීගමුව කලාපයට ගුරු පුරප්පාඩු වැඩිපුර තිබෙන නිසා අපි ඒ අවශ්‍ය ගුරුවරුන් බඳවා ගැනීමේ කටයුතු කරලා තිබෙනවා. නමුත් මේ අවුරුද්ද පුරාම මාස 10 ක් ගත වනතුරු තවමත් ගුරු පුරප්පාඩු එහෙමම තිබෙනවා, පාසල්වල ඉගෙනීම් කටයුතු කරන්න බැරිව.

[ගරු මෙරිල් පෙරේරා]

ඒ නිසා ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඉදිරි මාස දෙක තුළ උපාධිධාරී විභාගය තියලා ඉවර වෙලා, සම්මුඛ පරීක්ෂණ පවත්වා ඉවර නිසා මේ ගුරු පුරප්පාඩු සඳහා ඉක්මණින් බඳවා ගෙන මෙම ගුරු පුරප්පාඩු සම්පූර්ණ කරන්නය කියලා ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කාරණයක් මතු කරන්න බලාපොරොත්තු වෙනවා. මීට පෙර මේ අමාත්‍යාංශ ලැයිස්තුවේ අමාත්‍යාංශ ගොන්නේ තිබුණා, ප්‍රවෘත්ති අමාත්‍යාංශය කියලා විෂයයක්. නමුත් පසුගිය 2015 සැප්තැම්බර් මස 18 වැනි සිකුරාදා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ ආණ්ඩුකාරවරු විසින් කරන ලද පත් කිරීම් ආදිය කියන කොටසේ මේ ප්‍රවෘත්ති අමාත්‍යාංශය කියන කොටස නැහැ. ඇත්ත වශයෙන්ම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි බස්නාහිර පළාත සැලකුවොත් මේ බස්නාහිර පළාත ලංකාවේ මුළු ජනගහනයෙන් 28.8% ක් නියෝජනය කරනවා. ජනගහන වර්ධනයත් මා සොයා බැලූ වාර්තාවලට අනුව 1.6% ක් තිබෙනවා. ඇත්ත වශයෙන්ම මේක වෙනම පරිපාලන ව්‍යූහයක් විධියට සැලකුවොත් බස්නාහිර පළාත දෙවැනි වෙන්නේ, අපේ පාර්ලිමේන්තුව කියන ප්‍රජාතන්ත්‍රවාදී ආයතනයට විතරයි. ඒ නිසා මේ විෂයය ඉතාමත් වැදගත් විෂයයක් බව ප්‍රකාශ කරන්න කාරණා ගණනාවක් තිබෙනවා. මම එක කාරණයක් මතු කරලා පෙන්වන්නම්, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. දැන් මේ බස්නාහිර පළාතට අදාළව යම් යම් ප්‍රචාරක කටයුතු කෙරෙනවා. දැන් මේ එක ප්‍රචාරණයක් සඳහා පාවිච්චි කරපු දැන්වීමක් මා ළඟ තිබෙනවා. ඊයේ ජාතික පුවත්පතක පළ වුණු එකක්. "*යහපාලනයට නව අරුතක්. අත්දැකීම් සපිරි නායකත්වයක්*" කියලා. දැන් මේ පත් කිරීමක් සම්බන්ධයෙන්. මම මීට කලින් මතු කරපු පත් කිරීමක් තිබෙනවා. අයිවන් සනත්. බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සභාපති ධූරයට පත් කිරීම. දැන් මේකේ මේ සුභ පැතුමක් දාලා තිබෙනවා. මේකේ අගමැතිතුමා ඉන්නවා. ජනාධිපතිතුමා ඉන්නවා. අපේ මහ ඇමැතිතුමා ඉන්නවා. විෂයය භාර අමාත්‍යතුමා ඉන්නවා. මම දන්නේ නැහැ, මෙහෙම එකක් දාන්න සාමාන්‍යයෙන් නම් - මේ වාගේම ව්‍යූහයක් ඇතුළේ සාමාන්‍යයෙන් පළාත් සභාවේ දැනුවත් භාවය පිට වෙන්න ඕනෑ. කවුරු හරි මේකට උත්තරයක් දෙන්න ඕනෑය කියලා මම විශ්වාස කරනවා. මේකේ බරපතළ කාරණය මේකයි. අත්දැකීම් සපිරි නායකත්වය අපේ ගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේද? එහෙම නැත්නම් මේ අයිවන් සනත් කියන මේ සභාපති ධූරයට පත් වෙලා ඉන්න වංචනික නිලධාරියාගේද? මේකයි මෙතැන තිබෙන ප්‍රශ්නය. මේක ගැන කරුණාකරලා, මේවාගේ දේවල් දාන කොට ජනතාව නොමඟ යන විධියට මේවා පළ කරන්න ඉඩ දෙන්න එපා. වෘත්තීය සමිතිවලට හෝ නිලධාරීන්ට හෝ මේ පත් වන සභාපතිවරුන්ට.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, පොඩ්ඩක් ඉන්න. හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා සභාවට ආවා නම් හොඳයි. ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒ නිසා මේවා පළ වෙන්නේ කොහොමද? මේවා ගැන නියාමනයක් තිබෙනවාද? සොයා බැලීමක් තිබෙනවාද? මේවාට ගෙවන්නේ කවුද? කියන ප්‍රශ්නය මතු වෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

ඒ වාගේම මේ නිලධාරියා, මේක තහවුරු කරගන්න මම තවම කරුණු සොයනවා. ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි සංස්ථාවේ වැඩ සටහනකට ගිහිල්ලා පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට මේ පළාත් සභාවේ මම කරපු ප්‍රකාශයක් විවේචනය කරමින් මට විරුද්ධව නඩු පවරනවා කියලා ප්‍රසිද්ධියේ කියනවා. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව මම සේවය කරපු ආයතනය. ඒ නිසා මම මේ පිළිබඳව සොයා බලනවා. ඔහුට එහෙම ප්‍රකාශයක් කරන්න අවසර ලැබුණේ කොහොමද? මම මේ කියන්න හදන කාරණය ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක නොවෙයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දන්නවා, මේ පළාතේ තනි ව්‍යූහයක් විධියට සැලකුවාම ප්‍රවෘත්ති හා තොරතුරු පිළිබඳව විෂයය ඇත්ත වශයෙන්ම මේ පළාත් සභාවේ විෂයය පථයට ඇතුළත් විය යුතුයි. මේකේ නියාමනයක්

තිබෙන්න ඕනෑ. පාලනයක් තිබෙන්න ඕනෑ. මම විශ්වාස කරනවා, තොරතුරු හා ප්‍රවෘත්ති පිළිබඳව ප්‍රඥප්තියක් අපි සකස් කර ගත යුතුයි. මම පෞද්ගලිකවම ප්‍රවෘත්තිකරුවෙක් හැටියට මම සූදානම් ඒකට මේ පළාත් සභාවේ එහෙම කටයුත්තක් කරනවා නම් උදව් කරන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒක නිසා මේ ප්‍රවෘත්ති හා තොරතුරු සම්බන්ධයෙන් මේ ඕනෑ ඕනෑ විධියට කටයුතු කරන්න දුන්නොත් බස්නාහිර පළාත් සභාව කියන ව්‍යූහය ඇතුළේ මීට වඩා බරපතළ තත්ත්වයන් මතු වෙන්න ඉඩ තිබෙනවා. ඒක නිසා ඒක මම විශේෂයෙන් මතක් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම අවසාන වශයෙන් තව කාරණයක් තිබෙනවා. අපි දන්නවා, මේ ආයතනය පිළිබඳව ජනතාවට තොරතුරු යනවා ඉතාම අඩුයි. පාර්ලිමේන්තුවට තිබෙන සැලකිල්ල, මාධ්‍යයෙන් පාර්ලිමේන්තුව ගැන සොයන තරම් අපේ පළාත් සභාව ගැන සොයන්නේ නැහැ. තොරතුරු වාර්තා කරන්නේ නැහැ. මම දන්නේ නැහැ, සමහර වේලාවට ජනමාධ්‍ය හිතනවාද දන්නේ නැහැ, මේ පළාත් සභාවෙන් වැඩක් කරන්නේ නැහැයි කියලා. ඒක ගැන මට වෙනම විවේචනයක් තිබෙනවා. ඒ නිසා අපට මොකක් හරි වැඩ පිළිවෙළක් තිබුණා නම්, ප්‍රවෘත්ති අමාත්‍යාංශය වාගේ අපට තිබුණා නම්, එහෙම නැත්නම් අපට ප්‍රඥප්තියක් තිබුණා නම් මීට වඩා විධිමත්ව මේ තොරතුරු හා ප්‍රවෘත්ති කටයුත්ත මේ පළාත් සභාව හරහා - මම යළිත් මතක් කරනවා. රටේ ජනගහනයෙන් 28.8% ක් නියෝජනය කරන්නේ මේ බස්නාහිර පළාත. ඒ නිසා මේ කාරණය පිළිබඳව විශේෂයෙන්ම මේ පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා සහ ගරු අමාත්‍යවරුන්ගේ සහ එමෙන්ම සහෝදර ගරු මන්ත්‍රීවරුන්ගේ අවධානය යොමු කරන්න මම කැමැතියි. ස්තුතියි.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම අර ගැලරියේ ඉන්න කොට ඔබතුමා මාව ඇමැතුවා. මම ඇත්තටම ගියේ සමාජ සත්කාරයක් කරන්න. පොඩි පොඩි තොරතුරු වගයක් ලැබුණු නිසා. ඒක රස්නෙයි. හරියට පෙනෙන්න නැහැ. ඒ අයට ඒ.සී. එක හරියට වැඩ කරන්නේ නැහැයි කියලා කිව්වා. ඒක නිසා මම පොඩ්ඩක් ඒක ඇත්ත ද කියලා බැලුවේ. බොහොම ස්තුතියි, ඔබතුමා ඔතැන ඉඳගෙන හතර පැත්තම බැලුව එකට.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒකට අදාළ නිලධාරීන් ඉන්නවා නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 03 ක කාලයක් ලබා දෙනවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඉදිරිපත් කළේ අපේ බණ්ඩාරගම ආසනය ගත්තාම බණ්ඩාරගම ආසනය ගත්තාම, බණ්ඩාරගම ආසනයේ හොරණ - පානදුර ප්‍රධාන පාර අයිනේම අද විශාල වශයෙන් කුඹුරු ඉඩම් ගොඩ කරගෙන යනවා. එක තැනක කුඹුරු ඉඩමක් ගොඩ කරලා මේ වන විට ඒ ප්‍රදේශයේ ගොඩනැගිලි හදාගෙන යනවා. ඒකට විශේෂයෙන්ම ගිය ආණ්ඩුව පරාජය කරන්න යහපාලනය ගැන විශේෂයෙන්ම දූෂණය, වංචාව ගැන මේ ගොඩ කිරීම් ගැන මාධ්‍යවල ප්‍රකාශ කරපු දේශපාලඥයන් තමයි අද මේ ගොඩ කිරීම් කරන්නේ. ඒ වාගේම එම ගොඩ කිරීම් කරලා ගොඩනැගිලි හදන්න අද ප්‍රාදේශීය සභාවේ අනුමැතිය දීලා තිබෙනවා කියන එකයි අපට දැනගන්න ලැබිලා තිබෙන්නේ. මේ ගොඩකිරීම් සම්බන්ධයෙන් ගොවිජන සේවා එක මඟින් උසාවියේ තහනම් නියෝගයක් අරගෙන තිබෙනවා කියලා දැනගන්න ලැබුණා. දැන ගන්න ලැබීමත් එක්ක අද ඒ නීතිය දන්න මේ දේශපාලන අධිකාරියේ ප්‍රධානීන්, බණ්ඩාරගම ආසනයේ ගත්තාම, දැනට යහපාලනය තුළ ඉන්න, ඇමැතිකම් දරන අය අද මේවා ගොඩ කරන්න සම්පූර්ණ සහයෝගය දීලා තිබෙනවා. අද පුංචි මිනිහෙක් ගොඩ කළොත් එහෙම ඒ මනුස්සයා උසාවි ගෙනි යනවා. උසාවි ගෙනිහිල්ලා ඒ මනුස්සයාට දෙන්න තිබෙන සියලු දඬුවම් දෙනවා. අද එහෙම තිබෙද්දී, අද පාර අයිනේ ෂෙඩ් එක දාලා තිබෙනවා. අද තහනම් නියෝගයක් උසාවියේ තිබෙද්දී. ඒකට අපේ පළාත් පාලන ආයතනයෙනුත් අවසර දෙනවා. තමන්ගේ යම් යම් වැරැදි වහගන්න. ඒ නිසා මම ගරු නියෝජ්‍ය සභාපතිතුමාට යෝජනා කරන්නේ, මේ ගැන විධිමත් පරීක්ෂණයක් කරන්න. මේ ගොඩ කිරීමට තහනම් කරලා තිබෙද්දී දැන් තවත් ගොඩ කරනවා. මෙහෙම ගොඩ කළොත් එහෙම අනික් අහිංසක මිනිස්සු යට වෙනවා.

[ගරු ලලිත් එල්ලාවල]

එතැන තිබෙන ඇළ වේලි ටික වහනවා. ඉතින් මේකට කිසිම නීතියක් නැතිව ඒ නීතියට පිටින් මේවා කරගෙන යනවා. ඒ නිසා මම කරුණාවෙන් ඉල්ලන්නේ, මේ ගැන විධිමත් පරීක්ෂණයක් කරන්න. පළාත් පාලන ආයතනය මේකට අවසර දීලා තිබෙනවා නම් අවසර දුන්නේ මොන පදනමකින්ද කියලා අහන්න. අහලා නැවත මේ ගොඩ කිරීම් නොකරන්නත්, ඒ ගොඩ කිරීම් කරලා ඒ තුළ ගොඩනැගිලි හැදීමට අනුමත කරන්න දීලා තිබෙනවා නම්, ඒ ගොඩනැගිලි එතැනින් ඉවත් කරන්නත් කටයුතු කරන්නය කියලා මම ගරු නියෝජ්‍ය සභාපතිතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කළුතර දිස්ත්‍රික්කයේ ජනතාව මහජන නියෝජිතයන් ලෙස අපව පත් කරලා එවලා තිබෙන්නේ ජනතාවගේ ප්‍රශ්න, ගැටලු මේ සභාව හමුවේ කථා කරලා ඔවුන්ට යම් හෝ විසඳුමක් දෙන්න බලාපොරොත්තුවෙන් කියන විශ්වාසය ඇතිවයි. ඒ අනුව තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේ ප්‍රශ්නය අද මේ කථා කරන්න සූදානම් වෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 1984 අගෝස්තු 24 වැනිදා ශ්‍රී ලංකා ක්‍රිකට් ලෝලීන්ට විශේෂ දවසක් වෙනවා. ඒ එංගලන්තයේ Lord's ක්‍රීඩාංගණයේ අපේ රටේ ක්‍රිකට් වෙනුවෙන් ක්‍රීඩා කරපු සිදත් වෙත්තමුණි නම් ක්‍රීඩකයා ලකුණු 190 ක් එම ක්‍රීඩා පිටියේදී වාර්තා කරනවා. ඒක එදා එංගලන්තයේ පත්තරවල ගියේ ලෝක තේ වෙළෙන්දාගේ රටේ, එහෙම නැත්නම් ශ්‍රී ලංකාවේ ක්‍රීඩකයෙක් ලකුණු 190 ක් එංගලන්තයේදී වාර්තා කළා කියලා තමයි ගියේ. එහෙමයි එහි වාර්තා වුණේ. ඒ වාගේම තමයි අවුරුදු 150 ක් අපේ රට බ්‍රිතාන්‍ය යටත් විජිතයක් හැටියට පාලනය කළා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. එහිදී බ්‍රිතාන්‍යයත්, බොහෝ රටවල් අපේ රට හැඳින් වූයේ තේ සම්බන්ධව තමයි. එහිදී ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ රටේ කුඩා තේ වතු හිමියන් ලක්ෂ පහක් විතර මේ තේ කර්මාන්තයක් සමඟ ජීවත් වෙනවා. ඒ නිසා කුඩා තේවතු හිමියන් වාගේම තේ වතුවල සේවය කරන ලක්ෂ තුනක් විතර ඒ ආශ්‍රිත කර්මාන්තවල රැකියා කරන ලක්ෂ 10 ක් විතර මේ කර්මාන්තයත් එක්ක බැඳිලා ඉන්නවා. රටේ ජනගහනයෙන්, කුඩා තේ වතු ආශ්‍රිතව ජීවත් වන සම්පූර්ණ ජනගහනය ගත්තොත් එහෙම ලක්ෂ 15 ක් විතර මේ වන විට අපේ රටේ ජීවත් වෙනවා.

අපි දන්නවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වන විට කුඩා තේ වතු හිමියන්ටත්, ඒ වාගේම රබර් වතු හිමියන්ටත් විශාල ප්‍රශ්නයක් අද මේ වනකොට රටේ මතු වෙලා තිබෙනවා. ඔවුන්ගේ තේවලට නිසි වටිනාකමක් නැති වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මේ වන කොට අපි දන්නවා, තේ කිලෝ එකක් නිෂ්පාදනය කිරීම සඳහා කුඩා තේ වතු හිමියෙකුට රුපියල් 60 ක් වාගේ මුදලක් වියදම් වෙද්දී අද මේ තේ කිලෝ එකකට ලැබෙන මුදල රුපියල් 50 දක්වා පහත වැටිලා තිබෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ නිසා දවසින් දවස වෙන්නේ, පසුගිය කාලයේ අපි පත්තරවල දැක්කා. එහෙම නැත්නම් ජනමාධ්‍ය තුළ. තේ කිලෝ එකකට සහතික මිලක් ලෙස රුපියල් 80/- ක් දෙනවා කියලා ලොකුවට කථා කළා. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තේවලටවත්, රබර්වලටවත් මේ මොහොත වන විට ඒ කියපු සහතික මිල නැති වෙලා තිබෙනවා. මේ වනකොට රුපියල් 50/- දක්වා තේ කිලෝ එකකට ගෙවන වටිනාකම පහත වැටිලා තිබෙනවා.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රුපියල් 80/- දෙනවා කිව්වත් කළුතර දිස්ත්‍රික්කය ගත්තොත් එහෙම බස්නාහිර පළාතේ වැඩිපුර කුඩා තේ වතු හිමියන් සංඛ්‍යාවක් ඉන්නේ මෙම දිස්ත්‍රික්කයේ. එහිදී රුපියල් 80/- ගෙව්වෙත් මාස කිහිපයක් විතරයි. කළුතර දිස්ත්‍රික්කයේ තේ කර්මාන්ත 31 ක් තිබෙනවා. එහිදී කර්මාන්ත 05 කට තමයි රුපියල් 80/- ගෙව්වේ. ඒ ගෙව්වෙත් දළු 2½ 60% ක් තිබෙනවා නම් පමණයි රුපියල් 80/- ගෙව්වේ. දැන් ඒත් ඒ මුදල ගෙවන්නෙත් නැහැ. දවසින් දවස කුඩා තේ වතු හිමියන්ට ගෙවන මුදල ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වන විට අඩු වෙලා තිබෙනවා. ඒ නිසා කුඩා තේ වතු හිමියන් දවසින් දවස මේ කර්මාන්තයෙන් ඇත් වෙලා යනවා. ඒ නිසා තමන්ගේ තේ වත්තට ගිහිල්ලා ඔවුන් සුසුම් හෙලනවා, දැන් මොකද කරන්නේ කියලා.ඒ වාගේම තේ වතුවල වැඩ කරන සේවකයන්, ඒ කර්මාන්ත ආශ්‍රිතව සේවය කරන සේවකයන් අද කර කියා ගත නොහැකි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඔවුන් අද දළු කඩන්නේ නැහැ. කප්පාදු කරන්නේ නැහැ. පොහොර

දාන්නේ නැහැ. වල් නෙළන්නේ නැහැ. මෙවැනි තත්ත්වයක් නිසා ඔවුන්ගේ ජීවිතය සම්පූර්ණයෙන් බිඳ වැටෙමින් තිබෙන බව තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට පෙනෙන්න තිබෙන්නේ.

ඒ නිසා මේ ප්‍රශ්නයේදී, අපි සමහර අවස්ථාවලදී දැකලා තිබෙනවා දේශපාලනයට සම්බන්ධ බොහෝ දෙනා උත්තර දෙන්නේ, මේකට මූලික ප්‍රශ්නය වෙලා තිබෙන්නේ ලෝක වෙළඳ පොළේ තේ වලට තිබෙන ඉල්ලුම නැති වෙලා කියලා. නැත්නම් ලෝක වෙළඳ පොළ කඩා වැටිලා කියලා. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලෝක වෙළඳ පොළේ ශ්‍රී ලංකා තේ වලට, Ceylon Tea වලට තිබුණු ඉල්ලුම නැති කරගෙන තිබෙන්නේ අපේ රටේ තිබෙන සමහර ක්‍රියාදාමයන් එක්ක තමයි . ඉන්දියාවෙන් ගෙනෙන ඒ බාල තේ කලවම් කරලා කසළ තේ හැටියට තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද Ceylon Tea කියන නම කැත කරගෙන තිබෙන්නේ. ඒ නිසා ඒ තේවලට තිබෙන ඉල්ලුම කසළ තේ කලවම් කිරීම නිසා අපේ රටේ දවසින් දවස කඩාගෙන වැටෙන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මේ කුඩා තේ වතු හිමියන් අද මේ නිසා විශාල අසීරුතාවයකට පත් වෙලා තිබෙනවා.

ඒ නිසා මේ බස්නාහිර පළාතේ, විශේෂයෙන්ම කළුතර දිස්ත්‍රික්කයේ, අපි ගත්තොත් එහෙම කුඩා තේ වතු හිමියන්, කුඩා රබර් වතු හිමියන් විශාල අසීරුතාවයකට පත් වෙලා තිබෙනවා, මේ කර්මාන්තය අද දිනේ කරගෙන යැමට නොහැකි තත්ත්වයක් මතු වෙලා තිබෙන නිසා. ඒ නිසා අපි විශේෂ අවධානයක් මේ සඳහා යොමු කළ යුතුයි. අපේ රටේ අපනයන ආදායමෙන් 15% ක් මේ තේ කර්මාන්තයෙන් අපට ලැබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ නිසා මේ ලක්ෂ 15 ක් විතර රැකියා කරන, ලක්ෂ 15 ක් විතර ජීවත් වන මේ කුඩා තේ වතු හිමියන් අදාළ ක්ෂේත්‍රයේ රැකියා කරන බොහෝ දෙනාගේ ජීවිත සුරක්ෂිත කරන්න ඕනෑ නම් අපි මේ පළාත් සභාවේත්, ඒ වාගේම කුඩා තේ වතු සංවර්ධන අමාත්‍යාංශය ඇතුළු වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මේ සඳහා මැදිහත් වෙලා, මේ පළාත් සභාවේ වතු යටිතල පහසුකම්, කර්මාන්ත වැනි අමාත්‍යාංශ මැදිහත් වෙලා මේ සඳහා විසඳුමක් සොයා ගත යුතුයි කියලා මම මේ සභාවේ යෝජනා කරනවා.

# පළාත් සභාවේ කටයුතු - I
PROVINCIAL COUNCIL AFFAIRS - I

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ - අමාත්‍යතුමා**
Hon. Nishantha Sriwaranasinghe - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"අද දින පොදු කටයුතු ප්‍රමුඛතාවය ගත යුතුය."* යන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# පළාත් සභාවේ කටයුතු - II
PROVINCIAL COUNCIL AFFAIRS - II

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ - අමාත්‍යතුමා**
Hon. Nishantha Sriwaranasinghe - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"අද දින න්‍යාය පත්‍රයේ සඳහන් පොදු කටයුතු විෂයයේ වැඩ කටයුතු සඳහා රීති අංක 57(1), 57(4) හා 57(5) හි සඳහන් විධිවිධානයන්ගෙන් කිනම් හෝ බාධාවක් සිදු නොවිය යුතු යැයි සළකා ක්‍රියා කළ යුතුය." යන යෝජනාව මම ඉදිරිපත් කරනවා.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# මුදල් ප්‍රකාශය - සංශෝධනය - 2015
# බස්නාහිර පළාතේ පළාත් සභාව
FINANCIAL STATEMENT - AMENDMENT – 2015
WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් සම්මත කරනු ලැබූ 2015 මුදල් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රකාශය, 2015.09.14 දින බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පත් කරනු ලැබ, දිවුරුම්/ප්‍රතිඥා දුන් අභිනව ගරු අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන් වෙත පැවරූ විෂයයන්ට අනුකූල වන පරිදි සංශෝධනය කිරීමට සිදුව ඇති හෙයින් ඒ සඳහා ඉදිරිපත් කරන "මුදල් ප්‍රකාශය - සංශෝධනය - 2015" අනුමත කළ යුතුය."* යන යෝජනාව මම ඉදිරිපත් කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

## මුදල් ප්‍රකාශය - සංශෝධනය - 2015 ට අදාළ විසර්ජන (සංශෝධිත) ප්‍රඥප්තිය

APPROPRIATION (AMENDMENT) STATUTE RELATED TO FINANCIAL STATEMENT – AMENDMENT – YEAR 2015

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

*ගරු නියෝජ්‍ය සභාපතිතුමනි" 2015 වර්ෂය වෙනුවෙන් වූ මුදල් ප්‍රකාශය - සංශෝධනය - 2015 ට අදාළ වන පරිදි, 2014 අංක 06 දරන විසර්ජන ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා පිළියෙළ කරන ලද 2015 අංක ...... දරන විසර්ජන (සංශෝධිත) ප්‍රඥප්තිය අනුමත කළ යුතුය."*යන යෝජනාව මම ඉදිරිපත් කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

## පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :

PRIVATE MEMBERS MOTION:

### පළාත් පාලන ආයතනවල සභිකයන්ගේ මාසික දීමනාව ඉහළ නැංවීම

INCREASING MONTHLY ALLOWANCE OF COUNCILORS OF LOCAL GOVERNMENT AUTHORITIES

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම මේ යෝජනාව ගෙනෙන්න සිටියේ ගිය අවුරුද්දේ. මට හිතුනා මේකත් වරප්‍රසාද කඩ වීමක් දෝ කියලා. මම මේ යෝජනාව ඉදිරිපත් කළේ යෝජනාවක් හැටියට ගිය අවුරුද්දේ සැප්තැම්බර් මාසයේ. නැත්නම් අගෝස්තු මාසයේ. ඒ වනකොට තිබුණු පසුබිම නිර්මාණය කරගෙන තමයි මේ යෝජනාව බොහෝ දුරට නිර්මාණය වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ වන කොට දැන් තිබෙන තත්ත්වය යටතේ යම් ආකාරයක සහනදායි පිළිවෙතක් අනුගමනය වෙලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, මම ඔබතුමාගෙන් ඉල්ලනවා යෝජනාව ඉදිරිපත් කරන ලෙසට.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

*ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, "ප්‍රාදේශීය සභා, නගර සභා හා මහ නගර සභාවන් නියෝජනය කරන සභිකයන්ගෙන් සිදු වන දේශපාලනික, සමාජමය මෙහෙවර ඉමහත්ය. ශ්‍රී ලාංකික දේශපාලන මන්ත්‍රී පද්ධතිය තුළ ප්‍රාථමික මට්ටමේ සිටින මොවුන්ගෙන් සිදු වන උක්ත සේවාව අතිශයින් ඉහළය.*

*ඇතැම් සභිකයන් තම ජීවිත කාලයම මෙම සමාජ මෙහෙවරේ නියැලෙයි. බහුතරයක් සභිකයන්ට නිසි ආදායම් මාර්ගයක් ද නැත. සමාජමය කටයුතුවල පූර්ණ කාලීනව නියැලීමට සිදු වන නිසා ඔවුන්ට රැකියාවක නිරත වීමට ද අපහසු වී ඇත.*

*පළාත් පාලන සභිකයෙකුට ලැබෙන්නේ කිසිසේත් ප්‍රමාණවත් නොවන සුළු දීමනාවකි. එය ඔවුන්ගේ දෛනික යැපීම් කටයුත්තකටවත් සෑහෙන්නේ නැත. මෙම කරුණු සැලකිල්ලට ගෙන ඔවුන්ගේ මාසික දීමනාව ඉහළ නංවා, සමාජ කටයුතුවල පූර්ණ කාලීනව නියැලෙන ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට මෙම පළාත් සභාව මඟින් ද මැදිහත් වී කටයුතු කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව යෝජනා කරයි."*

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාට විනාඩි 08 ක කාලයක් ලබා දෙනවා.

[අ.භා. 12.55]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා විශ්වාස කරන්නේ රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමාත් මේ දේශපාලනයේදී පළාත් පාලන ආයතනයක මන්ත්‍රීවරයෙක් හැටියට කටයුතු කරමින් ඒ අත්දැකීම් ලබමින් තමයි අද පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු හැටියට මේ යෝජනාව ගෙනෙන්නේ. අපි පවා. මට මතකයි, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් හැටියට

කැස්බෑව ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙකුට හැටියට තමයි මම පවා පළමුවෙන්ම මහජන නියෝජිතයෙක් හැටියට, කටයුතු කරන්න පළමු අඩිතාලම දාන්නේ. ඒ නිසා අපි දන්නවා, ඇත්තටම මේ පරිපාලන ව්‍යුහය ඇතුළේ මහජනතාවට යමක් කරන්න, මහජනතාවගේ ගැටලුවලට විසඳුම් ලබා දීම සඳහා පහළම තිබෙන ඒකකය තමයි මේ පළාත් පාලන ආයතනය. ඒ නිසා මේ පළාත් පාලන ආයතනය කියලා කියන්නේ ඇත්තටම ඒ මහජන නියෝජිතයා මහජනතාවත් එක්ක ලොකු සමීප සම්බන්ධයක් තිබෙනවා. මොකද, ඔහුව සොයාගෙන ඒමේ උවමනාවක් ඇති වෙනවා. නමුත් මේ පළාත් සභා කියලා කියන්නේ ඊට වඩා වෙනස් තත්ත්වයක්. පළාත් සභාව කියලා කියන්නේ, අපේ රටේ මේ පාලන ව්‍යුහය ඇතුළේ තිබුණු ව්‍යුහයක් නොවෙයි. ඒක 1987 ඉන්දු - ලංකා ගිවිසුමත් එක්ක කඩන් පාත් වුණු ව්‍යුහයක්. ඒක අපි කවුරුත් පිළිගන්න ඕනෑ. මම හිතන්නේ මෙතැන ඉන්න මන්ත්‍රීවරුන්ට මේ අත්දැකීම ඇති. තමන්ව මහජනතාවට ඕනෑ වෙන්නේ හරිම අඩුවෙන්. ඇත්තටම මේ මහජන නියෝජිතයෙක්, පළාත් සභාවක් තිබෙනවාය කියන හැඟීම ජනතාවට එන්නේම මේ පළාත් සභාවේ තිබෙන පාසල්වලට ළමයින්ව දාගන්න තිබෙන ප්‍රශ්නයත් එක්කමයි. ඇත්තටම ඒ අවස්ථාවේදී තමයි පළාත් සභා මතක් වෙන්නේ. පළාත් සභා මන්ත්‍රීවරයෙක් ගැන මතක් වෙන්නේ. එහෙම නැතිව පළාත් සභා මන්ත්‍රීවරයෙක් ඇත්තටම ඕනෑ වෙන්න තියෙන ඉඩ කඩ අඩුයි. නමුත් පළාත් පාලන ආයතනය කියලා කියන්නේ එහෙම නොවෙයි.

ඇත්තටම මවකගේ කුසේ මිනිස් කළලයක් බිහි වීමේ සිට ඒ මිනිස් කළලයේ සිට මරණය දක්වා, සොහොන දක්වා කටයුතුවලට පළාත් පාලන ආයතන සම්බන්ධයි. ඒක නිසා එහි මහජන නියෝජිතයාගේ කාර්යභාරය අතිමහත්. ඒ නිසා තමයි ඇත්තටම අපි කියන්නේ, මෙන්න මේ පළාත් පාලන ආයතනවල ඒ හැකියාවන් තවදුරටත් ශක්තිමත් කරන එක මේ රටේ වෙන්න ඕනෑ. ඇත්තටම දැන් තමුන්නාන්සේලා කල්පනා කරන්න පුළුවන් මේකේ ඉඳගෙන මේකට ගරහන එක ගැන. එහෙම එකක් නොවෙයි. ඇත්තටම මම නම් කියන්නේමේ පළාත් සභා ආයතනය විසුරුවා හැරියට කමක් නැහැ. අපේ මන්ත්‍රී ධුර නැති වුණාට කමක් නැහැ, පළාත් පාලන ආයතනය ශක්තිමත් කරලා. එතැනට මේකේ තිබෙන කටයුතුත් කිසියම් ප්‍රමාණයකින් බද්ධ කරලා කරන්න පුළුවන්. මධ්‍යම ආණ්ඩුවක් තිබෙනවා. මධ්‍යම ආණ්ඩුවෙන් කරන්න පුළුවන්. කලින් මේ රටේ මධ්‍යම ආණ්ඩුවෙන් කරපු විෂයයන් ටික තමයි පළාත් සභාවේ යම් කොටසකට ඇදලා තිබෙන්නේ. ඒ නිසා මධ්‍යම ආණ්ඩුවෙන් මේ කටයුත්ත කරන්න පුළුවන්. ඉතින් ඒක නිසා ඇත්තටම මේ යෝජනාව විශේෂයෙන්ම වැදගත්.

අපි දන්නවා, අපි ගම් සභා ක්‍රමය ඇතුළේ ගම් සභා තිබෙන වේලාවේ, ඒ ගම් සභාවල කටයුතු කරන වේලාවේ ඒවායේ ඉන්න මහජන නියෝජිතයන් ඇත්තටම ඒ කාර්ය භාරය කළේ වැටුපක් ගැන හිතලා නොවෙයි. ඉතින් එතැන කිසියම් ආකාරයක කටයුතු කරපු ඉතිහාසයේ මහජන නියෝජිතයන් තමන්ගේ පැත්තෙන් කැපවීමක් කරලා තමයි තිබෙන්නේ. මා විශ්වාස කරන්නේ අන්න ඒ කැප කිරීම තමයි අද මේ පළාත් පාලන ආයතනවල ඉන්න මහජන නියෝජිතයින්ටත් කරන්න තිබෙන්නේ. ඇත්තටම මේ වැටුප් පිළිබඳ ප්‍රශ්නය කථා කිරීමේදී අපට මේක එච්චරම අදාළ තත්ත්වයක් නොවෙයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අපේ පක්ෂයේ සංස්කෘතිය ඇතුළේ. අපේ පක්ෂයේ අපි දකින අපේ සංස්කෘතිය අනික් අයට ඒ ආකාරයෙන් ඉෂ්ට කරන්න පුළුවන් කියන විශ්වාසය අපට නැහැ. එහෙම තැනක නැහැ. නමුත් මේක අපට අදාළ නැහැ. අපේ මහජන නියෝජිතයාට අදාළ නැහැ. අපේ මේ වැඩ කටයුතු කරන මහජන නියෝජිතයා පළාත් පාලන ආයතනයේ නැත්නම්, ඒ පළාත් පාලන ආයතනයේ කටයුතු කරන්නේ නැත්නම් ඔහු මේ කරන්න ඕනෑ කටයුතු වෙන ව්‍යුහයකින් කරනවා. ඒකත් වැටුප් නොලබා කරන්නේ. ඒ නිසා අපේ පක්ෂයේ නියෝජිතයාට ඒක අදාළ නැහැ. ඉතින් මම කියන්නේ නැහැ, අනිකුත් පක්ෂවලට ඒක කරන්න පුළුවන් කියලා. ඒ නිසා එතුමා ගෙන එන යෝජනාව ඇතුළේ තිබෙන්නේ ඇත්තටම ඒ පක්ෂවල ඉන්න මහජන නියෝජිතයින් මේ සොච්චම් වැටුපක් යටතේ - මම හිතන්නේ ඒක වැටුපක් කියලා නොවෙයි හඳුන්වන්නේ, දීමනාවක් කියලා. අපි ඒකත් හඳුන්වන්නේ අපට වැටුපක් කියලා නොවෙයි. දීමනාවක් කියලා. ඒ දීමනාව ඔහුට මේ තිබෙන මේ සමාජය තුළ වැඩ කටයුතු කරන්න ප්‍රමාණවත් නැහැ. ඒක අපි පිළිගන්න ඕනෑ. ඒක යථාර්ථයක්. ඒ නිසා ඒකේ වැටුප් ප්‍රමාණය කිසියම් ප්‍රමාණයකින් වැඩි වෙනවා නම් ඒකට අපේ එකඟතාවය තිබෙනවා. ඒකේ කිසි ගැටලුවක් නැහැ. අවංකව ඒක කියන්නේ. ඒක අපට අදාළ නැහැ. නමුත් මහජන නියෝජිතයා කරන කාර්යභාරයට ඒක පිටුබලයක් බවට

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි]

පත් වෙනවා නම් ඒකට අපේ විරුද්ධත්වයක් නැහැ. ඒක එහෙම වෙනවා.

ඇත්තටම වැටුප වැඩි වෙනවා කියලා කියන්නේ අපේ නියෝජිතයාගේ වැටුපත් වැඩි වෙනවා. අපේ පක්ෂයේ අරමුදලේ ප්‍රමාණය වැඩි වෙනවා. ඒක ඉබේට වෙන දෙයක්. ඉතින් ඒක නිසා ඒ සම්බන්ධව ගැටලුවක් නැහැ. අපි විශ්වාස කරනවා, ඊටත් වඩා මේකේ වැදගත් දෙයක් වෙනවා. ඒ පළාත් පාලන ආයතන නියෝජිතයාගේ කාර්ය භාරය මීටත් වඩා හොඳින් ඉෂ්ට කර දීම සඳහා ඔහුට තිබෙන්න ඕනෑ පහසුකම් ටික සලසන එක. ඒකට අවශ්‍ය ඉඩකඩ සලසන එක. අපි දන්නවා, බොහෝ පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරයාට -අඩුම ගණනේ පළාත් සභාවේ නම් අපට විමධ්‍යගත මුදලක්, ඒ කියන්නේ උපමාන පාදක මුදලක් වෙන් වෙනවා. නමුත් සමහර ආයතනවලට ඒ මහජන නියෝජිතයාට කරන්න කිසියම් හෝ මුදලක් වෙන් වන්නේ නැහැ. සභාපතිවරයාට අභිමතය පරිදි කටයුතු කිරීමේ ඉඩකඩක් තමයි ඒක තුළ තවමත් තිබෙන්නේ. ඒ නිසා අන්න ඒ නියෝජිතයාට ඒ තමන්ගේ ප්‍රදේශයට, තමන්ගේ පළාත් පාලන බල ප්‍රදේශයට ඒ වැඩ කටයුතු කරන්න ඔහුගේ ඒ පැත්තෙන් තිබෙන ශක්තිමත් භාවය තමයි මෙහිදී වැඩි කරන්න ඕනෑ. ඔහුගේ දීමනාව කිසියම් ප්‍රමාණයකින් වැඩි කරලා දෙනවා නම් ඒක හොඳයි. ඒ වාගේම ඔහුගේ කාර්ය භාරය කිරීම සඳහා අවශ්‍ය වටපිටාව සකස් කරන එකත් මේකේ කටයුත්තක් හැටියට කළ යුතු යැයි අපේ පැත්තෙන් මේ යෝජනාවට එකතුවක් කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ස්තුතියි.

[අ.භා. 01.02]

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාලය ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමාට අපි බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, මෙම මාතෘකාව ගෙන ඒම ගැන. අද ලංකාවේ ගත්තොත් දේශපාලඥයන් අතර ප්‍රාදේශීය දේශපාලනය කරන දේශපාලඥයන්ගෙන් මේ රටට විශාල සේවයක් වෙනවා. ගමක් ගත්තොත් එහෙම ගමක සංවර්ධන නිලධාරීන්, ග්‍රාම නිලධාරීන්, සමෘද්ධි නිලධාරීන් ඒ වාගේම නිලධාරීන් කිහිප දෙනෙක් සිටියත් මේ සියලු දෙනාගෙන් කෙරෙන සේවය අධීක්ෂණය කරන්න සහ මිනිස්සුන්ගේ ඡන්දයෙන් එන ප්‍රාදේශීය මන්ත්‍රීවරුන්ගෙන් විශාල වගකීමක් සහ විශාල වැඩ කොටසක් සමාජය වෙත සිදු වෙනවා. එතකොට ඔවුන්ගෙන් වැඩ ගැනීම රජයේ ප්‍රධාන නිලධාරීන් සහ මධ්‍යම ආණ්ඩුවෙන්, ඒ වාගේම පළාත් සභාවෙන් වෙන්න ඕනෑ දෙයක්. ඒක ගන්න නම් ඒ අයගේ අවශ්‍යතාවයන් සපුරන්න ඕනෑ. මොකද, පඩියකට වැඩ කරන නිලධාරීන් අවුරුදු 22 ක් යන තුරු පැන්ෂන් යන්න ඉන්නවා. ඒ අයට දෙයක් නැති වෙන්නේ නැහැ. නමුත් ප්‍රාදේශීය මන්ත්‍රී කෙනෙකුගේ අවුරුදු 04 කින් හෝ අවුරුදු 05 කින් අනිවාර්යයෙන්ම මන්ත්‍රීකම නැති වෙනවා. ඒ නිසා ඒ අය අනිවාර්යයෙන්ම සේවය හරියට කරනවා. මොකද, අද හැම තැනම මහජන නියෝජිතයින්ගෙන් විශාල සේවයක් සිදු වෙනවා. අද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගියත් අපි දන්න තරමට මහජනතාවිශාල රස්තියාදු වීමක් ව වෙනවා. නමුත් මේ හැම තැනකම මැදිහත් වෙන්නේ ඒ මහජන නියෝජිතයන්. මොකද, මේ අය කෙසේ වෙතත් දන්නවා, ඉදිරි මැතිවරණයකට ඉදිරිපත් වෙන්න ඕනෑ නිසා මේ අයගේ කාර්ය භාරය හරියටම ඉෂ්ට කරන්න ඕනෑ බව. ඉතින් රජයක් විධියට මේ අයව ශක්තිමත් කිරීම රජයට වගකීමක් තිබෙනවා. මොකද, අපි හැම කෙනෙක්ම ඡන්දයකට එන්නේ විශාල කැපවීමක් කරලා. අම්මාගේ අප්පාගේ බූදලයෙන් එන අය ඉතාමත් අඩුයි. නමුත් බිම් මට්ටමෙන් වැඩ කරලා, මිනිස්සුත් එක්ක ඉඳලා තමයි ඒ අය එන්නේ. ඒ නිසා මහජන නියෝජිතයින් විධියට සමාජයේ ප්‍රශ්න හඳුනනවා. මේ අයගෙන් මීටත් වැඩිය දැන් කරන කාර්ය භාරයට වැඩිය වැඩක් ගන්න පුළුවන් වෙනවා, මේ අයගේ ප්‍රධාන අවශ්‍යතාවයන් - පඩියද? ඒ වාගේ තවත් අවශ්‍යතාවයන් ඉෂ්ට කරලා දීලා මේ අයව නිසි විධියට ඒ අධීක්ෂණ කම්වලට සම්බන්ධ කරනවා නම් මම හිතන්නේ අපේ රටේ විශාල හොරකම් ප්‍රමාණයකුත් අඩු වෙනවා.

අද විශේෂයෙන්ම මාධ්‍ය ගත්තොත් එහෙම දේශපාලඥයාගේ ගෞරවය නැති කරලා තිබෙනවා. ඒ දේශපාලඥයන් නොවෙයි මෙතැන ගෞරවය නැති වන විශාල වැඩ කොටසක් කරන්නේ. විශාල නිලධාරීන් පිරිසක් මඟිනුත් මේ ගෞරවය නැති වන විධියට දේශපාලඥයින්ගේ වැඩ සිද්ධ වෙනවා. ඒ නිසා අපි යෝජනා කරනවා, ප්‍රාදේශීය මන්ත්‍රීවරුන්ව ශක්තිමත් කරලා, ඒ අයගේ දීමනා මීට වැඩිය වැඩි කරලා , මේ අධීක්ෂණ තනතුරුවලට පත් කරලා මීට වැඩිය වැඩ කොටසක් මේ ප්‍රාදේශීය මන්ත්‍රීවරුන් ගම් මට්ටමින් ලබා ගන්න.

මොකද, මේ ප්‍රාදේශීය මට්ටමේ ඉන්න මන්ත්‍රීවරුන් තමයි මිනිස්සුත් එක්ක හැම දෙයකටම ඉන්නේ. හැම දෙයකටම යන්නේ. මධ්‍යම ආණ්ඩුවෙන් හරි, පළාත් සභා ආණ්ඩුවෙන් හරි වැඩක් වැඩිපුරම ගන්නේ මේ ප්‍රාදේශීය මන්ත්‍රීවරුන්. ඉතින් මේ අයව ශක්තිමත් කිරීම හැම කෙනෙකුගේම වගකීමක්. ඒ තුළින් මම හිතන්නේ හොරකම් ආදී මීට වැඩිය ගොඩක් දේවල් අඩු වෙනවා, අපේ ප්‍රාදේශීය මන්ත්‍රීවරුන් ශක්තිමත් කරලා අධීක්ෂණකම්වලට මොනවා හරිවලට දාලා පත් කරනවා නම්, වගකීමකින් ඒ අය වැඩ කටයුතු කරයි. මම හිතන්නේ මීට වැඩිය සංවර්ධනයක් වෙයි. මොකද, ඇත්තම කියනවා නම් අපේ ගමක් ගත්තොත් ගමක සංවර්ධනය කරන්න කී දෙනෙක් ඉන්නවාද? ගමක පොලීසිය ඉන්නවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තිබෙනවා. ඒත් මිනිස්සු එන්නේ අපිව සොයාගෙන. මොකද, අපට ඡන්දය දීලා අපි ගැන යම් වගකීමක්, විශ්වාසයක් මිනිස්සුන්ට තිබෙන නිසා. ඒ වගකීම, විශ්වාසය හරියටම ඉෂ්ට කරන්න නම් මීට වැඩිය මම හිතන්නේ යම් බලයක් සහ යම් ප්‍රතිපාදනයක් දීලා ඒ අයව ශක්තිමත් කිරීම රජයට වගකීමක් තිබෙනවා කියන එක. ඒ වාගේම පළාත් සභාවටත් එහෙම තිබෙනවා කියලා අපි යෝජනා කරනවා. ප්‍රාදේශීය මන්ත්‍රීවරුන්ව ශක්තිමත් කරන්න කියන ඉල්ලීම අපි ඉල්ලා සිටිනවා.

[අ.භා. 01.07]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව මම හිතන්නේ, මේ සභාවේ මීට පෙරත් මෙවැනි යෝජනා දෙකක් ගෙනැල්ලා අපි සම්මත කරලා පසුගිය මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලය තුළ ඒ දීමනාවල් වැඩි කරන්න මම හිතන්නේ, ප්‍රසන්න රණතුංග අපේ හිටපු ගරු මහ ඇමැතිතුමා අපේ මේ යෝජනාවට අනුව වැඩි කරලා සැහෙන ප්‍රමාණයකින් ඒ දීමනාව වැඩි වුණා. එහෙත් ඒක වැඩි වුණාට මීට වඩා වැඩි වෙන්න ඕනෑය කියන එක තමයි අපේ විශ්වාසය. එතුමන්ලාගේ පමණක් නොවෙයි. සියලුම මහජන නියෝජිතයින්ගේ දීමනා හෝ වැටුප් හෝ මොනවා හරි, කියන භාෂාව මම දන්නේ නැහැ. අපි කියන්නේ අර කිව්වා වාගේ දීමනා කියලා. මේවා වැඩි වෙන්න ඕනෑ. මොකද, අද බහුතරයක් මහජන නියෝජිතයින් මම හිතන්නේ 75% ක් විතර මේ මහජන නියෝජිතයින් හැටියට ඡන්දවලට ඉදිරිපත් වෙන්නේ සල්ලි හම්බ කරන්න. මම මේක මීට පෙරත් කියලා තිබෙනවා. මම ලැජ්ජා නැතිව කියනවා. ඒක නිසා මේ ක්‍රමය වෙනස් කරන්න නම් මේ මහජනතාව නියෝජනය කරන මේ නියෝජිතයන්ට ජීවත් වෙන්න පුළුවන් සාධාරණ ක්‍රමයක් තිබෙන්න ඕනෑ. දැන් පොලීසියට වෙලා තිබෙන්නෙත් මේකයි. පොලීසිය හොරකම් කරන්නේ, එහෙන් මෙහෙන් බයිසිකලයක් නවත්තපුවාව, කාර් එකක් නවත්තපුවාම කීයක් හරි අතට ගන්නේ මේ අයට ජීවත් වෙන්න විධියක් නැහැ. මේ දෙන වැටුපෙන්, මේ දෙන දීමනාවෙන් ජීවත් වෙන්න බැහැ. ඉතින් මහජන නියෝජිතයෙක් හැටියට තමන්ගේ ගරුත්වය ආරක්ෂා කරගන්න ඕනෑ. අර කිව්වා වාගේ මළ ගෙදරකට ගියාම, මගුල් ගෙදරකට ගියාම මිනිස්සු නිකන් එන එක විතරක් නොවෙයි බලාපොරොත්තු වෙන්නේ. ආරාධනයක් කරලා, අඩුම ගණනේ රුපියල් 5000/- ක් වත් දෙයි කියලා ජනතාවගේ බලාපොරොත්තුව තිබෙනවා. ඉතින් මේ වාගේ දෙන්න නම් එක්කෝ මේ අය හොරකම් කරන්න ඕනෑ. නැත්නම් මේ අයට ඒ සාධාරණ වැටුප් ක්‍රමයක් තිබෙන්න ඕනෑ. ඉතින් මේක නැතිව මේ තිබෙන හොරකම්, දූෂණ, වංචා නැති කරන්න බැහැ.

අපි ඇත්ත කථා කළොත් අද ඇත්තටම ඔය ලැබෙන ප්‍රතිපාදනවලින් පාරක් හැදුවොත්, ඒ කොන්ත්‍රාත් එක අරන් කරන්නේ බහුතරයක් මේ මන්ත්‍රීවරු. ඒක තමයි ඇත්ත කථාව. ඒකෙනුත් කීයක් හරි, 10% ක් හරි - අපි ගිය පාර ආණ්ඩුව තිබෙන වේලාවේ කිව්වා නේ. පහතින් පටන් ගත්තාම උඩට යන කොට 40% ක් එක එක්කෙනාගේ සාක්කුවලට ගිහිල්ලා කියලා. මේක ඇත්ත කථාව. හංගන්න දෙයක් නැහැ. මේක නැති කරන්න නම් මේ අයට ජීවත් වෙන්න ක්‍රමයක් තිබෙන්න ඕනෑ. දැන් ප්‍රාදේශීය සභා, නගර සභා, පළාත් පාලන ආයතන කියලා අපි ඉස්සර ගත්තේ මහජන සේවයක් කියලා කියනවා. හැබැයි, දැන් ඇත්තටම මේක සේවයක් නොවෙයි. දැන් මේක මේ ඡන්ද ක්‍රමයත් එක්ක ඉදිරියට ගිහිල්ලා, මේක තරගයක් බවට පත් වෙලා තිබෙනවා. තරගය ජයග්‍රහණය කරන්න නම් අද ලොකු ලොකු සල්ලිකාරයන් එක්ක හැප්පෙන්න වෙලා තිබෙනවා. ඉතින් ණය කාරයෝ වෙනවා. ඉතින් මේක උපයා ගන්න ක්‍රම සමහරු සොයා ගන්නවා. ඉතින් මේ ජනතාවට ලැබෙන්න තිබෙන මුදල්, ජනතාවගේ සංවර්ධනයට යන්න තිබෙන මුදල් මේ අයුරින් එක එක අයගේ සාක්කුවලට යන එක නවත්වන්න නම් මම හිතන්නේ, මම විශ්වාස කරන විධියට මේ මහජන නියෝජිතයින් කියන අයට, මේ රටේ පොලීසියට, මේ රටේ

[ගරු ශ්‍රීනාත් පෙරේරා]

දූෂණ වංචා කරන ආයතනවල ඉන්න අයට ජීවත් වෙන්න පුළුවන් වැටුපක්, ජීවත් වෙන්න පුළුවන් දීමනාවක් ලබා දෙන්න ඕනෑ. එහෙම නැත්නම් හැමදාම මේ රටවල්, අපේ රට මේ වාගේ රටවල්, අපි ගත්තාම ආසියාවේ තිබෙන අපේ රට වාගේ රටවල්, මේ සියලුම රටවල්වල තිබෙන දේවල් මේවා. මේවා නැති කරන්න නම් අලුත් ක්‍රමයක් තිබෙන්න ඕනෑ. මම හිතන්නේ යහපාලන ආණ්ඩුවක් කියලා පටන් ගත්තාට අපි දන්නවා, යහපාලන ආණ්ඩුවෙත් හොරකම් කරපු ඕනෑ තරම් ලොකු ලොකු ඇමැතිවරු ඉන්නවා. නමුත් ඒවා දැන් ඔක්කෝම වැහිලා තිබෙන්නේ. හැබැයි, ඉලක්ක වෙන්නේ අර යහපාලනයට සම්බන්ධ නොවුණු අය ගැන තමයි අද කථා කරන්නේ. ඉතින් ඒවා ඇද්දත් ඒවා මාධ්‍යවල යන්නෙත් නැහැ. මම මේ පළාත් සභාවේත් ඕනෑ තරම් කියලා තිබෙනවා. දෙතුන් පාරක්ම. ඒ අයගේ නමවත් ගියේ නැහැ. ඒ අය ගැන ප්‍රවෘත්තියක්වත් ගියේ නැහැ. මේක තමයි ඇත්ත කථාව. යථාර්ථය මේකයි. නමුත් අපි වෙනසක් කරන්න නම් මේ වෙනස හරියට කරන්න ඕනෑ. මේ වෙනස නිකන් දේශපාලන වාසි බලාගෙන කරන වෙනසක් නොවෙයි, අපි බලාපොරොත්තු වුණේ. ජනතාව බලාපොරොත්තු වුණේ.

ජනතාව බලාපොරොත්තු වුණු වෙනස කරන්න අපට පළාත් පාලන මැතිවරණයක් ළඟදී එනවා. ලබන වසරේ එනවා. ඉතින් මේ පළාත් පාලන මැතිවරණයක් එන්න ඉස්සෙල්ලා මම හිතන්නේ, අපි ජනාවගෙනුත් ඉල්ලා සිටින්නේ, ගිය පාර පාර්ලිමේන්තු මැතිවරණයේදීත් මම කිව්වා. ජනතාවට මීට වැඩිය අවබෝධයක් තිබෙන්න ඕනෑ, කාටද ඡන්දය දෙන්නේ කියලා. කාටද මනාපයක් දෙන්නේ කියලා. අපි පක්ෂවලින් හොරුන්ව ඉදිරිපත් කරනවා නම්. හොරකම් කරපු අයව. පක්ෂවල වගකීමක් තිබෙනවා, මේ අයව ඉදිරිපත් නොකර හොඳ පිරිසක් ඉදිරිපත් කරන්න. ඉතින් මේක තමයි පක්ෂවල තිබෙන වගකීම. පක්ෂ නායකයින්ගේ තිබෙන වගකීම. පක්ෂ නායකයොත් දැන ගන්න ඕනෑ, තමන්ට සහයෝගය දුන්නායි කියලා හොරුන්ව සාක්කුවේ දාගෙන ඉන්නේ නැතිව හොඳ පිරිසක් ඉදිරිපත් කරන්න. දැන් මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාටත් වුණේ ඔන්න ඔය ටිකම තමයි. ඒ හොරු ටිකම ගිහිල්ලා තමයි අද එතුමාට විරුද්ධව සාක්ෂි දෙන්නේ. කථා කරන්නේ. මේ ඔක්කෝම කරන්නේ ඒ හොරු ටික. මොකද, ඒ අයගේ හොරකම් ටික වහ ගන්න අද ඒ අය සාක්ෂි දෙන්න ඉදිරිපත් වෙනවා. ඉතින් මේක තමයි ඇත්ත කථාව. ඉතින් මේකද අපි යහපාලනයකින් බලාපොරොත්තු වුණේ? මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති කරලා අපි බලාපොරොත්තු වුණේ, එහෙම නැත්නම් යහපාලන ආණ්ඩුවක් කියලා අපි බලාපොරොත්තු වෙන්නේ මේ හොරුන් කොටසක් ආරක්ෂා කරලා, තවත් කොටසකට විරුද්ධව සාක්ෂි දීලා තීන්දු දෙන්න ක්‍රියා කරන එකද? අපි බලාපොරොත්තු වෙන්නේ ඒකද කියන ප්‍රශ්නය අපට තිබෙන්නේ. ඉතින් ඒක නිසා මේ -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

හොරුන්ව එලවන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

හොරුන්ව එළවන්න අවස්ථාව තිබෙනවා. ඔබතුමන්ලා හොරුන්ව රැක්කා. අවාසනාවකට මේ රජයත් හොරුන්ව රකින රජයක් බවට පත් වෙලා තිබෙනවා. ඕක තමයි ඇත්ත කථාව. ඉතින් තමන් රැකෙන්න නම් -

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

අපි හොරු ටික ඔබතුමන්ලාට දුන්නා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඔබතුමන්ලා නේ හොරුන්ට ඇමැතිකම් දීලා තියාගෙන ඉන්නේ. අගැමැතිතුමාට කියන්න එළවන්න කියලා. හොරුන්ව තියා ගන්න එපා කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමාගේ ජනාධිපතිතුමා එද්දී කියන්න තිබුණා නේ හොරුන්ව එළවන්න කියලා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මගේ ජනාධිපතිවරයෙක් නැහැ. අගමැතිවරයෙක් නැහැ. ඔබතුමන්ලා පත් කර ගත්තේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඉස්සෙල්ලා එක්කෙනා ඉද්දී. ඉස්සෙල්ලා එක්කෙනාත් රැක්කේ ඔබතුමන්ලා නේ. පොඩ්ඩක් කියන දේ අහ ගන්න කෝ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, බාධා කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

බාධා කරන්නේ නැතිව පොඩ්ඩක් අහ ගන්න කෝ.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ඉස්සෙල්ලා එක්කෙනා ළඟ හිටපු හොරු ටික ඔබතුමන්ලාට දුන්නා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා අවසන් කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තමුන්නාන්සේලාගේ පක්ෂයේ නායකතුමා, වර්තමාන ජනාධිපතිතුමාට කියන්න හොරුන්ව අල්ලන්න කියලා. වර්තමාන ජනාධිපතිතුමාත් එක්ක තමයි හොරු ටික ඉන්නේ තවම.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා, මූලාසනයට කථා කරන්න. ගරු මන්ත්‍රීතුමා බාධා කරන්න එපා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

යහපාලනය මොකක්ද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම යහපාලනය ගැන කිව්වා නේ. ආයේ කථා කරන්න ඕනෑ නැහැ. මේ පළාත් පාලන නියෝජිතයින්ව දූෂකයින් බවට පත් කරලා තිබෙන්නේ, හොරුන් බවට පත් කරලා තිබෙන්නේ මේ වර්තමාන ඡන්ද ක්‍රමය. දැන් මේ ඡන්ද ක්‍රමය පිළිබඳවත් අපි යෝජනාවක් මේ පළාත් සභාවේ ගෙනාවා. ඒක සම්මත කර ගත්තා. පාර්ලිමේන්තුවේත් මේ යෝජනාව ගෙනැල්ලා සම්මත කර ගත්තා. නමුත් ඒක වුණේ නැහැ. දැන් නැවත වරක් අපි යන්නේ, මම දන්නේ නැහැ. කොහොම වෙයිද කියලා. මම බලාපොරොත්තු වෙනවා. විශ්වාස කරනවා. අලුත් කොට්ඨාශ ක්‍රමයට මේ පළාත් පාලන මැතිවරණය එයි කියලා. එහෙම ආවොත් මේ වන හොරකම්, දූෂණ, වංචාවලින් ප්‍රමාණයක් අඩු වෙනවා. මොකද, ඒ ප්‍රාදේශයේ, ඒ කොට්ඨාශයේ ජනතාවට වග කියන කෙනෙක් බවට පත් වෙනවා. කොට්ඨාශයේ ජනතාව බලාගෙන ඉන්නවා. ඉතින් ඒක නිසා මේ මනාප ක්‍රමය නිසා තමන් ජීවත් වන ගමේ වුණත් ඕනෑ හොරකමක් කරලා, ජඩ කමක් කරලා, ඕනෑ දෙයක් කරලා වෙන තැනකින් ගිහිල්ලා මනාපයක් ගන්න පුළුවන්. නමුත් දැන් අපි බලාපොරොත්තු වෙන්නේ, ජනතාව බලාපොරොත්තු වෙන්නේ අලුත් ක්‍රමයයි. පළාත් පාලන මැතිවරණය ලබන අවුරුද්ද වෙද්දී ඒ අලුත් කොට්ඨාශ ක්‍රමයට එයි කියලා අපි විශ්වාස කරනවා. ඉතින් ඒ නිසා -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අගමැතිතුමා ඉල්ලන්නේ මනාප ක්‍රමය -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම ඉල්ලන්නේ කොට්ඨාශ ක්‍රමය.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා අවසන් කරන්න. කාලය ඉක්මවා ගිහිල්ලා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපි විශ්වාස කරනවා, මේ මහජන නියෝජිතයින්ට පමණක් නොවෙයි. මේ රටේ ආරක්ෂාව ලබා දෙන පොලිසියට, හමුදාවට, මේ රටේ නීති රාමුව තුළ තිබෙන සියලුම ආයතනවල නිලධාරීන්ට ජීවත් වෙන්න බැරි තත්ත්වයක් තමයි තිබෙන්නේ. ඉතින් මේ තත්ත්වයෙන් මුදා ගන්න නම් හොරකමෙන්, පගා ගහන එක නැති කරන්න නම් ජීවත් වෙන්න පුළුවන් වැටුපක්, දීමනාවක් ලබා දෙන්න ඕනෑ. ඉතින් ඒක නිසා අපි විශ්වාස කරනවා,

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න. කාලය ඉක්මවා ගිහිල්ලා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අගමැතිතුමාට ගිහිල්ලා කියලා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා ගිහිල්ලා ඔබතුමාගේ ජනාධිපතිතුමාට කියන්න කෝ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඔබතුමන්ලාගේ ජනාධිපති. ඔබතුමන්ලාගේ අගමැති.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම විශ්වාස කරනවා, පළාත් පාලන ආයතන භාරව ඉන්නේ අපේ මේ පළාත් සභාව. පළාත් සභාව තුළින් මෙය නිවැරදි කරලා මේ මහජන නියෝජිතයන්ට අඩුම ගණනේ තමන්ගේ ගෞරවය රැකගෙන ජීවත් වෙන්න පුළුවන්, පවුල ජීවත් කරවන්න පුළුවන්, ඒ වාගේම තමන් නියෝජනය කරන ජනතාව නියෝජනය කරන්න හැකි වන පරිදි ඒ අවශ්‍ය දීමනාවක් වැඩි කර ලබා දෙන්නය කියලා මම ගෞරවයෙන් ඉල්ලා සිටනවා.

[අ.භා. 01.17]

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම යෝජනාව ගෙන ඒම පිළිබඳව රොඩ්නි ෆ්‍රේසර් අපේ ගරු මන්ත්‍රීතුමාට අපි ස්තුතිවන්ත වෙනවා. ඒකත් එක්කම එතුමා කිව්වා වාගේ මේක මීට ගොඩක් ඉස්සෙල්ලා එන්න ඕනෑ යෝජනාවක්. මම හිතන්නේ කලිනුත් මේ යෝජනාව සභාවේ සම්මත වුණා. ඉතින් අපි කනගාටු වෙනවා. ඉතින් අපිත් මේ සභාවේ ඕනෑ තරම් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, යෝජනා ගෙනැල්ලා තිබෙනවා. යෝජනා ගෙනාවට අද වනතුරු එකම යෝජනාවක්, දැන් මම මේ දෙවැනි වතාව ඉන්නේ. යෝජනා බර ගණනාවක් ගෙනැල්ලා ඇති. අද වනතුරු මම දාපු එකම යෝජනාවක්වත් තවම ක්‍රියාත්මක වෙලා නැහැ. අද ඇත්තටම හරි කනගාටුදායක සිදුවීමක්. අපි ප්‍රාදේශීය සභාවල සභාපති වෙලා ඉන්න කොට මෙයිට වඩා මහ විශාල වැඩ කොටසක් කළා. පළාත් සභාවට ඇවිල්ලා අඩු ගණනේ අපි දාන යෝජනාවට මොකද වෙන්නේ කියලාවත් අපි දන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමන්ලා දාපු යෝජනාවකට පසු ගිය කාලයේ පඩි වැඩි කළා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

නැහැ, මේක නොවෙයි මම කියන්නේ. මේ යෝජනාව නොවෙයි. මේ පළාත් සභාවට යෝජනා දාන ඒවාට මෙයිට වඩා අවධානය යොමු කරන්න කියන ගෞරවණීය ඉල්ලීම මම කරනවා. ඒකත් එක්කම අපි මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට. මහින්ද රාජපක්ෂ මැතිතුමා එදා පළාත් පාලන ආයතන - මම දන්නවා. මට මතකයි. මම 1991 ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් වුණේ. එදා 1991 ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් වෙන කොට අපේ දීමනාව රු.1095/- යි. හැබැයි, අපි රුපියල් 1095/- ටත් සේවය කළා. හැබැයි, අපි

එදා කොන්ත්‍රාත් නම් කළේ නැහැ. මන්ත්‍රීකම් කරන කාලයේ. ඊට පස්සේ අපි අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඒ ජනතා නියෝජිතයින්ට - විශේෂයෙන්ම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුට රැකියාවක් කරන්න පුළුවන් කියලා කිව්වත් මන්ත්‍රීකමත් එක්ක ඒක කරගන්න බැහැ. ඒ මන්ත්‍රීවරයාට යැපෙන්න පුළුවන්, පවුලක් නඩත්තු කරගන්න පුළුවන් දීමනාවක් දෙන්න ඕනෑ. 1991 සිට අපි ප්‍රාදේශීය සභා මන්ත්‍රීකම්වල සිටියා. අපි එදා සිට කිව්වා, පළාත් පාලන ආයතනවල නියෝජිතයන්ගේ දීමනාව වැඩි කරන්න කියලා. නමුත් මේකට ඇහුම්කන් දුන්න එකම නායක යයි. ඒ මහින්ද රාජපක්ෂ මැතිතුමා විතරයි. මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇහුම්කන් දීලා, එදා මහින්ද රාජපක්ෂ මැතිතුමා අපි ඉල්ලුවාටත් වඩා වැඩියෙන් පඩිය වැඩි කළා. අපි ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුට බලාපොරොත්තු වුණේ රුපියල් 10,000/- ක් විතර. මම හිතන විධියට දැන් රුපියල් 15,000/- ක විතර දීමනාවක් හම්බ වෙනවා. අනික් දුරකථන දීමනාත්, ඒවාත් එක්ක එනකොට රුපියල් 20,000/- ක විතර දීමනාවක් හම්බ වෙනවා. පළාත් පාලන ආයතනයක සභාපති කෙනෙකුටත්, නගරාධිපතිවරයෙකුටත් - දැන් නගරාධිපතිවරයෙකුට පළාත් සභා මන්ත්‍රීට වඩා දීමනාව වැඩියි. අපට රුපියල් 27,000/- ක දීමනාව දෙන කොට මගෙ හිතේ නගර සභාවේ නගරාධිපති කෙනෙකුට රුපියල් 30,000/- කට වැඩි දීමනාවක් ගෙවනවා.

ඒ විතරක් නොවෙයි. මහින්ද රාජපක්ෂ මැතිතුමා තේරුම් ගත්තා, මේ අයට පයින් ගිහිල්ලා වැඩ කරන්න බැහැ. මට මතකයි මම ප්‍රාදේශීය සභාවේ 1991 ඉන්න කොට මම යෝජනාවක් දැම්මා. මන්ත්‍රීවරයෙකුට පා පැදියක් දෙන්න කියලා. ඒත් පා පැදියක් නොවෙයි මේ රටේ පළාත් පාලන ආයතන නියෝජිතයන්ට යතුරු පැදියක් දීපු එකම නායකයා මහින්ද රාජපක්ෂ මැතිතුමා. මහින්ද රාජපක්ෂ මැතිතුමා තරම් පළාත් පාලන මන්ත්‍රීවරු ගැන හිතපු නායකයෙක් තවත් සිටියේ නැහැ. ඒ විතරක් නොවෙයි. මේ මන්ත්‍රීතුමන්ලා කිව්වා, පළාත් පාලන මන්ත්‍රීවරුන්ට වැඩ කරන්න යම් මුදලක් දෙන්න ඕනෑය කියලා. අහලා බලන්න. එදා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු හැටියට එක මන්ත්‍රීවරයෙක් ලක්ෂ 100 කට වඩා යෝජනා ඉදිරිපත් කරලා කටයුතු කළා. මහින්ද රාජපක්ෂ මැතිතුමා ඒ විධියට තමයි කටයුතු කළේ. ඒ නිසා මම හිතනවා, තව දීමනාව වැඩි වෙනවා නම් හොඳයි. ඒකේ කිසි ගැටලුවක් නැහැ.

හැබැයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කියන්නේ එදා එක්සත් ජාතික පක්ෂයට ජනතාව ඡන්දය දුන්නේ, මේ ඇමැතිකම් 25 ට, 30 ට බස්සන්න කියලා. අද ඇමැතිකම් 100 පැනලා තිබෙනවා. ඒ නිසා අද ඇමැතිවරුන්ට කාර්යාල නැති වුණත්, ඇමැතිවරුන්ට ඒ රාජකාරියක් නැති වුණත්, ඇමැතිවරුන්ට වරප්‍රසාද දෙන ආණ්ඩුවක් වෙලා. අද ගෙදර තියාගෙන ඇමැතිවරුන්ට වරප්‍රසාද දෙන එකම ආණ්ඩුව මේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව. යහපාලන ආණ්ඩුව. තමුන්නාන්සේලා මේවාට ලැජ්ජා වෙන්න ඕනෑ. අද ඇමැතිවරයෙකුට කාර්යාලයක් නැහැ. අද ඇමැතිවරයෙක් දන්නේ නැහැ, තමන්ගේ රාජකාරිය මොකක්ද කියලා. මේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු අද ලැජ්ජා වෙන්න ඕනෑ. අද මෙහෙම බොරු කියලා තමුන්නාන්සේලා ඡන්දය අරගෙන අද මෙහෙම කරනවාට. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම නම් කියන්නේ, මේ ඇමැතිකම් අඩු කරන්න කියලා නොවෙයි. මේ ඇමැතිවරුන්ගේ වරප්‍රසාද අඩු කරන්න. ඒ වරප්‍රසාද අඩු කරලා පළාත් පාලන මන්ත්‍රීවරුන්ට මේ වරප්‍රසාද දෙන්න. එතකොට හරි. අද එක්සත් ජාතික පක්ෂයේ අය කියපුවා එකක්වත් කෙරෙන්නේ නැහැ. අද නාස්තිය වැඩියි. අද දූෂණය වැඩියි. අද හොරකම් වැඩියි. මම එක්සත් ජාතික පක්ෂයෙන් ඉල්ලනවා. ඒ හොරකම් නවත්වන්න. ඔය දූෂණය නවත්වන්න. එතකොට පළාත් පාලන මන්ත්‍රීවරුන්ට විතරක් නොවෙයි. රජයේ සේවකයන්ට පඩි වැඩි කරන්න පුළුවන්.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ඔබතුමන්ලාගේ පක්ෂයේ නායකයා ජනාධිපතිතුමාට කියන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

පඩි වැඩි කරනවා කිව්වා. ඒ එකක්වත් අද කෙරෙන්නේ නැහැ. ජනාධිපති පත් කර ගත්තේ තමුන්නාන්සේලා. අගමැති පත් කර ගත්තේ තමුන්නාන්සේලා. ඒ වාගේ අවංකව පාලනය කරපු, පළාත් පාලන මන්ත්‍රීවරු ගැන බලපු එකම නායකයයි සිටියේ. ඒ මහින්ද රාජපක්ෂ මැතිතුමා විතරයි කියන එක මම ඉතාමත් සතුටෙන් කියනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

පැරදුණු නායකයා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මම තමුන්නාන්සේලාට අභියෝග කරනවා. මහින්ද රාජපක්ෂ මැතිතුමා පළාත් පාලන මන්ත්‍රීවරුන්ට අද රුපියල් 10,000/- කට වඩා පඩි වැඩි කළා. තමුන්නාන්සේලා ආණ්ඩුව ඉවර වෙන්න ඉස්සෙල්ලා පළාත් පාලන මන්ත්‍රීවරයෙකුට එක රුපියල් 5000/- ක් වැඩි කරලා දෙන්න. 5000/- ක් වැඩි කරලා පෙන්වන්න පුළුවන් නම්, එහෙම කරලා පෙන්නුවොත් එහෙම තමුන්නාන්සේලා කියන ඕනෑම දෙයකට අපි එකඟ වෙනවා. අද බයිසිකලයක් දුන්නා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

කවද්ද දුන්නේ?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

තමුන්නාන්සේලා බොරුවට පළාත් පාලන මන්ත්‍රීවරු ගැන හැමදාම කථා කරනවා. එක රුපියලක දෙයක් තමුන්නාන්සේලා පළාත් පාලන මන්ත්‍රීවරුන්ට දුන්නාද? දුන්නේ නැහැ. දුරකථන පහසුකම් ටික දුන්නා. තමුන්නාන්සේලා දුන්නද? එක පුටු සයිකලයක් දුන්නේ නැති එක්සත් ජාතික පක්ෂය තමයි අද පළාත් පාලන මන්ත්‍රීවරු ගැන කථා කරන්නේ. තමුන්නාන්සේලා ගැන කනගාටුයි.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ප්‍රේමදාස මහත්මයා තමයි මන්ත්‍රීකම දුන්නේ. නැත්නම් සභිකයා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

තමුන්නාන්සේලා පුළුවන් නම් රුපියල් 5000/- ක් වැඩි කරලා පෙන්වන්න. දැන් තමුන්නාන්සේලාගේ ආණ්ඩුව තිබෙන්නේ. රුපියල් 5000/- ක් වැඩි කරලා පෙන්වන්න. තමුන්නාන්සේලා මොකක්ද කළේ? තමුන්නාන්සේලා කරපු එක දෙයයි තිබුණේ. තමුන්නාන්සේලා හොරුන්ට ඇමැතිකම් ටික දුන්නා. හොරුන්ට ඇමැතිකම් ටික දීලා තවත් හොරකම් කරනවා. අද තමුන්නාන්සේලා කරපුවා පේනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අද මත්තල ගුවන් තොටුපළට ගිහිල්ලා වී ටික දානවා. ඇමැතිවරයා කියන දේ තමුන්නාන්සේලා අහගෙන හිටියා නේ මත්තලට ගිහිල්ලා. ඉතින් තමුන්නාන්සේලා ඕවා නේ කළේ. තමුන්නාන්සේලා කළේ මේ රට තවත් විනාශ කරන එක. කරුණාකරලා මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටින්නේ, රජයක් කරන්න බැරි නම් තමුන්නාන්සේලා කරුණාකර ගෙදර යන්න. මේවා කරන්න පුළුවන් මිනිස්සුන්ට දීලා. එච්චරයි තමුන්නාන්සේලාට කියන්න තිබෙන්නේ. බොහොම ස්තුතියි.

[සභාවේ ඝෝෂා]

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

පුදුම අමාරුවක් නේද තිබෙන්නේ?

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ප්‍රේමදාස ජනාධිපතිතුමා පළාත් පාලන මන්ත්‍රීවරුන්ට කරපු දේවල් ලියලා දෙන්නම්. තමුන්නාන්සේ දන්න ඉටි ගෙඩිය. මමත් හිටපු සභාපතිවරයෙක්. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා දන්නවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

පුටු සයිකලයක් දුන්නාද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අනුරාධ විමලරත්න ගරු මන්ත්‍රීතුමාට විනාඩි 05 ක අවස්ථාවක් හම්බ වෙනවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

අද වර්තමාන මහ ඇමැතිතුමා ඉසුර දේවප්‍රිය මැතිතුමාගෙන් අහන්න. මහ ඇමැතිතුමාගෙන් අහන්න. රණසිංහ ජනාධිපතිතුමා ආණ්ඩුව තිබෙන කාලයේ පළාත් පාලන මන්ත්‍රීවරුන්ට දුන්නේ මොනවද කියලා. නැඟිටලා කථා කරන්න කියන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මොකුත් දුන්නේ නැහැයිලු.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

හතර පාරක් අගමැති වුණු රනිල් වික්‍රමසිංහ මොනවද කළේ? පළාත් පාලන මන්ත්‍රීවරුන්ට.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමා නොවෙයි නේ දුන්නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, කථා කරන්න

[සභාවේ ඝෝෂා]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඇහුවා. නැහැයිලු.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඔබතුමා ඒ කාලයේ පීලික්ස්ගේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]***
*[Expunged on the order of the chair]*

අස්සේ සිටියේ.

**ගරු අනුරාධ විමලරත්න**
Hon. Anuradha Vimalarathne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]***
*[Expunged on the order of the chair]*

හිටියේ ජෝන්ගේ -

[අ.භා. 01.25]

**ගරු අනුරාධ විමලරත්න**
Hon. Anuradha Vimalarathne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා මේ රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා ගෙනාපු ඉතාම වටිනා යෝජනාව පිළිබඳව කථා කිරීමට වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන. ඒ වාගේම අපේ විපක්ෂ නායකතුමාටත්, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම මම කනගාටු වෙනවා මෙතැන -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වාද විවාද ඇති වෙනවා. මෙතුමා මේ උඹ කියලා කථා කරන්නේ. කරුණාකරලා එහෙම කථා කරන්න එපා කියන්න. (බාධා කිරීම්) වගකිවයුතු මන්ත්‍රීවරයෙක්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

විනාඩියක් දෙන්න. සිරිකමල් ගරු මන්ත්‍රීතුමා කථා කළා නම් එතුමාට උත්තර දෙන්න ඕනෑ. මගේ නම කියලා ෆීලික්ස්ගේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

අස්ස ඉස්සුවා නම් එයත් ජෝන් අමරතුංගගේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

අස්ස කියලා තිබෙන්න ඕනෑ එහෙම නම්. හරි නේ? මම

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

අස්සේ නේ හිටියේ. ඔයා ඉඳලා තිබෙන්නේ ඊටත් වැඩිය තැනක. අනවශ්‍යා ඒවා කථා කරන්න එන්න එපා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකරලා වාඩි වෙන්න.

[සභාවේ සෝෂා]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

චණ්ඩිකම ඕනෑ නම් චණ්ඩිකමත් කරන්න පුළුවන්. ඇයි?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකරලා වාඩි වෙන්න. ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු අනුරාධ විමලරත්න**
Hon. Anuradha Vimalarathne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඇත්ත වශයෙන්ම කනගාටු වෙනවා, මේ ඇති වුණු සිදුවීම ගැන. මොකද, මෙතැන ඉන්නේ බොහෝ වශයෙන් ප්‍රාදේශීය සභාවකින් හෝ නගර සභාවකින් තමන්ගේ පන්නරය අර ගෙන එතැන තිබෙන වටිනකම හඳුනන මන්ත්‍රීවරු හැටියට මේ වාගේ වටිනා යෝජනාවක් ඇවිල්ලා තිබෙන වෙලාවක, වෙන වෙන හේතු ඇදගෙන, මේක වෙන කරුණක් කර ගෙන මේ ඇති වුණු තත්ත්වය ගැන මම කනගාටු වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කොළඹ මහ නගර සභාව නියෝජනය කරලා පළාත් සභාව නියෝජනය කරන්න අවස්ථාව ලැබුණු මන්ත්‍රීවරයෙක් හැටියට, ඒ වාගේම මම දන්නවා මේ පළාත් සභාවේ අද මහ ඇමති ධූරයේ ඉන්නේ, ප්‍රාදේශීය සභාවක සභාපති ධූරය හොබවලා ආපු අපේ මහ ඇමතිවරයෙක් ඉන්නේ. ඉතින් මම හිතන්නේ, මේ යෝජනාව එතුමා ඉස්සරහා කථා කරන්න අපි අවස්ථාවක් ගන්න ඕනෑ. අපේ පෞද්ගලික ප්‍රශ්නවත් එක එක්කෙනාට මඩ ගහන එකවත් නවත්වලා මේ යෝජනාව කථා කරලා මම විශ්වාස කරනවා, මේ සභාවෙන් අපට පුළුවන්කමක් තියෙයි කියලා මේ යෝජනාව ක්‍රියාත්මක කරන්න. වෙන ඒවා නැති වුණත්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ -

# රීති අංක 30 යටතේ යෝජනාව
MOTION UNDER RULE NO : 30

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"මේ විවාදය අවසන් වන තුරු සභාවේ කාලය දීර්ඝ කරන ලෙස"* යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු අනුරාධ විමලරත්න**
Hon. Anuradha Vimalarathne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දන්නවා ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, ප්‍රාදේශීය සභා, නගර සභා මන්ත්‍රීවරයෙක් උපතේ ඉඳන් විපතට යන තෙක් ජනතාව එක්ක ඉඳගෙන විශාල සේවයක් කරනවා. ඒක අපි

දන්නවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නගර සභාවේ මන්ත්‍රීවරයෙක්, එහෙම නැත්නම් අර ප්‍රේමදාස මහත්තයා සභිකයා කියන ඒ තනතුරට මන්ත්‍රීවරයා කියන ඒ ගෞරවය දෙන්න ඉස්සෙල්ලා ඔය සභිකයා කියන එක නගර සභාවක, ප්‍රාදේශීය සභාවක මන්ත්‍රීවරයෙක් කියන එක රැකියාවක් හැටියට ගැනෙන්නේ නැහැ. ඒකට දීමනාවක් ලැබෙන්නේ, ඒක රැකියාවක් නොවෙයි, ඒක තමන් කරන සේවයක් නිසා. නමුත් කොළඹ මහ නගර සභාව නිලධාරී පාලනයකට යටත් වෙලා තිබුණු අවදියේ අපට තේරුණා. අපි ඒක ඇස් දෙකට දැක්කා. ජනතා නියෝජිතයෙක් සභාවක නැති එකේ තිබෙන පාඩුව පිළිබඳව. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නගර සභා, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයකුට මාසයකට එක දවසක් සභාවට යන්නත්, ඒ වාගේම කමිටු රැස්වීම් දෙකකට සහභාගී වෙන්නත් තමයි ඒගොල්ලන්ට තිබෙන්නේ. ඒ නිසා කියලා තිබෙනවා, විශ්‍රාම ගත්, සමාජයේ වැදගත් තනතුරක් දරන, ඒ ගම පිළිගන්න පුද්ගලයෙකුට ගමේ ප්‍රශ්න ගිහිල්ලා කථා කරන්න තමයි නගර සභාව, ප්‍රාදේශීය සභාව කියන එක ඇති කරලා තිබෙන්නේ. ඒ නිසා එතුමන්ලාට දීමනාවක් විතරයි දුන්නේ. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි අද දකිනවා, නිලධාරීන්ගේ ඇතැම් ක්‍රියා හින්දා ගමක ජනතාව දුක් විඳින කොට, ඒ ප්‍රශ්නවලට මුහුණ දෙන කොට ඒ පිළිබඳව ගිහිල්ලා කථා කරන්නේ ගමේ ඉන්න මන්ත්‍රීවරයා. මොකද, ඔය ප්‍රශ්නය නගර සභාවේ ඉන්න කාලයේ මට විතරක් නොවෙයි. මම දන්නවා, ඔබතුමන්ලා සියලු දෙනාටම ඇවිල්ලා තිබෙනවා. දුප්පත් මනුස්සයෙකුගේ ගලි වලක් ඉහා ගන්න ඕනෑ වුණාම මන්ත්‍රීවරයාට ඇවිල්ලා කථා කළේ නැත්නම් ගලි වල ඉහෙන්නේ නැහැ. මොකද, රු. 3000, 4000, 5000 දෙන ගෙවල්වලට තමයි ගලි මැෂිම යන්නේ. ජනතා නියෝජිතයෙක් ගිහිල්ලා කථා කළේ නැත්නම් කාණුව සුද්ද වෙන්නේ නැහැ. දුප්පත් මනුස්සයෙකුට වරිපනම් අංකයක් හම්බ වෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නාගරික මන්ත්‍රීවරයෙක්, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් කියන එක මම ලැජ්ජා නැතිව කියනවා. මම එතැනින් ආපු හින්දා. අපට වැඩිය, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට වැඩිය ජනතාව සේවය කරන පුද්ගලයකු හැටියට අද පත් වෙලා තිබෙනවා. ඒ ක්‍රමය ඇවිල්ලා තිබෙන්නේ අපේ නිලධාරීන්ගේ, අපේ රජයේ දෙපාර්තමේන්තුවල තිබෙන දුර්වලකම් හින්දා. මනුෂ්‍යත්වය, ජනතාවගේ අවශ්‍යතාවය එතැන නියෝජනය වෙන්න තමයි මන්ත්‍රීවරයා අවශ්‍ය වෙන්නේ. අද අපි ගොඩක් වෙලාවට මම හිතන්නේ, දවසකට පැය දෙකක් තුනක්වත් වැඩ කරන්නේ නැහැ. නමුත් අපි වරප්‍රසාද ගොඩක් ගන්නවා. අපට මේක රැකියාවක් හැටියට පඩියක් හම්බ වෙනවා. නමුත් ඔබතුමන්ලාම තමන්ගේ පපුවට තට්ටු කරලා අහන්න, ගමේ ඉන්න ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයා, නගර සභා මන්ත්‍රීවරයා තරම් අපි වැඩ කරනවාද කියන එක ඔබතුමන්ලාම පොඩ්ඩක් හිතලා බලන්න. අපි ඡන්දය කාලේට -

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
**Hon. Kokila Harshani Goonawardhana**

අපේ කාර්ය අවතක්සේරුවට ලක් කරන්න එපා. ඔබතුමන්ලා ගෙවල්වල සැප ගත්තාට අපි වැඩ කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
**Mr. Deputy Chairman**

බාධා කිරීම් කරන්න එපා. ඔබතුමා මූලාසනය අමතන්න.

**ගරු අනුරාධ විමලරත්න**
**Hon. Anuradha Vimalarathne**

බොහෝ වෙලාවට අපි නගර සභා මන්ත්‍රීවරයා, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයා සොයා ගෙන යනවා. ඒගොල්ලන්ගේ ඡන්ද ටික ගන්න. (බාධා)

**ගරු ලලිත් එල්ලාවල**
**Hon. Lalith Ellawala**

කල් දාන්නේ නැතිව එහෙම නම් ඉක්මණට ඡන්දය තියන්න කෝ? ඔපමණ අවශ්‍ය නම්.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
**Hon. Kokila Harshani Goonawardhana**

ඔපමණ වැඩ කරනවා කියන තරුණයෝ මොකටද ඡන්දය කල් දාන්නේ?

**ගරු ලලිත් එල්ලාවල**
**Hon. Lalith Ellawala**

එහෙම නම් ඔබතුමා ප්‍රාදේශීය සභාවට යන්න කෝ.

**ගරු අනුරාධ විමලරත්න**
**Hon. Anuradha Vimalarathne**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම හිතන්නේ අපේ රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමාත්, මම හිතන්නේ මහරගම

[ගරු අනුරාධ විමලරත්න]

නගර සභාවේ හිටපු විපක්ෂ නායකවරයා හැටියට එතුමා ගොඩක් අඳුනන, එතුමාට තේරෙන දෙයක් මේ කියලා තිබෙන්නේ. මම හිතන්නේ, මළ ගෙවල්, මඟුල් ගෙවල්, කොටහළු මඟුල් ගෙවල් කීයකට නම් ගමේ මන්ත්‍රීවරයාට සහභාගී වෙන්න ඕනෑ වෙනවාද? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මම එක කාරණයකට එකඟ වෙනවා. මහින්ද රාජපක්ෂ මැතිතුමා ඡන්ද බලාගෙන හරි එතුමා මේ දේශපාලන ක්‍රියාවලිය කියන එක මොකක්ද කියන එක හොඳටම දන්න නිසා හෝ පඩි වැඩි කරලා දුන්නා. ඒ විතරක් නොවෙයි. මම හිතන්නේ මෝටර් බයිසිකලයකුත් ලබා දුන්නා. හොඳ කරන කොට හොඳ කියන්න ඕනෑ. ඒක හොඳයි. මොන යම් හේතුවක් නිසා හෝ ඒ පඩි ටික වැඩි කරලා දීපු එක හොඳයි. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රුපියල් පහළොස් දාහක වාගේ පඩියකින් ඒ කරන සේවය කර ගෙන යන්න බැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කොළඹ මහ නගර සභාවේ මාත් එක්ක හිටපු මන්ත්‍රීවරු මම දන්නවා. සමහර කට්ටිය කෝටිපතියෝ වෙලා ඉන්නවා. අපේ ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ හොරකම් කරන්න වෙලා තිබෙනවා. හොරු වෙලා තිබෙනවා. සල්ලි හම්බ කරන්න වෙලා තිබෙනවා. නමුත් සේවය කරන්න ආපු කට්ටියත් මම දන්නවා. මම තව දන්න මන්ත්‍රීවරු ඉන්නවා. නගර සභාවේ මන්ත්‍රී. නමුත් රෑට හොරෙන් ත්‍රීවීල් එක දුවනවා. හොරෙන් දුවන්නේ. මොකද, මන්ත්‍රීතුමා ත්‍රීවීල් එක එලවනවාය කියන්න ලැජ්ජයි. නමුත් හොරකම් කරන්න එයාට තිබෙන්නේ ඊට වැඩිය ලැජ්ජාව නිසා. මම නම් වශයෙන් කියන්න යන්නේ නැහැ. නමුත් එයාට ඊට වඩා ලැජ්ජාවක් තිබෙනවා, හොරකම් කරන්න. ඒ නිසා රෑට හොරෙන් හොරෙන් ත්‍රීවීල් එක දුවනවා. සමහර වෙලාවට කොළඹ නගර සභාවේ බෝඩරය පැනලා, ගම්පහ රෑට දුවනවා. මේක ඇත්ත ප්‍රශ්නයක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒගොල්ලන්ට රස්සාවක් කරන්න විධියක් නැහැ. ඒගොල්ලන්ට තිබෙන වැඩ රාජකාරීත් එක්ක. මේක ඉතාම වටිනා යෝජනාවක්. රු. 15,000 හොඳයි. මහින්ද රාජපක්ෂ මැතිතුමාට මම ඒකට ස්තුතිවන්ත වෙනවා. මෝටර් බයිසිකලය දීපු එකටත් ස්තුතිවන්ත වෙනවා. මම විශ්වාස කරනවා, අපේ මහ ඇමතිතුමාට මේ ගැන තිබෙන වැටහීමත් එක්ක, මේ සභාවේ මූලිකත්වයත් අරගෙන -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මහ ඇමතිතුමාට කරන්න බැහැ. ඒක රනිල් කරන්න ඕනෑ.

**ගරු අනුරාධ විමලරත්න**
Hon. Anuradha Vimalarathne

මේ සභාවේ මූලිකත්වය, නායකත්වය දීලා එතුමාට මේ අමාරුව තේරෙන නිසා, තව පොඩ්ඩක් මීට වඩා වැඩි දෙයක් මේ ජනතා නියෝජිතයන්ට ලබා දෙන්න පුළුවන් නම්, එහෙම නැත්නම් මේ ක්‍රමය දීමනාවක් ලැබෙන ක්‍රමයක් නොවෙයි. රැකියාවක් හැටියට ඒ මන්ත්‍රී ධූරය පත් කරන්න පුළුවන් නම් මීට වඩා අපට වටිනවා. මීට වැඩිය ජනතාවට වටිනා සේවයක් කරන්න පුළුවන් වෙයි. ඒ විතරක් නොවෙයි. අපි ඡන්ද කාලයට සොයා ගෙන යන ඒ ප්‍රාදේශීය සභා, ඒ නගර සභා මන්ත්‍රීවරුන්ට අපෙනුත් යුතුකමක් ඉටු කළාය කියලා අපට කියන්න පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 01.30]

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna sanjeeva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව සම්බන්ධව අපේ ගරු මන්ත්‍රීවරුන් විවිධ යෝජනා, අදහස් ඉදිරිපත් කළා. මමත් ප්‍රාදේශීය සභාවක දෙවරක් සභාපති වෙලා ඉඳලා, විපක්ෂයෙක් මන්ත්‍රීවරයෙක් වෙලා ඉඳලා ඇවිල්ලා මේ පිළිබඳව කථා කරන කොට අපි හදවතින්ම සතුටු වෙනවා. අපේ මේ මන්ත්‍රීතුමා මේ යෝජනාව ඉදිරිපත් කරලා, දීමනාව වැඩි කරන්නය කියලා ඉල්ලන කොට මට එක පැත්තකින් කනගාටුවක් ඇති වෙනවා. අද වර්තමානයේදී මේ වන කොට පළාත් පාලන ආයතනය, මන්ත්‍රීවරුන් ගැන කිසිම දෙයක් නොතකා ඔවුන්ව කෙළින්ම ඔවුන්ගේ ධූර කාලය ඉවත් කරලා, අද ප්‍රාදේශීය සභාව අයාලේ යන්නට මම හිතන්නේ, සමහර තැන්වල කටයුතු කරලා තිබෙනවා. මම හිතන්නේ, මේ වන කොට අපි දීමනාව වැඩි කරන්නය කියලා මේ හැම මන්ත්‍රීවරයෙකුම එක හා සමානව කථා කරනවා. හැබැයි, මේක මෙතැන යෝජනාවට විතරක් සීමා වෙන්න පුළුවන් වෙනවා. එතුමා විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් වුණත් අද මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලය තුළදී වැඩි කරපු පඩි පිළිබඳව කිව්වා. දීපු වාහන පිළිබඳව කිව්වා. අපි සන්තෝෂ

වෙනවා. පළාත් පාලන ආයතනයක මන්ත්‍රීවරයෙකුගේ වගකීම, ගෞරවය රැක්කේ මහින්ද රාජපක්ෂ මැතිතුමා තමයි. එයට හේතුව තමයි ගම නැගුම, මග නැගුම, ජාතික සවිය, දිවි නැගුම ගෙනැල්ලා අද මන්ත්‍රීවරයෙකුට ඒ මන්ත්‍රීවරයා හරහා ගමට කෝටි ගණන් මුදල් ගෙනැල්ලා දීලා, ගම සංවර්ධනය කරලා දීලා, ගමේ මන්ත්‍රීවරයාගේ අගය රැක්කේ ඒ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව තමයි. අද මේ වන කොට අපි දකිනවා. ඊයේ පෙරෙයිදා වෙන කොට දිවි නැගුම ක්‍රියාත්මක කරන වැඩ සටහන තුළින් ගමේ ඉන්න සමහර ව්‍යාපෘති ගෙනැල්ලා ගමේ එක එක්කෙනාට දීලා, ඒ ව්‍යාපෘති අවිධිමත් විධියට ක්‍රියාත්මක කරන්න අපේ කාලයේදී සමහර ඒවා වුණා. අද මේ කාලයේදීත් සිදු වෙනවා. මම ඊයේ පෙරෙයිදා පරීක්ෂණයක් කරලා, ඒ පරීක්ෂණ කටයුත්තේදී පාරවල් ප්‍රමිතියෙන් තොරව හැදුවා කියලා අද ඒවා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අදාළ නිලධාරීන් ගෙනැල්ලා ඒ කටයුත්තට නියුතු වෙලා ඒ පාර හරියට ප්‍රමිතියෙන් කරලා නැහැයි කියලා අපි ඒවාට කටයුතු කරලා නිලධාරීන්ට ඒ වගකීම භාර දීලා තිබෙනවා.

අපි කියනවා, ගරු සභාපතිතුමනි, මේ දීමනාව වැඩි කරලා දෙනවා නම්, මම හිතන්නේ අපි දීමනාව විතරක් නොවෙයි. පළාත් පාලන ආයතනයක දීර්ඝ කාලයක් තිස්සේ, අවුරුදු 10 කට වැඩි මන්ත්‍රීවරයෙක් ඉන්නවා නම් මම හිතන්නේ - පාර්ලිමේන්තුවේ නොවෙයි. මේ පළාත් සභාවේත්, ප්‍රාදේශීය සභාවේ ඉන්න මන්ත්‍රීවරයෙකුටවත් මම හිතන්නේ පෙන්ෂන් එකක් වාගේ දෙයක් අපටත් ඒ අයටත් හදන්න ඕනෑ. අපි දන්නවා, අහළ පහළ තිබෙන මඟුල් ගේ, මළ ගෙදර, බණ ගෙදර හැම දෙයටම ප්‍රාදේශීය සභාවේ ඉන්න පහළ ඉන්න මන්ත්‍රීවරයා තමයි වගකියන්න වෙන්නේ. ඇමතිවරයා එන්නේ පස්සේ. ඇමතිවරුන්ට දුරකථනයෙන් දැනුම් දෙන්නේ මන්ත්‍රීවරයා. ඒ පණිවුඩය දෙන්නේ ඔහු. වෙනත් වූ ආකාරයකට. හැබැයි, මේ සියල්ලම අතේ තිබෙන මුදල වියදම් වෙන්නේ පහළ තලයේ ඉන්න අපේ සහෝදර මන්ත්‍රීතුමන්ලාට. මම කියනවා, මේක 15,000 නොවෙයි. 50,000 හරි කරලා දෙන්න පුළුවන් නම් ඒක තමයි යුතුකම වෙන්නේ.

හැබැයි, අපි මේ සියල්ලම මෙතැන කථා කරලා, මෙතැනට විතරක් සීමා නොකර අපේ මහ ඇමතිතුමාගේ නායකත්වය තුළින් අපේ යහපාලන ආණ්ඩුවක, මම හිතන්නේ අපේ පළාත් පාලන ඇමතිතුමාටත්, ජනාධිපතිතුමා වෙතටත් මම හිතන්නේ, තමුන්නාන්සේලාගේ ඒ සියලු සංගම් එක්ක එකට එකතු වෙලා කටයුතු කරන්න ඕනෑ.

මම කනගාටු වෙනවා. අද මේ වන කොට පළාත් පාලන ආයතන පිළිබඳව ඉන්න සමහර ලේකම්වරු වැඩ කර ගෙන යද්දීත් නොයෙකුත් චෝදනා, ඒ වාගේම හොරකම් සිද්ධ වෙන්න කටයුතු කරලා තිබෙනවා. මම පළාත් පාලන කොමසාරිස්තුමියට, සහකාර කොමසාරිස්තුමියට ලිඛිතව භාර දීලා තිබෙනවා. මම අපේ නව මහ ඇමතිතුමාටත් හෙට අනිද්දා වෙන කොට ඒ ටික භාර දෙනවා. මේ වන කොට පරීක්ෂණ පවත්වාගෙන යනවා. අද බේරුවල ආසනයේ අපි කනගාටු වෙනවා. සංවර්ධන කමිටු රැස්වීම තියා ගන්න තවම බැරි වුණා. මාස අටකට, නවයකට වැඩි කාලයක් වෙනවා. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව කාලයේ මාසයක් මාසයක් පාසා මේ සංවර්ධන කමිටු රැස්වීම තියලා, පළාත් සභාවෙන් එන මුදල් ටික, මහ ආණ්ඩුවෙන් එන මුදල් ටික, ප්‍රාදේශීය සභාවෙන් ක්‍රියාත්මක වැඩ පිළිවෙළ මම හිතන්නේ සාර්ථකව සාකච්ඡා කරලා, මහා දැවැන්ත සංවර්ධන ක්‍රියාවලියක් බේරුවල ආසනය තුළ දියත් වුණා. ඒ වාගේම අනෙක් ආසන තුළ දියත් වුණා.

අද අපි කනගාටු වෙනවා. අද ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට කිසිම දෙයක් කර ගන්න බැරිව අද එතුමන්ලා නිවෙස්වලට වෙලා නිකම් ඉන්නවා. ඒ කාලයේ මේ විධියට ක්‍රියාත්මක වුණා නම් මම හිතනවා, මේ යහපාලන ආණ්ඩුවට මේ ගෙන යන වැඩ පිළිවෙළට මහා ශක්තියක් වෙන්න ඒ පළාත් පාලන ආයතන ක්‍රියාත්මක කරන්න තිබුණා. අද ඒ මන්ත්‍රීවරු ගෙවල්වලට වෙලා නිකම් ඉන්නවා. මොකද, ඔවුන්ට කිසිම ක්‍රියාදාමයක් කර ගන්න ශක්තියක් නැතිව ඉන්නවා. ඒ නිසා අපි අතිගරු ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ දෙන පණිවිඩය අරගෙන ගිහිල්ලා, අහලා ගිහිල්ලා මම හිතන්නේ, ඉක්මණින්ම මේකට අවශ්‍ය කරන ශක්තිය නිර්මාණය කරලා දීලා, ඉක්මණින්ම පළාත් පාලන මැතිවරණය මනාප ක්‍රමයට හෝ කොට්ඨාශ ක්‍රමයකට හෝ කැමැති විධියකට තියලා, ඉක්මණින්ම මේ පළාත් පාලන ආයතන තුළින් ක්‍රියාත්මක වන වැඩ සටහන, ඒ මන්ත්‍රීවරුන්ට දෙන වරප්‍රසාද සියල්ල ලබා දීලා කටයුතු කරන්න, ඉක්මන් කරන්නය කියලා ඉල්ලා සිටිනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 01.35]

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා ගෙනාපු මේ යෝජනාව ඉතාමත්ම කාලෝචිත සහ වර්තමානයේදී ගැළපෙන යෝජනාවක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යෝජනාව පිළිබඳව මේ සභාවේ ගරු මන්ත්‍රීවරු අදහස් ප්‍රකාශ කරන කොට ඇත්තටම ප්‍රාදේශීය සභා, නගර සභා සහ මහ නගර සභා ආයතනවල මන්ත්‍රීවරුන්ගේ දීමනා පසුගිය රජයන් විසින් නොයෙක් වර වැඩි කළා. හිටපු ආණ්ඩුව විසින් මේ පළාත් පාලන සභිකයින්ගේ විවිධ පහසුකම් සහ දීමනා වැඩි කරද්දී මම හිතනවා. මහින්ද රාජපක්ෂ මැතිතුමා මට මතකයි පසුගිය කාලයේ අපි ප්‍රාදේශීය සභා නියෝජනය කරන කොට මේක රු. 15,000 දක්වා වැඩි කරලා, සභාපතිතුමාගේ දීමනාව රු. 25,000 දක්වා වැඩි කරලා, මම හිතනවා මේක යම්කිසි ස්ථාවර මට්ටමකට ගෙනාවා. ඒ එක්කම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වර්තමානය වන විට මේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ තිබෙන වර්තමාන සමාජයේ කාර්ය බහුලතාවය නිසා ඔවුන්ගේ සාමාන්‍ය ජීවිතය පැය 24 ම දේශපාලනයට යොමු වෙලා තිබෙන්නේ. මළ ගෙවල්, මඟුල් ගෙවල් සහ මිනිසුන්ගේ අනෙකුත් සෑම කටයුත්තක් සඳහාම මේ මන්ත්‍රීවරයා යොමු වෙනවා. ඒ නිසා රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා ගෙනාපු මේ යෝජනාව මම හිතනවා, ඉතාමත්ම කාලෝචිත යෝජනාවක්. විවිධ රාජ්‍ය නායකයින් යටතේ මේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ දීමනාව වැඩි කළා. වර්තමානයේදී ගරු මහ ඇමතිතුමාගේ, අපේ සහයෝගය ලබා ගෙන මේ පළාත් සභාවේ යෝජනාවක් වශයෙන් සම්මත කරලා, මධ්‍යම ආණ්ඩුවට මේක යොමු කරලා, මේ පළාත් පාලන ආයතනවල සභිකයින්ගේ දීමනාව ඉතාමත්ම ඉක්මණින් වැඩි කරන්නය කියලා මමත් යෝජනා කරනවා.

ඒ එක්කම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඊට අමතරව දැන් වර්තමානයේදී සාමාන්‍ය සමාජයේ ප්‍රාදේශීය සභාවකට ඉන්න නියෝජිතයන්ට මුදලක් නිශ්චිත නැහැ. අයවැය ලේඛනයෙන් ප්‍රාදේශීය සභා, නගර සභා මන්ත්‍රීවරයකුට මෙපමණ මුදලක් වෙන් වෙනවා කියලා නිශ්චිත නැහැ. නමුත් අපි කල්පනා කරනවා, අනිවාර්යයෙන්ම ප්‍රාදේශීය සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙකුට පළාත් සභාව මැදිහත් වීමෙන් තමන්ගේ වාර්ෂිකව, තමන්ගේ කොට්ඨාශයට වැඩ කරන්නට යම්කිසි මුදලක් වෙන් කරන්නය කියලා යෝජනාවක් කරනවාත් එක්කම, අනෙකුත් පහසුකම්, තැපැල් පහසුකම්, ඒ එක්කම දුරකථන පහසුකම් වැඩි කරලා, මේ ප්‍රාදේශීය සභාවල මන්ත්‍රීවරුන්ගේ ඒ රාජකාරී කර ගෙන යන්නට අවස්ථාව උදා කරන්නය කියලා ඉල්ලීමක් කරනවාත් එක්කම, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාටත් අපි ස්තූති කරනවා.

ඒ එක්කම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි පසුගිය කාලයේදී අපේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ වැඩ කරන්න අපට බයිසිකල් ලබා දුන්නා. ඒ බයිසිකල් ලබා දීමේදී ගම්පහ දිස්ත්‍රික්කයේ - අනෙකුත් දිස්ත්‍රික්වල මම දන්නේ නැහැ. ගම්පහ දිස්ත්‍රික්කයේ මේ බයිසිකල් වැඩ සටහන යද්දී ඒ කාලයේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ට, ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන්ට මේ බයිසිකල් ලබා දුන්නේ නැහැ. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ. වර්තමාන යහපාලන ආණ්ඩුව ආවාට පස්සේ තමයි මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ නායකත්වයෙන් අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නායකත්වයෙන් තමයි මටත් බයිසිකලය හම්බ වුණේ. ඊට කලින් පසුගිය කාලයේ අපට බයිසිකල් හම්බ වුණේ නැහැ. (බාධා කිරීම්)

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගෙනැල්ලා තිබුණේ.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

අපට හම්බ වුණේ නැහැ. ඔබතුමන්ලාට හම්බ වෙන්න ඇති. අපට හම්බ වුණේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ පසුගිය කාලයේ -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඕගොල්ලන්ට දෙන්න හිටියේ ඡන්දය ඉවර වුණාම.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා ඒවාට උත්තර දෙන්න එපා. මූලාසනයට කථා කරන්න.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ බයිසිකල් බෙදීමේදී - ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන්ට බයිසිකල් ලබා දුන්නා. නමුත් ඒ ආණ්ඩුව යටතේ අපට බයිසිකල් ලබා දුන්නේ නැහැ. වර්තමාන ආණ්ඩුව යටතේ තමයි අපට බයිසිකල් ලබා දුන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි ඔබතුමා මගින් ඉල්ලීමක් කරනවා, වර්තමානයේදී පළාත් පාලන ආයතන මැතිවරණ පවත්වන්න දැන් ලඟි ලඟියේ සූදානම් වෙනවා. ඒ මැතිවරණය පවත්වන කොට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය කාල සීමාව තුළදී මේක කොට්ඨාශ ක්‍රමයට පවත්වන්නට අපි කටයුතු කළා. අදහස් ගත්තා. කොමිටියක් පත් කළා. අපි ඉල්ලීමක් කරනවා, මේ අගෝස්තු මාසේ 12 වැනිදා මේ කොට්ඨාශ ගැසට් කළා. මේ කොට්ඨාශ ගැසට් කරන කොට මේ කොට්ඨාශ සීමා නිර්ණය කිරීමේ කොමිසමේදී මම හිතනවා, බියගම ප්‍රාදේශීය සභාවට සිටියේ මන්ත්‍රීවරු 23 දෙනයි. දැන් 32 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඉතින් ඒ වාගේ ඒ කොට්ඨාශ බෙදීමේදී සමහර කොට්ඨාශයකට ඡන්ද දායකයින් 3000 ක් පමණ ඉන්නවා. සමහර කොට්ඨාශවලට ඡන්ද දායකයින් 5500 ක් ඉන්නවා. අපේ කොට්ඨාශවල ඡන්ද 2500 ක පරතරයක් තිබෙනවා. වර්තමාන රජය හරහා අපි ඉල්ලීමක් කළා, මේක සාමාන්‍යයෙන් ඡන්ද 500 ක්, 750 ක්, 1000 ක් වාගේ පරතරයක් කමක් නැහැ. නමුත් සමහර කොට්ඨාශවල ඡන්ද 2000 ක විතර පරතරයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම හිතන්නේ නව කොට්ඨාශ බෙදීම අනුව මම හිතනවා, මේ මැතිවරණය - අපි ඉල්ලීමක් කරනවා. මගේ පෞද්ගලික යෝජනාවක්. මේ කොට්ඨාශ මැතිවරණය පවත්වනවා නම්, මේ කොට්ඨාශ අලුතෙන් සීමා නිර්ණය කරන්න ඕනෑ. මේ කොට්ඨාශ සීමා නිර්ණය කළේ නැත්නම් එක එක ප්‍රාදේශීය සභා කොට්ඨාශයෙන් කොට්ඨාශයට ඡන්ද 1500 ක්, 2000 ක් වාගේ ලොකු පරතරයක් තිබෙනවා. ඉතින් ඒ නිසා අපි පළාත් සභාවේ අවධානය යොමු කරලා, මේ පළාත් පාලන මැතිවරණය ඉතාමත්ම ඉක්මණින් තියන්න ඕනෑ. ඒ තියන කොට මේක සමානුපාතික ක්‍රමයට හරි, කොට්ඨාශ ක්‍රමයට හරි තියනවා නම් නැවත වතාවක් මේක සීමා නිර්ණය කරන්න. කොට්ඨාශ ක්‍රමයට තියන්න බැරි නම්, සමානුපාතික ක්‍රමයටම මේ පාරත් මේ පළාත් පාලන මැතිවරණය තියන්නය කියලා මේ ගෞරවනීය සභාවට මම යෝජනා කරනවා. බොහොම ස්තූතියි.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. දැන් මම ඉල්ලන්න කැමැතියි. දැන් අපේ ගරු මන්ත්‍රීතුමන්ලා කිව්වා වාගේ දැන් දීර්ඝ කාලයක් තිස්සේ තිබුණු යෝජනාවක් තමයි මේ අද ගත්තේ. ඔය විධියට අපිත් යෝජනා දාලා තිබෙනවා. ඊළඟට සභා කටයුතු කාරක සභාවේ අනුමත වෙලා තිබෙනවා. දැන් මම හිතන්නේ, මම දාපු යෝජනාවටත් දැන් අවුරුද්දකට කිට්ටු වෙන්න වාගේ ඇවිල්ලා. ඒ නිසා මම ඉල්ලා සිටිනවා, දැන් අපට ඒ යෝජනාව ඒ කාලය තුළ කථා කරන්න ඕනෑ යෝජනාවක්. ඉතින් ඒක කථා කරන්න වෙන්නේ නැහැ. මම ගොඩක් බලාපොරොත්තු වුණේ, ගිය ආණ්ඩුවට ඉස්සෙල්ලා ඒ යෝජනාව ගනියි කියලා. ඒක කර ගන්න බැරි වුණා. මම හිතන්නේ, වැඩිපුර සභා වාරයක් හරි දාලා - මේ මන්ත්‍රීවරු දාන්නේ ප්‍රදේශයට, රටට අවශ්‍ය කරන යෝජනා. අවුරුදු ගණන් බලා ඉන්න ඕනෑ යෝජනා නොවෙයි. ඒ නිසා එක්කෝ සභාව කල් තියලා හරි, මොකක් හරි කරලා මේ මන්ත්‍රීවරුන් මාස හයක්, හතක් තිස්සේ දාලා තිබෙන යෝජනා සභාවට ගන්නේ. අඩු ගණනේ තීන්දුවක් ගන්න මාස තුනකට සැරයක්වත් මේ යෝජනාව කරන්න ඕනෑ කියලා. යෝජනා වැඩි නම් සභාව කල් තියලා හරි, නැත්නම් වෙනම දිනයක් දාලා හරි මේ යෝජනා ගන්නය කියලා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මගේ යෝජනාවටත් දැන් අවුරුද්දකට කිට්ටු වෙන්න වෙනවා. තවමත් යෝජනාව ආවේ නැහැ. ඒ නිසා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ ප්‍රකාශය පිළිබඳව අපි මීළඟ සභා කටයුතු කාරක සභාවේදී අවධානය යොමු කරනවා. මීළඟට ජානක සූරියබණ්ඩාර ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[අ.භා. 01.42]

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට ඉස්සෙල්ලා කථා කරපු සෑම මන්ත්‍රීවරයෙක්ම කථා කළේ පළාත් පාලන ආයතනවල ඉන්න ඒ නියෝජිතයන්ට එහෙම නැත්නම් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ, සභාපතිවරුන්ගේ දීමනා

[ගරු ජානක සූරියබණ්ඩාර]

වැඩි කරන්නය කියලා. මම මේක පටන් ගන්න ඕනෑ. මීට අවුරුදු ගණනකට ඉස්සෙල්ලා දේශපාලන ක්‍රමය මේ රටේ බිහිවුණු දවස්වල මේ පළාත් පාලන මැතිවරණ ක්‍රමය තිබුණේ කොට්ඨාශ මට්ටමට. ගම් සහා ක්‍රමයට. ගමේ දෙන්නෙක් ඡන්දය ඉල්ලනවා. පක්ෂ දෙකකින් ඉල්ලනවා. දිනපු එක්කෙනා තමයි ගමේ මැම්බර් වෙන්නේ. එතකොට මේක ගරු සේවයක් වුණා. ඒ ගමේ ඒ ඡන්දයට ඉදිරිපත් වුණේ යමක් කමක් කර ගන්න පුළුවන්, ගමේ සමාජ සේවයට කැප වුණු අය. මේ ක්‍රමය මෙහෙම යන කොට මම හිතන්නේ, 60 දශකයේ මෙහෙම ක්‍රමයක් නැතිව ගියා. නැතිව ගිහිල්ලා, 80 දශකය වන කොට තමයි නැවතත් ගරු දිවංගත ආර්. ප්‍රේමදාස මැතිතුමාගේ සංකල්පයක් අනුව, එතුමාගේ පාලන කාලයේ 13 වැනි ව්‍යවස්ථා සංශෝධනය තුළින් සංවර්ධන සභා කියලා ක්‍රමයක් ඇති කළා. මම හිතන්නේ, සංවර්ධන සභා ඡන්දයට විපක්ෂයක් විධියට අපි සමහර තැන්වල ඉදිරිපත් වුණේ නැහැ. 80 දී. ඒ සංවර්ධන සභාවේදී යම් යම් මන්ත්‍රීවරු පත් වෙලා එවකට තිබුණු රජය යටතේ, මම හිතන්නේ ඒක පාක්ෂිකව තමයි හුඟක් සිද්ධ වුණේ. මොකද, විපක්ෂයක් තිබුණේ නැහැ. ආණ්ඩු පක්ෂයේම තමයි හිටියේ. ඉඳලා මේ විධියට මේ අය ජනතාවට සේවය කර ගෙන ගියා.

ඒ යන අතරතුරේ තමයි මම හිතන්නේ, 1991 නැත්නම් 1992 දී සිරිකමල් පිලිෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා සභාපතිවරයා වුණා. මම විපක්ෂ නායකවරයා වුණා. පළාත් පාලන ඡන්දය මනාප ක්‍රමය අනුව සාධාරණව පැවැත්වුවා. පවත්වලා පළාත් පාලන ආයතනවලට නියෝජිතයෝ පත් වුණා. අර මන්ත්‍රීතුමා කිව්වා වාගේ, 1095 යි දීමනාව. අපි ඒ 1095 අරගෙන සිරිකමල්ලා, අපි වැඩ කළා. අපි ඒ දවස්වල මම හිතන්නේ, පඩි වැඩි කරන්නය කියලා කිව්වේ නැහැ. මොකද, මේ වාගේ ආර්ථික ප්‍රශ්න තිබුණේ නැහැ. මේ වාගේ දේශපාලන හැල හැප්පීම්, කාල ගෝට්ටි තිබුණාට අපට වැඩ කරන්න අවස්ථාව තිබුණා. සිරිකමල් පිලිෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා රැකියාවක් කළා. මමත් රැකියාවක් කළා. 1997 සභාපති වෙන කල් රැකියාවක් කළා. නමුත් අපි දේශපාලනය කළා. ගමේ වැඩ කළා. අපි මේවා ගැන කථා කරන්න ඕනෑ. මොකද, අද සමහර අය බලනවා, මම මැම්බර් වුණාම, මම ප්‍රාදේශීය සභා මන්ත්‍රී වුණාම, මට සෑම වරප්‍රසාදයක්ම ආණ්ඩුවෙන් අරගෙන මම ඒකෙන්ම ජීවත් වෙන්න ඕනෑය කියලා. ඒ වාගේ ක්‍රමයක් මේ රට තුළ ඇති වෙන්න හොඳ නැහැ. මොකද, මේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් වෙන්න ඕනෑ මනුස්සයා සමාජ සේවකයෙක් වෙන්න ඕනෑ.

අපි ප්‍රාදේශීය සභාවට හෝ නගර සභාවට, පළාත් සභාවට, පාර්ලිමේන්තුවට තරඟ කරන්නේ අපි ජීවත් වෙන්න නොවෙයි. ජනතාව ජීවත් කරවන්න. ජනතාව ජීවත් කරන අතරම අපට ජීවත් වෙන්න විධියක් නැත්නම්, අන්න ඒ නිසා තමයි අපි කියන්නේ අපට යම්කිසි යැපෙන්න දීමනාවක් දෙන්නය කියලා. ඒ දීමනාව මතම මේ දීමනාව අපට ඕනෑ. අපි මේකෙන්ම යැපෙන්න ඕනෑ. අපි දේශපාලනයෙන්ම ජීවත් වෙන්න ඕනෑය කියන පිළිවෙළකට ගියෝත් කාරිය අපි හිතන දේවල් සිද්ධ වෙන්නේ නැහැ. සමාජ සේවය, දේශපාලනය, දේශය පාලනය කිරීම, ඔය කියනවා පගා ගහනවා කියලා. ඔය දැන් කථා කළා පගා ගහන ඒවා ගැන. මේවා සිද්ධ වෙනවා එතකොට. නමුත් ඒවාවලින් බැහැරව අපි සමාජයට සේවය කරන්න ඉගෙන ගන්න ඕනෑ. එහෙම නැත්නම් අපි මේවාට එන්න හොඳ නැහැ.

ඒ නිසා තමයි අපේ හිටපු ජනාධිපතිතුමා, දැන් ඉන්න අගමැතිතුමා, දැන් ඉන්න ජනාධිපතිතුමා ආදිය එකතු වෙලා අලුත් ඡන්ද ක්‍රමයක් හදලා තිබෙනවා. මේ ඉදිරියේදී පවත්වන ඡන්දයේදී අර කලින් ක්‍රමය තමයි ඡන්දය ඉල්ලන්නේ. ඒකට ග්‍රාම රාජ්‍යයක් කියනවා. ඒ පත් වන එක්කෙනා ඒ ගමේ මැම්බර් මහත්තයා වෙනවා. ඒ ගමේ මන්ත්‍රී වෙනවා. පරදින එක්කෙනා ඒ ග්‍රාම රාජ්‍යයේ ලේකම් වෙනවා. එතකොට ප්‍රාදේශීය ලේකම් ලේකම් වෙනවා. ගමේ පන්සලේ හාමුදුරුවෝ, ඉස්කෝලේ ප්‍රින්සිපල්, පල්ලියේ ස්වාමී, ගමේ මරණාධාර සමිතියේ නායකයෝ මේ කමිටුවේ සාමාජිකයෝ වෙනවා. එතකොට ඔය කියන හොරකම්, ඔය කියන බලුකම්, ඔය කියන ජරා වැඩ කරන්න හම්බ වෙන්නේ නැහැ. අන්න එදාට ඒ අයගේ වැටුප වැඩි කරලා, ඒ අයට ගරුත්වයක් ඇතිව තමන්ගේ ගරු සේවය කර ගෙන යන්න අවස්ථාව ලබා දෙන්න ඕනෑ.

ඒ එක්කම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් අපි මේ ඔක්කොම කථා කරන්නේ මේ මන්ත්‍රීතුමා ගෙනැල්ලා තිබෙන යෝජනාව, අපි එකහෙලා අනුමත කරනවා. මේ පළාත් පාලනය ගැන විතරයි. එතකොට අපි. අපි ගැන කවුද කථා කරන්නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාවේ චාරිත්‍ර පිළිබඳව අලුත් මන්ත්‍රීවරුන්ට වඩා ඇමතිවරු පුරුදු කර ගන්න ඕනෑ. අමතක වීමකින් වන වෙලාවල් තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දැනුවත් කිරීමේ පාඨමාලාවක් තියන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒක කළොත් හොඳයි. නැත්නම් මේක විහිළුවකට පත් වෙනවා. විශේෂයෙන්ම ඇමතිවරුන්ට පුරුදු කරලා කරන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමා අවසන් කරන්න.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ මේ පුටුවල අපට කලින් ඉඳගෙන මේ සභාව අමතපු මන්ත්‍රීවරු කී දෙනෙක් අද ගෙවල්වල එක්තැන් වෙලා ඉන්නවාද? ඒ අයගේ සුවඳ තාම අපට තේරෙනවා වාගේ. කී දෙනෙක් ගෙවල්වල එක්තැන් වෙලා තිබෙනවාද? ඒ වාගේම කී දෙනෙක් මිය ගිහිල්ලා තිබෙනවාද? අපි ඒ අය වෙනුවෙන් මේ සභාවේ ශෝකය ප්‍රකාශ කරන එක විතරයි කරන්නේ. අද මට නම් කියන්න බැහැ. අපේ ප්‍රදේශයේ ඉන්නවා මේ සභාව ගොඩක් කල් නියෝජනය කරපු මන්ත්‍රීවරු එක්තැන් වෙලා. අසරණ වෙලා. සමහර අය තමන්ගේ එදිනෙදා ජීවිතය කර ගෙන යන්න විධියක් නැහැ. ජීවත් වෙන්න විධියක් නැහැ. ඇයි අපි ඒ අය වෙනුවෙන් කථා නොකරන්නේ? අපි මොනවාද ඒ අයට කරලා තිබෙන්නේ? අපි බොරුවට මේකේ ඉන්නකම්, අවුරුදු පහ ඉන්නකම් එකට ටුවර් යනවා. එකට කනවා බොනවා. එකට කථා කරනවා. අපි රට හදන්න හදනවා. අපි පළාත් පාලන ආයතන හදන්න හදනවා. පළාත් පාලන ආයතනවල පඩි වැඩි කරන්න කථා කරනවා. නමුත් ඒ කථා කරපු මන්ත්‍රීවරයා එකතැන් වුණාම ඒ අයට සුභ සාධනයක් වශයෙන් යම්කිසි මුදලක් නැත්නම්, අඩු ගණනේ මොකක් හරි සුභ සාධක සමිතියක් හදලා එකෙන් හරි, නැත්නම් අපි අතරින් යම්කිසි මුදලක් හරි දෙන්න අපි සලස්වන්න ඕනෑ. මේක නිකම් දේශපාලනය කියන්නේ - මිනිහා දේශපාලනය කරන කල් විතරක් ඒ මිනිහාව වර්ණනා කර කර ඉඳලා වැඩක් නැහැ. බැරි වෙලාවට අපි ඒ මිනිහා දිහාත් බලන්න ඕනෑ. ඒ නිසා අපි ඉල්ලා සිටිනවා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට, මන්ත්‍රීවරුන්ගේ ලේකම්ලාට විශ්‍රාම වැටුපක් දෙන්න පුළුවන් නම්, ඇයි අපට අවුරුදු පහ, දහය, පහළොව මේකට කඹුරපු අයට උගුරේ ලේ රහ වෙනකල් ජනතාව වෙනුවෙන් කථා කරපු අපට ඇයි පැන්ෂන් එකක් දෙන්න බැරි. ඒ නිසා මම ඉල්ලා සිටිනවා, කරුණාකරලා. මේවා කථා කරලා වැඩක් නැහැ. මේවා ක්‍රියාත්මක කරන්න ඕනෑ. මේවා ක්‍රියාත්මක කළොත් ඒ දවස්වල ලෝරන්ස් මාදිවල ගරු මන්ත්‍රීතුමන්ලා ඉන්න කාලේ - ඇත්ත කථා කරන්න ඕනෑ. සමහර දේවල් ක්‍රියාත්මක කළා. මන්ත්‍රී වරප්‍රසාදය. ඇයි අපට බැරි? ඒ නිසා කරුණාකරලා ගරු නියෝජ්‍ය සභාපතිතුමාගෙන් ඉල්ලනවා. ගරු මහ ඇමතිතුමාගෙන් ඉල්ලනවා. මේවා විහිළුවට ගණන් ගන්න එපා. මේවා කවදාහරි අපට සාපයක් වෙනවා. මම දන්නවා. මම මන්ත්‍රීවරයෙක් ළඟට එක්කගෙන යන්නම්. ඒ මනුස්සයා මොන තරම් දුක් විඳිනවාද කියලා. පළාත් සභා ධූර කාල තුනක් විතර නියෝජනය කරපු අය. මේක හෙල්ලෙන්න කථා කරපු අය. අද එකතැන් වෙලා. පිහිටක් නැහැ. හවිහරණක් නැහැ. ඒ නිසා මම ඉල්ලා සිටිනවා, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට ඒ පඩිය, දීමනාව වැඩි කරන ගමන්ම මේකේ හිටපු මන්ත්‍රීවරු ගැනත් බලන ගමන්ම, දැනට ඉන්න මන්ත්‍රීවරුන්ගේ ඉදිරි කාලය, සැදෑ සමය ගත කරන කොට දුකක්, කරදරයක් නැතිව ගෙවන්න යම්කිසි දීමනාවක්, පෙන්ෂන් එකක් ඒ අයට ලබා දෙන්න කටයුතු කරන්නය කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 01.47]

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට අවස්ථාව ලබා දීම ගැන බොහොම ස්තුතියි. රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා ඉතාමත් කාලෝචිත යෝජනාවක් ගෙනැත් තිබෙන්නේ. මම ඒ විනාඩි ගණන ඉල්ලුවේ බොහොම කෙටියෙන් කියන්න. මමත් පළාත් පාලන ආයතනයක මන්ත්‍රීවරයෙක් වශයෙන් සිට මෙතැනට ඇවිල්ලා තිබෙන්නේ. මම හිතන්නේ අපේ ජානක සූරියබණ්ඩාර ගරු මන්ත්‍රීතුමා කිව්වා, මන්ත්‍රීවරු මෙතැනට එන්නේ සේවය කරන්න තමයි කියලා. ඔව්. සේවය කරන්න තමයි. ඒ කාලයේ ගම් සභාවේ තිබුණේ, මම හිතන්නේ බොහොම සරල ක්‍රියාවක්. මොකද, ගම් සභාව තිබෙන කොට එච්චර වැඩක් නැහැ. ඒක නිසා

[ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා]

එහෙම කරන්න පුළුවන්. නමුත් අද වන විට මේ පළාත් පාලනය විශාල වෙලා. ඒ මන්ත්‍රීවරයාට තිබෙන වැඩ කටයුතු ටික අති විශාලයි. මේ කණු හැම එකේ ලයිට්. හැම පාරේම හැමදාම පැච්. එහෙම නැත්නම් අතු කපන්න ඕනෑ. ගස් කපන්න ඕනෑ. කුණු අදින්න ඕනෑ. ට්‍රැක්ටරය එනවා. ඒක පස්සෙන් යන්න ඕනෑ. ඒක පස්සෙන් ගියේ නැත්නම් මනාප හම්බ වෙන්නේ නැහැ. ට්‍රැක්ටරේ පස්සෙන් ගියේ නැත්නම් මනාප හම්බ වෙන්නේ නැහැ. මිනිස්සු කියනවා, මන්ත්‍රීවරයා දකින්නවත් නැහැයි කියලා. මේ කටයුතු කරන කොට පළාත් පාලන මන්ත්‍රීවරයාට රාජකාරී කරන්න වේලාවක් නැහැ. රස්සාවක් කරන්න වේලාවක් නැහැ. ඒ මොකද අපි හැමෝටම වාගේ එයාටත් ගෑණු කෙනෙක් ඉන්නවා. දරුවෝ ඉන්න පුළුවන්. නේද? කන්න බොන්න ඕනෑ. දුක සැප තේරෙනවා. ඉලව් මඟුල් තිබෙනවා. මේ පාර්ලිමේන්තු, පළාත් සභා හැම මන්ත්‍රීවරයෙක්ම මේ තැනට ගෙනෙන්න දර දිය අදින කෙනා එයා තමයි.

ඉතින් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔය හොරකම් කළා කියන චෝදනාව ඒ මන්ත්‍රීවරයාට දැම්මාට මම දන්න තරමින් කටාන ආසනයේ පළාත් පාලන මන්ත්‍රීවරු හැම කෙනාම, 90% කගේම ඉඩම් උකස් තියලා, සින්න වෙන්න ඔන්න මෙන්න තියෙන්නේ. සින්න වෙලා එළියට දාන්න ඔන්න මෙන්න. ඇයි? හැමදාම වියදම්. හම්බ වෙන්නේ අර මහින්ද මහත්මයාට පිං සිද්ධ වෙන්න රුපියල් 5,000, 10,000 වෙලා රුපියල් 15,000 වුණා. රුපියල් 15,000 නිකන් කැහැලා ගිහිල්ලා වාගේ. රුපියල් 15,000 කින් මොනවා කරන්නද? නේද? ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළාත් පාලන මන්ත්‍රීවරයා - (බාධා කිරීමක්)

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

දැන් මේ යෝජනාවේ රනිල් වික්‍රමසිංහ 25,000 කරනවාද?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම හිතන්නේ මෙය රටේම කථිකාවක් වෙලා ඒ අසරණ පළාත් පාලන මන්ත්‍රීවරයාට සාධාරණයක් වෙන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම හිතන්නේ මේක හැමදාම කථාවට සීමා කරන්න එපා. මෙය ක්‍රියාවට නංවන්න. මම හිතන්නේ අපේ ගරු ප්‍රධාන අමාත්‍ය ඉසුර දේවප්‍රිය මැතිතුමා පුළුවන් නම් අපේ ගරු ජනාධිපතිතුමාට කියලා, රනිල් වික්‍රමසිංහ මැතිතුමාට කියලා අනාගතයේ පත් වන පළාත් පාලන මන්ත්‍රීවරයාට අදට වඩා සාධාරණ ක්‍රමයක් හෙට හදන්න. මොකද, දැන් මේ යහපාලන ආණ්ඩුව නිසා අගමැතිතුමායි, ජනාධිපතිතුමායි දෙන්නම ඉන්නේ එකම තැන. ඒ නිසා දෙන කොට දෙන්නාගෙන් කවුරුත් විරුද්ධ වෙන්නේ නැහැ. අපිත් විරුද්ධ නැහැ. එහෙමනම් දැන් තමයි දෙන්න හොඳම කාලය. බොහොම ස්තුතියි.

[අ.භා. 01.50]

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ ඉතින් ඥාතියා, හිතවතා, මිත්‍රයා, ආසනයේ මනුස්සයා ඉදිරිපත් කරපු යෝජනාව. අනික් එක මගේ නගර සභාවෙන්ම මෙතැනට පැමිණි කෙනා. ඉතින් ඒ නිසා ප්‍රධාන ඇමැතිවරයා හැටියට වචන ටිකක් කථා කළේ නැත්නම් ඒක හරි නැහැ. මට මතකයි මේ ළඟදී අපේ විශේෂ දේශනයකට ආපු පාර්ලිමේන්තු මන්ත්‍රී ජනාධිපති නීතිඥ ජයම්පති මැතිතුමා කිව්වා, එතුමාට පාර්ලිමේන්තුවේදී හම්බ වුණාලු මේ පළාත් සභාවේ ඉඳලා ගිය සුවිශේෂ චරිතයක්. එතුමා කථා කරපු දිහා බැලුවාම පුදුම හිතුනලු. මොකද, සම්පූර්ණයෙන්ම පළාත් සභාව අමතක කරලා කථා කළා කියලා. අපි දන්නවා, පළාත් පාලනයෙන්, පළාත් සභාවෙන් තමයි හුඟක් අය පාර්ලිමේන්තු යන්න ඉනිමඟක් කර ගත්තේ. නමුත් පාර්ලිමේන්තු ගිය අය ආපසු හැරිලා බැලුවා නම් මම හිතන්නේ, මීට වඩා වරප්‍රසාද නාගරික මන්ත්‍රීවරුන්ට ලබා ගන්න තිබුණා. කොහොම හරි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් මෙය පිහිටුවන කොට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් භාගයක් වරප්‍රසාද ලැබිය යුතු නිසා අපි ඕගොල්ලොත් බේරුණා. නැත්නම් අපටත් සිද්ධ වෙන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ළඟ ගිහිල්ලා පාර්ලිමේන්තුවේ යෝජනාවක් සම්මත කරන්න. අපට වරප්‍රසාද සහ වරදාන දෙන්නය කියලා. නමුත් ඉතින් ඉතින් මේක ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට විතරක් නොවෙයි. මම දන්නවා, පළාත් සභා මන්ත්‍රීවරු ගත්තත් මේ දිස්ත්‍රික්කයක් ආවරණය කිරීමේදී මම හිතන්නේ අපට ලබා දෙන මේ රුපියල් 27,000 කියන්නේ - මම දන්න විධියට වරායේ කම්කරුවෙකුත් රුපියල් 50,000/- ක් විතර ගන්නවා. අපේ පළාත් සභාවේ මන්ත්‍රීවරු - ඇත්තටම මේ මාධ්‍යවේදීන් දැන ගන්න

ඕනෑ, අපට මොකක්ද හම්බ වෙන්නේ? අපේ පළාත් සභා මන්ත්‍රීවරයෙකුගේ වැටුප රුපියල් 27,000 යි. මේක තමයි ඇත්ත. ඉතින් අපට වඩා මේ රටේ වරායේ, මට එක මනුස්සයෙක් කිව්වා, මොනවද මේ. වරායේ කම්කරුවෙකු හැටියට මීට වඩා අපි ගන්නවා. ඉතින් මේක තමයි පළාත් සභා මන්ත්‍රීවරු හැටියට අපි ඉන්න ස්වභාවය. ඒ අය ඉහළ ඉන්නවා. ඒ නිසා මම එක දෙයක් කියන්න ඕනෑ.

පසුගිය අපේ රජයේ කාලයේ මම හිතන්නේ රුපියල් 15,000/- කට අපි මේක ගෙනාවා. දැන් මම දැනගත්ත විධියට භාණ්ඩාගාරය මෙය අනුමත කරලා එව්වත් මේ වන තුරු භාණ්ඩාගාරයෙන් අපට මුදල් ප්‍රතිපූර්ණය කරලා නැහැ. දැන් මේක දරන්නෙත් පළාත් සභාව. දැන් පළාත් පාලන ආයතවලට ප්‍රධානීන්ට දෙන දීමනාව මෙතෙක් අපි තමයි දරලා තිබෙන්නේ. ඉතින් මම කරුණු සොයලා බැලුවාම මේකේ යම් දෙයක් අපට කරන්න පුළුවන්. නමුත් ඒක පළාත් සභාවටත් දරන්න පුළුවන් වියදමක් නොවෙයි. මේ දීලා තිබෙන දීමනාවත් භාණ්ඩාගාරයෙන් දෙන්නේ නැත්නම්, අපි තමුන්නාන්සේලා යමක් කරන්න ගිහිල්ලා අන්තිමේ ඒකත් හම්බ වුණේ නැත්නම් මම හිතන්නේ ඒක අපට දරා ගන්න බැරි විශාල වියදමක් බවට පත් වෙනවා. ඒ නිසා අපි පළාත් සභා සහ පළාත් පාලන විෂයය පිළිබඳව කටයුතු කරන ෆයිසර් මුස්තාපා ගරු ඇමැතිතුමා තරුණ සහ යමක් කරන්න ඕනෑකමක් තිබෙන ඇමැතිවරයෙක්. ඉතින් ජනාධිපතිතුමාත් පළාත් පාලන විෂයය පිළිබඳව අවබෝධයක් තිබෙන කෙනෙක් හැටියට, ගරු අගමැතිතුමාගේත් අවධානය අපි යොමු කරලා රජයේත් අවධානය අපි යොමු කරලා - ඉස්සෙල්ලාම අපට කරන්න වෙලා තිබෙන්නේ අපි දුන්න ප්‍රතිපාදන අපි ලබා ගන්න එක සහ යම් මුදලක් ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෙනෙක්ට අඩුම ගණනේ රුපියල් 20000 කවත් මුදලක් ලැබෙනවා නම් ඇත්තටම හොඳයි. එහෙම වෙනවා නම් ඉතින් පළාත් සභා මන්ත්‍රීවරුන්ටත් තව පොඩ්ඩක් එහාට යන්න වෙනවා. 27,000 යි 20000 යි අතරේ. ඒ නිසා අපි ඒ ගැන හුඟක් කල්පනා කරලා බලන්න ඕනෑ. අපේ අනුරාධ විමලරත්න ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ අපට ලොකු උවමනාවක්, ලොකු ආශාවක් තිබුණත්, ඒ අය වෙනුවෙන් යමක් කරන්න. දැන් මේ පළාත් පාලන ආයතන ඔක්කෝම විසුරුවලා ඉවරයි. තව ටිකක් විතරයි තිබෙන්නේ. ඉදිරි පළාත් පාලන ආයතන පිහිටුවලා එන කොට මම හිතන්නේ දැන් ඉන්න ප්‍රමාණයට වඩා එක් දහස් ගණනකින් විතර වැඩි වීමක් වෙනවා. ඉතින් ඒ නිසා මෙතැනදී කට වරද්ද ගන්න පුළුවන් කමක් නැහැ, පළාතේ ප්‍රධාන ඇමැතිවරයා හැටියට. ඉදිරි කාලය තුළදී යමක් කරන්න පුළුවන් අපට ඒ මන්ත්‍රීවරුන් වෙනුවෙන් අපි කටයුතු කරන්න ක්‍රියා කරන බව ප්‍රකාශ කරමින් අපේ ගරු මන්ත්‍රීතුමා තමන් ආපු තැන වෙනුවෙන්, තමන් ආපු තැන ඉන්න සහෝදර මන්ත්‍රීවරුන් වෙනුවෙන් ගත්ත මේ යෝජනාව පිළිබඳව මගේ ගෞරවය හා ප්‍රශංසාව පුද කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 01.53]

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ස්තුතියි. විශේෂයෙන් මම මේ අපේ ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරපු ආකාරයට මම මේ යෝජනාව ගෙනාවේ ගිය අවුරුද්දේ ජූලි මාසයේ. එතකොට මේ යෝජනාව ගෙනැල්ලා. අවුරුද්දකට වඩා වැඩි කාලයක් වෙනවා. ඒ යෝජනාව ගේන කොට ඒ යෝජනාව ගෙන එන කාලයේ තිබුණු වට පිටාවත් එක්ක තමයි මේ යෝජනාව නිර්මාණය කරගෙන තිබෙන්නේ. නමුත් හිතනවා නම් මේ දෙයින් සෑහීමකට පත් වෙනවා කියලා මම නම් හිතන්නේ නැහැ. කිසිම ආකාරයකින් සෑහීමකට පත් වෙන්න පුළුවන් කියලා මම හිතන්නේ නැහැ. මම ඉතාමත් කනගාටුවට පත් වෙනවා. ලලිත් එල්ලාවල අපේ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා පළාත් පාලන ආයතනයක් නියෝජනය කරමින් ආවේ නැති විධියට තමයි සාකච්ඡා කළේ. මේ යෝජනාව මට සාර්ථක කර ගැනීම සඳහා මට පිටුවහලක් වන විධියට නොවෙයි, ඔබතුමා කටයුතු කළේ. මම හිතන විධියට නම් බොහෝ දුරට උත්සාහ කළේ මහින්ද රාජපක්ෂ නමැති හිටපු ජනාධිපතිතුමාගේ කාර්ය භාරය තුළින් විශාල සේවාවක් වුණා. ඒ නිසා එතුමාට ක්‍රෙඩිට් එක දිය යුතුයි කියන පරමාර්ථය තමයි ඔබතුමාගේ තිබුණේ. ඉන් එහා ඔබතුමාට තිබුණේ නැහැ. පළාත් පාලන ආයතනයක් නියෝජනය කරමින් ඇවිල්ලා ඒ අයට යම් ආකාරයක කටයුත්තක් විය යුතුයි කියන පරම චේතනාවෙන් නොවෙයි, ඔබතුමා කථා කළේ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඒක යට තිබුණා.

**ගරු රොඩ්නි රුඩොල්ෆ් ප්‍රේසර්**
**Hon. Rodney Rudolph Fraser**

ඒ යට තිබුණු අදහස වුණේ සහ මූලික අදහස වී තිබුණේ මහින්ද රාජපක්ෂ කියන එක ඉදිරි අනාගතයේදී මේ එන පළාත් පාලන ආයතන තුළ කිසියම් ආකාරයක, ඒක රාශි වෙලා කරන කටයුත්තකදී අපි වැඩ කරනවා. මෙහෙම, මෙහෙමයි කියලා ඒක ගෙන ඒම තමයි මූලික කාර්ය භාරය වුණේ. කෙසේ වෙතත් මම ඉතාමත් සතුටට පත් වෙනවා. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ පාලන කාලය තුළදී ඊට පෙර මම ඔබතුමා දන්නා ආකාරයට, ඔබතුමාත් හොරණ ආයතනක ප්‍රධානියෙක්. මම මන්ත්‍රීවරයෙක් හැටියට ඉන්න කොට මට හම්බ වුණේ රුපියල් 3000/- ක දීමනාවක්. ඊට පසු කාලීනව ඒක රුපියල් 5000/- ක් බවට පත් වුණා. දැන් මෑත කාලීනව ඒක වැඩි වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි විපක්ෂය නියෝජනය කරපු මන්ත්‍රීවරු හැටියට, මෙම ස්ථානයේ ඉන්නවා හිටපු අපේ ඇමැතිතුමා, උපාලි කොඩිකාර මැතිතුමා. මම දැක්කා, එතුමාගේ බිරිඳත් ගැලරියේ ඉඳගෙන ඉන්නවා. අපේ මහරගම නගර සභාවේ හිටපු සභාපතිතුමිය. මම වසර 12 ක කාලයක් විපක්ෂ නායකවරයා හැටියට කටයුතු කළා. මට නම් මේ විපක්ෂ නායකවරයා හැටියට කටයුතු කරපු කාලය තුළ දී කිසිම ආකාරයක, අබමල් රේණුවක වැඩක් කරන්න ශත පහක මුදලක් ලැබුණේ නැහැ. එතකොට පාලක පක්ෂයේ මන්ත්‍රීවරුන්ට පමණයි එදා ඔබතුමන්ලාගේ ලැබෙන සියලු වරප්‍රසාද, වරදාන මේ හැම දෙයක්ම ලැබුණේ. ගම නැඟුම ලැබුණේ ඒ අයට. දිවි නැඟුම ලැබුණේ අයට. ලයිට් එක දාන්න පුළුවන් වුණේ ඒ ගොල්ලන්ට. පාර හදන්න පුළුවන් වුණේ ඒ ගොල්ලන්ට. විපක්ෂයේ හිටපු මන්ත්‍රීවරුන්ට කිසිම ආකාරයක වැඩ කටයුත්තක් කරගන්න අවස්ථාවක් ලැබුණේ නැහැ. ඉතින් ඒ නිසා මම හිතන්නේ මේක වැරැදි පූර්වාදර්ශයක්. අපි ඇත්ත වශයෙන්ම වත්මන්, මේ සභාවට පත් වුණු අපේ ගරු මහ ඇමැතිතුමා පිළිබඳව ඉතාමත් සතුටට පත් වෙනවා. මොකද, හේතුව. එතුමා ආ සැනින්ම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිපාදන වැඩි කරලා අද රුපියල් හතළිස් හත් ලක්ෂයක් දක්වා වැඩි කරලා තවත් ලක්ෂ තුනක වැඩි ප්‍රමාණයක් වැඩි කරන්න උත්සාහ කරලා තිබෙනවා. ඒක තමයි සමවාදී, ඒක තමයි යහපාලනයේ, යහපාලන ලක්ෂණ කියලා කියන්නේ. (බාධා කිරීමක්) ඒ තුනත් දෙනවා කියලා කිව්වා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මීට වඩා විශාල වැඩ කොටසක් කරන්න පුළුවන්.

මට මතකයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නිදහස් අධ්‍යාපනය හඳුන්වා දුන්නු සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමාගේ බිරිඳ එක දවසක් පාර්ලිමේන්තුවේ ලොබියේ ඉඳගෙන ඉන්න කොට හිටපු කථා නායක රත්නායක මහත්මයා ඇවිල්ලා අහනවාලු ඔබතුමිය ඇයි ඔය ලොබියේ වාඩි වෙලා ඉන්නේ කියලා. ඇහුවාම කිව්වාලු, ඒ ලොබියේ වාඩි වෙලා ඉන්නේ සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමාගේ බිරිඳ කිව්වාලු මම මේ ඉඳගෙන ඉන්නේ මගේ ස්වාමි පුරුෂයාට බෙහෙත් ගන්න සල්ලි නැහැ. ඒ නිසා මට පුළුවන් නම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියට පාර්ලිමේන්තුව හරහා යම්කිසි මුදල් ප්‍රමාණයක් ලබා දෙන්න. මගේ මහත්මයාට බෙහෙත් ලබා දෙන්නය කියලා. ඉතින් අපි අර මීට පෙර ජානක සූරියබණ්ඩාර ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරපු ආකාරයට අපි සියල්ලම වියපත් වෙනවා. විශේෂයෙන්ම අපට වඩා - අපි මොනවා කිව්වත්, අපට ලැබෙන දීමනාව රුපියල් 27,000 ක් වෙන්න පුළුවන්. ඒ වැටුපට අමතරව අපට තවත් රුපියල් අනූ දාහකට ආසන්න ප්‍රමාණයක්. ඔය කොච්චර කිව්වත්. ඒ ආසන්නයේ කැරකෙනවා. ඒ වාගේම අපට තව වරප්‍රසාද කිහිපයක් ලැබෙනවා. අපට ලේකම්වරයෙක් ලැබෙනවා. ඒ වාගේම ලිපිකරුවෙක් ලැබෙනවා. සහයකයෙක් ලැබෙනවා. නගර සභා සහ පළාත් පාලන ආයතනවල වැඩ කරන මන්ත්‍රීවරුන්ට මේ කිසි දෙයක් නැහැ. ඒ නිසා ඒ අයට යම් ආකාරයක කාර්යභාරයක් විය යුතුයි. වැටුප් වැඩි කිරීමක් ගරු මහ ඇමැතිතුමාට කරන්න බැහැ. නමුත් මහ ඇමැතිතුමාට යම් ආකාරයක දේවල් කරන්න පුළුවන්. පළාත් පාලන ආයතනවලට කියන්න පුළුවන් හැම මන්ත්‍රීවරයෙකුට, අර මෙතුමා ප්‍රකාශ කරපු ආකාරයට සියල්ලටම යම් මුදල් ප්‍රමාණයක් බෙදී යනවා නම් ඒ හැම මන්ත්‍රීවරයෙකුටම මෙපමණ මුදල් ප්‍රමාණයක් බෙදෙන්න ඕනෑ කියලා. ඒ වාගේම තමයි මුද්දර ගාස්තු, ඒ වාගේම තමයි දඩ මුදල් නිසියාකාරව ඒවා පළාත් පාලන ආයතනවලට ලබා දීලා වැඩ කටයුතු කරගෙන යන්න අවස්ථාව ලබා දෙන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ හුඟක් අවස්ථාවලදී පාලක පක්ෂය - මම නම් සභාපතිවරයා. නගර සභාවේ පළාත් පාලන ආයතනයේ මට මගේ නිෂේධ බලය පාවිච්චි කරලා, මට ඕනෑ කරන විධියට තමයි වැඩ කරන්නේ. අර ඉස්සර ගම්පහට වැඩිපුර සිද්ධ වුණා වාගේ වැඩ කටයුත්තක් දැන් ඒ නගර සභාවේ සභාපතිවරයා නම් සභාපතිවරයාගේ

තිබෙන වටේ තමයි වැඩ කරන්නේ. ඒ නිසා මම හිතන්නේ නැහැ ගරු නියෝජ්‍ය සභාතිතුමනි, මේ පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන් කොයිතරම් නම්, මෙතුමා ප්‍රකාශ කරපු ආකාරයට ඉතාමත් දුක්ඛිත තත්ත්වයේ ඉන්නේ. අපේ අනුරාධ විමලරත්න ගරු මන්ත්‍රීතුමා කියපු ආකාරයට මගෙත් එක්ක එකට හිටපු අය රුපියල් තුන් දාහ අරගෙන, ඒ දීමනාව ලබා ගත්තාට පස්සේ ඊළඟට ඉන්න මන්ත්‍රීතුමා කියනවා, කෝ දෙන්න මගේ තුන්දාහ. ඇයි? ගිය මාසේ ඉල්ලා ගත්ත, පඩිය ගත්තාම දෙන්නම් කියපු තුන්දාහ ඉල්ලා ගන්නවා. එහෙම දුක්ඛිත තත්ත්වයක ඉන්නේ. මට හිතා ගන්න බැහැ, ඩෝල්ටන් ජානක ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ ආකාරයට, මේවා මොකටද කියලා අහනවා. ගරු තනතුරක්ලු මේක. ගරු තනතුරක් කියලා ඔබතුමාම ඊට පස්සේ කියනවා, ඇයි ඔබතුමන්ලා අනික් අය ගැන කථා කරන්නේ. අපි ගැන කථා කරන්න කෝ? ඔබතුමා දැන් මේ මෑත යුගයේදී ආපහු ඇවිල්ලා, ඊට පස්සේ ඉදන් කියනවා ඇයි අපි ගැන කථා කරන්න කෝ? අපිත් වියපත් වෙනවා නේ? මම කියන්නෙත් ඒක තමයි. ඒක තමයි වෙන්න ඕනෑ. අපි සියල්ලම එකතු වෙලා මොනවා හරි කාර්යභාරයක් කරන්න ඕනෑ. මේ ප්‍රාථමික මට්ටමේ ඉන්න මන්ත්‍රීවරුන්ගේ ඉදිරි ගමන අරගෙන යන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවසාන වශයෙන් මේ ඡන්ද ක්‍රමය යටතේ නම් මම හිතන්නේ නැහැ සාර්ථකයි කියලා. මේ ඡන්ද ක්‍රමය යටතේ නැවතත් ඇති කරන්නේ, ගමට සල්ලි තිබෙන පුද්ගලයා පොඩි කොටසක් තුළ සල්ලි තිබෙන පුද්ගලයා සතියක් පුරා පාටි දෙනවා. දැන් මම අපේ ගම්වල බෙදන්න පටන් අරන්. දැන් උදළු බෙදනවා. කැති බෙදනවා. ඉස්සර මම ලක්ෂ 20 යි වියදම් කළේ. දැන් මම ලක්ෂ 20 වියදම් කරනවා පුංචි කොටසට. මුළු කොට්ඨාශයම අර ගත්තා. මම හිතන්නේ, මේ ක්‍රමය සාර්ථක ඇති. නමුත් මේකේ යම් යම් අසාර්ථක දේවලුත් තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා අද මේ මගේ යෝජනාව සඳහා සහයෝගය දක්වපු, ඒ වාගේම මේ දේ විය යුතුයි කියන අදහසින් කථා කරපු සියලු දෙනාටම මගේ ස්තූතිය ප්‍රකාශ කරනවා. බොහොම ස්තූතියි.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මෙතුමා මගේ නම කියලාම කිව්වා, මම මේකට -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, දැන් පිළිතුරු කථාවත් කරලා අවසානයි.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මගේ වරප්‍රසාද ප්‍රශ්නයක්. මම මේකට විරුද්ධ වුණා. මන්ත්‍රීවරුන්ට. ඒක වැරදි කථාවක්.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

නැහැ. විරුද්ධ වීම නොවෙයි.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මම කිව්වේ ඒක නොවෙයි. වැඩි කරන එක හොඳයි. පුළුවන් නම් මම දැනුත් කියනවා, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවට තව අවුරුදු දෙකක් අපි කාලය දීලා තිබෙනවා. ඒ දෙක තුළ රුපියල් පන්දාහක් පළාත් පාලන ආයතන මන්ත්‍රීවරයෙකුගේ පඩිය වැඩි කළොත් මමත් මන්ත්‍රීකමෙන් ඉල්ලා අස් වෙනවා. අනික් එක තමයි තවත් වරප්‍රසාද ප්‍රශ්නයක් මතු වුණා. රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා පළාත් සභා මන්ත්‍රීවරයෙකුට අනූ දාහක වැටුපක්. එතුමාට ලැබෙනවා ඇති. ඒ ලැබෙන්නේ ටෙලිෆෝන් බිල්, අරවා මේවා ඔක්කොම පඩියට ලැබෙනවා ඇති. අපි ඒවා පඩියට ගන්නේ නැහැ. අපේ ටෙලිෆෝන් බිල පළාත් සභාවෙන්මයි ගෙවන්නේ. ඒ වාගේම රියදුරාගේ දීමනාව රියදුරාට දෙනවා. අපි දහ අටදහස් පන්සියයම රියදුරාට දෙනවා. රුපියල් දහ දාහක් දීලා පන්දාහක් අපි තියා ගන්නේ නැහැ. ඉන්ධන දීමනාව අපට ඊටත් වඩා යනවා. ඒ නිසා වැරදි අර්ථ කථනයක් යනවා මේවා මාධ්‍යවලට ගියොත් එහෙම.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු මන්ත්‍රීතුමා, ඔය කිසි දෙයක් ලැබෙන්නේ නැහැ පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන්ට. ඔබතුමා අද මෙතැනට ඇවිල්ලා. කෑ ගහන්නේ පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට ඔබතුමා කථා කරන්නේ නැහැ, පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරයෙක් හැටියට - ඔබතුමාට බිම අමතක වෙලා. අද ඔබතුමා පළාත් සභාව ගැන කථා කරන්නේ. ඔබතුමා පාර්ලිමේන්තු යන්න.

[ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්]

ඔබතුමා කථා කරන්න පළාත් පාලන ආයතන පිළිබඳව. ඔහොම කථා කරන්න එපා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

සියලුම මන්ත්‍රීවරුන්ට කරන අවමානයක්. මොකද, මෙතුමා ඒ රුපියල් අනූ දාහම ගන්නවා ඇති. අනික් මන්ත්‍රීවරු එහෙම කරන්නේ නැහැ. ඒක මාධ්‍යවල ගියොත් හොඳ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර නිශ්ශබ්ද වෙන්න. රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවට එකඟතාවය විමසීමේ අවස්ථාව. ඒ යෝජනාව බොහොම හොඳයි. කාලෝචිත යෝජනාවක් වශයෙන් දෙපාර්ශවයේම අය බොහොම වාද විවාද ගියා. ඒ පිළිබඳව බොහොම ස්තූතිවන්ත වෙනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

## කල් තැබීම
## ADJOURNMENT

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 02. 02 ට, 2015 නොවැම්බර් මස 03 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***
*Accordingly, the Provincial Council was adjourned at 02.02 p.m till 09.30 a.m, on 03.11.2015.*